# අපි ජනතාව සමග කථා කරමු



## ලංකාවේ ජනතාවගේ අත්දැකීම් තුළින් කොවිඩ් -19 දකිමු

LAW & SOCIETY TRUST

# ප්‍රජාතන්ත්‍රවාදී සංවාදය, සක්‍රීය සවන්දීම සහ අන්තකර්ණය වූ පුරවැසි සහභාගීත්වය: වසංගත සහ සමාජ අර්බුද කාලවල දී අන්තර්කණය වූ පුරවැසි සහභාගීත්වය සඳහා අවකාශ නිර්මාණය කිරීම

ශ්‍රී ලංකාව මුහුණ දී සිටින වසංගතය සහ සමාජ-ආර්ථික අර්බුදය තුළ අන්තර්කරණය වූ පුරවැසි සහභාගීත්වය සඳහා අවකාශ නිර්මාණය කිරීම සහ ප්‍රජාතන්ත්‍රවාදී ආයතන, නීතියේ ආධිපත්‍යය සහ මහජන වගවීම ශක්තිමත් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. අර්බුදයට රජය දක්වන ප්‍රතිචාර ව්‍යවස්ථානුකූල භාවයේ මූලධර්මවලට අනුකූල වන බව සහ මතභේදාත්මක පාලනය සීමා කෙරෙන බව, වැරදි තොරතුරු සහ වෛරය පැතිරවීම වළක්වන බව, සහ සමාජ පරිවර්තකයින්ගේ සහ බලපෑම්කරුවන්ගේ ධනාත්මක මැදිහත්වීම තුළින් සමාජ සහයෝගීතාවය ශක්තිමත් කෙරෙන බව සහතික කිරීමට සක්‍රීය පුරවැසියන් වශයෙන් අපි අරමුණු කරන්නෙමු.

මෙම අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස මෙම ව්‍යාපෘතිය මගින් සෞඛ්‍ය හා ආර්ථික අභියෝගවලට රජය දක්වන කඩිනම් ප්‍රතිචාර විශ්ලේෂණය කරන, ප්‍රතිපත්ති ගැටළු පිළිබඳ පොදු සාකච්ඡාවක් ප්‍රවර්ධනය කරන, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් ලේඛනගත කරන, සහ ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම්, ව්‍යවස්ථානුගත මූලධර්ම සහ මූලික අයිතිවාසිකම් කෙරෙහි බලපාන, ඉස්මතු වෙමින් පවතින ගැටලු පිළිබඳව පුරවැසියන්ට කාලීන, කරුණු පදනම් කරගත් තොරතුරු සපයා දෙන අවිධිමත් "පුරවැසි මුරකාවලක්" ස්ථාපිත කර ඇත. එමෙන්ම, ප්‍රජාතන්ත්‍රවාදය සහ නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීම සඳහා උපදේශන ව්‍යාපාර පැවැත්වීමට මෙන්ම පශ්චාත් වසංගත සන්දර්භය තුළ පුරවැසියන්ට තමන්ගේ අවශ්‍යතා, කනස්සලු සහ අභිලාෂයන් ප්‍රකාශ කිරීමට හැකි කරවන අවශ්‍යතා තක්සේරුවක් සිදු කිරීමට ද මෙම ව්‍යාපෘතිය මගින් අරමුණු කරයි.

මෙම වාර්තාව සහ එහි අඩංගු පින්තූර - අන්‍යාකාරයකින් මූලාශ්‍රය සඳහන් කර නොමැති නම් - සකුණ එම්. ගමගේ විසින් මෙම ව්‍යාපෘතිය සඳහා ලබා දෙනු ලබන දායකත්වයක් ලෙස සපයා දී ඇත. නීතිය සහ සමාජ භාරය (LST) මෙම ව්‍යාපෘතියට පුරවැසියන්ගේ සම්බන්ධවීම, එනම් තමන්ගේ හඬ අන් අයට ඇසීමට සැලැස්වීමට අවශ්‍ය පුරවැසියන්ගේ සම්බන්ධ වීම අගය කරයි. මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් අවශ්‍යයෙන් ම නීතිය හා සමාජ භාරයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ කළමනාකාරිත්වයේ අදහස් පිළිබිඹු නොකරයි.

# අපි ජනතාව සමඟ කථා කරමුඃ ශ්‍රී ලංකාවේ ජනතාවගේ අත්දැකීම් තුළින් කොවිඩ්-19 දකිමු



*2020 වර්ෂයේ පළමු වැනි අගුළු දැමීමෙන් පසුව දෙහිවල මුහුදු වෙරළේ සිට කොළඹ වරාය නගරය දිස්වන අයුරු, ඡායාරූපයඃ සකුණ ගමගේ*

## හැඳින්වීම

2019 වර්ෂය අවසානයේ සිට ලෝකය කොවිඩ්-19 වසංගතයේ රැළි ගණනාවකට මුහුණ දී සිටියි. මෙම මහජන සෞඛ්‍ය අර්බුදයට ප්‍රතිචාර දැක්වීම සඳහා එන්නත්කරණය ආරම්භ කර ඇතත්, තවදුරටත් අභියෝග ඇති කරමින් වෛරසයේ නව ප්‍රභේද බිහිවී තිබේ. මෙම වෙනස් වෙමින් පවතින නව තත්වයන් ලෝකයේ සෑම රටකටම මෙන්ම එහි සමාජයේ විවිධ ස්ථරවල සිටින සෑම පුද්ගලයෙකුටම ඇති කර තිබෙන බලපෑම් විවිධ වේ.

කෝවිඩ් වයිරසය සම්ප්‍රේෂණය වීමේ රටාව සහ පසුගිය වසර දෙක තුළ ක්‍රියාත්මක කරන ලද සමාජ දුරස්ථභාවය, සංචරණ සීමා සහ අගුළු දැමීම් ඇඳිරි නීතිය වැනි හදිසි වැළැක්වීමේ ප්‍රයත්න විවිධ ආකාරවලින් මිනිසුන්ගේ ජීවන රටාවන්හි දැඩි වෙනසක් ඇතිවීමට හේතු වී තිබේ. ආසාදනය වීම් හා ජීවිත හානි සිදු වීම් මගින් සෘජු සෞඛ්‍ය බලපෑම් එල්ල වීම සහ ජීවනෝපායන් කෙරෙහි වක්‍ර බලපෑම් එල්ල වී තිබීම මෙන්ම, අධ්‍යාපනය, පරිසරය, රාජ්‍ය පාලනය, ජනතාවගේ අයිතිවාසිකම් සහ එදිනෙදා ජීවිතයේ අනෙකුත් අත්‍යාවශ්‍ය අංශ ද දීර්ඝ කාලීන ප්‍රතිවිපාක සහිතව බලපෑමට ලක් වී ඇත.

## පසුබිම

චීනයේ හුබෙයි පළාතෙන් පැමිණ සිටි 44 හැවිරිදි චීන කාන්තාවක් ජාතික බෝවන රෝග විද්‍යායතනයට ඇතුළත් කිරීමෙන් පසු කොවිඩ් වෛරසය ආසාදිත වී ඇති බවට තහවුරු වූ ශ්‍රී ලංකාවේ පළමු වැනි රෝගියා 2020 ජනවාරි 27 වන දින වාර්තා විය. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් කොවිඩ්-19 වසංගතයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව, වසංගතයේ බලපෑම වැළැක්වීමේ පියවරක් ලෙස ශ්‍රී ලංකා රජය ප්‍රථම වරට 2020 මාර්තු මස අග දී දිවයින පුරා ඇඳිරි නීතිය ප්‍රකාශයට පත් කළේය. එම ඇඳිරි නීතිය දින 52 ක් පැවතුණේය. ඉන් අනතුරුව, රෝගීන් සංඛ්‍යාවේ යම් අඩුවීමක් සිදු වීම හේතුවෙන්, ගෝලීය වසංගත රටා සහ ඇතිවිය හැකි නව රැළි පිළිබඳව සෞඛ්‍ය නිලධාරීන් නිකුත් කළ පූර්ව අනතුරු ඇඟවීම් සැලකිල්ලට නොගෙන, 2020 අගෝස්තු මාසයේ දී මහ මැතිවරණය පැවැත්වීමේ අරමුණ ඇතිව රජය එතෙක් පනවා තිබූ සීමා වලින් බොහෝමයක් ලිහිල් කළේ ය.

මිනුවන්ගොඩ සහ දිවුලපිටිය ප්‍රදේශවල ඇඟළුම් නිෂ්පාදන කර්මාන්තශාලා සේවකයින් පොකුරකින් ආරම්භ වූ කොවිඩ් දෙවැනි රැල්ලත් සමග රජය ඔක්තෝබර් මාසයේ මුල් සතියේ දී වසංගතය පැතිරීම වැළැක්වීමේ දරුණු ක්‍රම කිහිපයක් යළි ක්‍රියාත්මක කළේය.



*පළමු වැනි අගුළු දැමීම අවසන් වීමෙන් දින කිහිපයකට පසුව 2020 වර්ෂයේ දී ගාලු මුවදොර වෙරළ දිස් වූ අයුරු - ඡායාරූපය - සකුණ ගමගේ*

2021 වර්ෂය ආරම්භයේ සිටම, අනෙකුත් බොහෝ රටවල් මෙන් ම ශ්‍රී ලංකාව ද එන්නත්කරණ වැඩසටහන දියත් කිරීම කෙරෙහි අවධානය යොමු කිරීමට පටන් ගත්තේය. එන්නත්කරණ වැඩසටහනෙහි පළමු වන අදියරේදී එය මන්දගාමී, දුර්වල ලෙස කළමනාකරණය කරන ලද ක්‍රියාවලියක් බව පැහැදිලිව පෙනෙන්නට තිබූ අතර, අවසානයේ එන්නතේ දෙවැනි මාත්‍රාව සහ වර්ධක (බූස්ටර්) මාත්‍රාව ලබා දීමේදී එය වැඩිදියුණු විය. නිල දත්ත වලට අනුව, 2021 වර්ෂය අවසානය වන විට, ශ්‍රී ලංකාව මිලියන 21 ක් වූ ස්වකීය ජනගනයෙන් 63% ක් කොරෝනා වෛරසයට එරෙහිව සම්පූර්ණයෙන් ම එන්නත්කරණය කර, තුන් වන මාත්‍රාවක් ලෙස 18.4% ක ප්‍රමාණයකට ෆයිසර් එන්නත ලබා දී තිබුණු අතර, දෛනික මරණ සංඛ්‍යාව 20 ක් පමණ විය.

ශ්‍රී ලංකාවේ කෝවිඩ්-19 වසංගතයේ දෙවන රැල්ල ආරම්භ වීමට පෙර, විශේෂයෙන්ම රටේ සමීප අසල්වැසියන් වන ඉන්දියාව සහ නේපාලය තුළ දරුණු ලෙස වසංගතයේ දෙවන රැල්ල පැතිරීම කෙරෙහි අවධානය යොමු කරවමින් සෞඛ්‍ය නිලධාරීන් අනතුරු ඇඟවීම් නිකුත් කර තිබුණි. මෙම අතිශය ගැටළුකාරී වාතාවරණය මුළුල්ලෙහි ශ්‍රී ලංකාව සිය කෝවිඩ් පැතිරීම වැළැක්වීමේ යාන්ත්‍රණ ලිහිල් කිරීමට උත්සුක විය. සංචාරකයින් සඳහා ජෛව බුබුළු තුළින් රට නැවත විවෘත කිරීම මෙන්ම සිංහල සහ දෙමළ අලුත් අවුරුදු සමය සහ ශ්‍රී පාද සමය සඳහා සීමා ලිහිල් කිරීම වැනි පියවර ගැනීම හරහා මෙය සිදු විය. එහි ප්‍රතිඵලයක් ලෙස, 2021 මැයි මස මැද භාගයේ සිට සතිපතා සියයට 50% ට වැඩි ඉහළ යාමක් සහිතව කෝවිඩ්-19 ආසාදිත රෝගීන් සංඛ්‍යාවේ පෙර නොවූ විරූ වැඩිවීමකට මුහුණ දීමට රටට සිදු විය.

ආසාදිතයින් අනුපාතය සීඝ්‍රයෙන් ඉහළ යමින් පවතින තත්වයක් තුළ සෞඛ්‍ය පද්ධතිය කඩාවැටෙමින් පවතින බව රාජ්‍ය නිලධාරීන්, මාධ්‍ය වාර්තා සහ බිම් මට්ටමේ වාර්තා පෙන්වා දුන්නේය. මෙම තත්වය මෙන්ම අරමුදල් සැපයීම ප්‍රමාණවත් නොවීම සහ අකාර්යක්ෂම කළමනාකරණය හේතුවෙන් ඇති වූ තවත් ගැටළු රැසක් නිසා සෞඛ්‍ය ක්ෂේත්‍රය සහ සෞඛ්‍ය සේවකයින් දැඩි පීඩනයකට ලක් වූහ.



*පළමු වැනි අගුළු දැමීම අවසන් වීමෙන් දින කිහිපයකට පසුව 2020 වර්ෂයේ දී ගාලු මුවදොර වෙරළ දිස් වූ අයුරු - ඡායාරූපය - සකුණ ගමගේ*

2021 ජූනි මාසයේ දී, ශ්‍රී ලංකාව සමාජය තුළ කෝවිඩ්-19 වෛරසයේ ඩෙල්ටා ප්‍රභේදය පැතිර ඇති බව තහවුරු වන පළමු රෝගියා සොයා ගත්තේය. මෙරට ඩෙල්ටා වෛරසය පැතිරීම උච්චතම තත්වයට පත්ව තිබූ 2021 අගෝස්තු සිට සැප්තැම්බර් දක්වා වූ කාලය තුළ, සෑම පැයකට ම තරුණ වැඩිහිටියන් සහ ළමයින් ද ඇතුළුව රෝගීන් තිදෙනෙකු පමණ මිය ගියේය. මාස පහක පමණ කාලයක් පුරා පැවති අර්ධ අගුළු දැමීමකට ආසන්න සීමා කිරීම් හරහා තුන්වන රැල්ල පාලනය කිරීමට රජය උත්සාහ කළේය. ඉදිරිපෙළ සේවකයින්ට දෛනිකව සිදු වන මරණ සම්බන්ධ කටයුතුවල බර දැරීමට මෙන්ම නිවසේ සිටින තම ආදරණීයයන්ට වෛරසය ආසාදනයවීම් පිළිබඳව ද අසන්නට සිදු විය. මරණය යන්න ශ්‍රී ලංකාවේ සෑම ප්‍රදේශයක් පුරාම පැතිර පවතින්නක් බවට පත් විය. මෙයට පෙර එක් එක් කෝවිඩ්-19 වින්දිතයාගේ අනන්‍යතාවය සහ ඔවුන් ගත කළ ජීවිත පිළිබඳ පුළුල් තොරතුරු මාධ්‍ය මගින් ප්‍රකාශයට පත් කරනු ලැබුව ද, ඩෙල්ටා ප්‍රභේදය පැතිරීමේ උච්චතම අවස්ථාවේ සිදු වූ මරණ ප්‍රවාහය මධ්‍යයෙහි එම තොරතුරු අතුරුදහන් වී ගියේයය. බොහෝ මිනිසුන් මිය ගිය අතර, ඔවුන්ගේ මරණය පිළිබඳ ශෝක වීමට හෝ ඔවුන්ගේ ජීවිත වලට ලැබිය යුතු අගය කිරීම ලබා දීමට ද නොහැකි විය. සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ දත්ත වලට අනුව, 2021 වර්ෂය අවසානය වන විට වාර්තා වී තිබූ මුළු රෝගීන් සංඛ්‍යාව 586,746 ක් සහ මරණ සංඛ්‍යාව 14,962 ක් විය.



*ගල්කිස්ස ප්‍රදේශයේ වීදිවල ආහාර අලෙවිකරන ජංගම වෙළෙන්දෙක්; ඡායාරූපය: සකුණ ගමගේ*

කොවිඩ්-19 වසංගතය වෛද්‍යමය හදිසි තත්වයකට මෙන්ම සැලකිය යුතු ආර්ථික අවහිරතාවයකට ද හේතු වී ඇති නමුත්, ශ්‍රී ලංකාවේ දැනට පවතින ආර්ථික අර්බුදය වසංගතයට වඩා බෙහෙවින් පුළුල් සහ වඩා දීර්ඝ කාලීන ක්‍රියාවලියක් තුළින් බිහි වූවක් වන අතර, එය සමාජයේ ඇතැම් ස්ථරවලට ඍජු හා වක්‍ර බලපෑම් එල්ල කර තිබේ.

එබැවින්, විවිධ වූ පසුබිම් වලට අදාළව මිනිසුන්ගේ ජීවිත වලට වසංගතය බලපා ඇති ආකාරය ගැඹුරින් විමසා බැලීම සඳහා මෙම දුරස්ථ / දුරකථන සම්මුඛ සාකච්ඡා පවත්වන ලදී. රාජ්‍ය පාලනය දිශානත කරගත් බහුවිධ ප්‍රතිපත්තිමය වෙනස්කම්වල බලපෑම සහ ජනතාව සඳහා ඒවා කඩිනමින් ක්‍රියාත්මක කිරීමෙහි ඇති ඵලදායිත්වය නිරීක්ෂණය කිරීම මෙහි තවත් ප්‍රධාන අරමුණක් විය.

## කාලරාමුව සහ ක්‍රමවේදය



*දෙහිවල මුහුදු වෙරළේ මාළු වෙළෙන්දෙක්*

කෝවිඩ්-19 වසංගතයේ තුන්වන රැල්ලෙහි සීඝ්‍ර වර්ධනයෙන් පසුව සහ සංචරණ සීමා සහ අගුළු දැමීම් තවදුරටත් අඛණ්ඩව පැවති කාලය වූ 2021 මැයි මාසයේ සිට ඔක්තෝබර් මාසය දක්වා වූ කාලය තුළ මෙම සම්මුඛ සාකච්ඡා සිදු කරන ලදී. සංචරණය සීමා කර තිබූ නිසාත්, සම්මුඛ සාකච්ඡාවලට භාජනයවූවන් පෞද්ගලිකව හමුවීමට හැකියාවක් නොතිබූ නිසාත් දුරකථන ඇමතුම් හරහා සම්මුඛ සාකච්ඡා සිදු කරන ලදී.

සම්මුඛ සාකච්ඡාවන්ට ජනතාව තෝරා ගැනීම සඳහා භාවිතා කරන ලද නිර්ණායක වලින් පුද්ගලයාගේ වයස, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, ආගම, දිස්ත්‍රික්කය හෝ භූගෝලීය ප්‍රදේශය, රැකියාව සහ ජීවනෝපාය හා සම්බන්ධ ගැටළු ඇතුළු විවිධ පසුබිම් ඉස්මතු කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. එම අවස්ථාව වන විට පැවති සමාජ, දේශපාලන සහ ආර්ථික ප්‍රශ්නවලට ඍජු සම්බන්ධතාවයක් තිබූ පුද්ගලයින් වන ගොවීන්, තරුණයින්, ගුරුවරුන්, ආන්තික කණ්ඩායම්, කාන්තාවන් සහ ළමයින් වැනි පුද්ගලයින් කෙරෙහි මෙහිදී වැඩි අවධානයක් යොමු කරන ලදී. බොහෝ සම්මුඛ සාකච්ඡා මගින් ඍජු හා වක්‍ර බලපෑම් විමසා බලමින් වසංගතය හා සම්බන්ධ බහුවිධ අංශ ආවරණය කරන ලදී.

ඒවා එකට එක්වූ විට, ශ්‍රී ලාංකිකයින්ගේ හඬ අඩංගු වන සහ වසංගතය ඔවුන්ගේ ජීවිතවලට බලපා ඇති ආකාරය ඉතාමත් ස්ථානික හා පෞද්ගලික ආකාරයෙන් පෙන්නුම් කරන, දිවයින පුරා විවිධ ප්‍රදේශ වලින් ලබාගත් අත්දැකීම් සමුදායක් නිරාවරණය වේ.

# ජනතාවගේ විත්ති

## පළමුවන සම්මුඛ සාකච්ඡාව

**නැගෙනහිර පළාතේ තෘතියික අධ්‍යාපන ආයතනයක කළමනාකරණ සහකාරවරයෙක් ලෙස සේවය කරන, පෘතුගීසි බර්ගර් ප්‍රජාවට අයත් 38 හැවිරිදි තරුණයෙකු සමඟ මෙම සම්මුඛ සාකච්ඡාව සිදු කරන ලදී. පසුගිය වසර කිහිපය පුරා ඔහු ශ්‍රී ලංකාවේ පෘතුගීසි බර්ගර් ප්‍රජාව අතර සුළුතර අයිතිවාසිකම් ක්‍රියාකාරීත්වයට සහ සංස්කෘතික සංගම්වලට සම්බන්ධව සිටි අයෙකි.**




*සංස්කෘතික ප්‍රසංගයක් අතරතුර පෘතුගීසි බර්ගර් ප්‍රජාවේ සාමාජිකයින්*

**වසංගතය පිළිබඳ ඔබගේ අත්දැකීම කුමක්ද සහ එය ඔබගේ ජීවන රටාවන් වෙනස් කර ඇත්තේ කෙසේද?**

අපට ඇතිවූ විශාලතම අභියෝගය වුනේ ගමන් බිමන් යාම සඳහා ඇති නිදහසට එල්ල වූ බලපෑමයි. අවුරුද්දකට වඩා වැඩි කාලයක් පුරා අපිට ගමන් බිමන් යන්න නොහැකි වී තිබෙනවා. මම රාජ්‍ය අංශයේ රැකියාවක් කරන්නෙ. මගේ ගෙදර තියෙන්නේ මඩකලපුවේ වාලච්චිනෙයි නිසා මම සතියේ දවස්වල ත්‍රිකුණාමලයේ නතරවෙලා ඉන්න පුරුදුවෙලා හිටියෙ. වසංගතයෙන් පස්සෙ මට දිනපතා ම නිවසේ සිට ගමන් කිරීමට සිදු වුණා. මෙම තත්වය මට ඇති අවදානම් සහ අපහසුතාවයන් වැඩි කර තිබෙනවා.

## ජීවනෝපාය

පෘතුගීසි බර්ගර් ප්‍රජාවේ සාමාජිකයින් ගෙන් බහුතරයක් වඩු කාර්මිකයින්, එහෙම නැත්නම් කාර්මික ශිල්පීන්. ඔවුන් ජීවත් වන්නේ ඔවුන් උපයන දෛනික වැටුපෙන්. සමහර අය සංචාරක ක්ෂේත්‍රයටත් සම්බන්ධ වෙලා ඉන්නවා. රාජ්‍ය අංශයේ සේවකයෝ ඉන්නෙ කිහිප දෙනෙක් පමණයි. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට තම ආදායම් මාර්ග සහ රැකියාවේ සුරක්ෂිතභාවය නැතිවී ගොස් තිබෙනවා. ආහාර ද්‍රව්‍ය සහ අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගැනීමේ දී ඔවුන්ට බොහෝ දුෂ්කරතා වලට මුහුණ දීමට සිදු වුණා.

අගුළු දමා තිබූ කාලය තුළ මහ වීදියේ වෙළඳ සැල් කිහිපයක් පමණක් විවෘත කර තිබූ නිසාත්, මහ වීදියේ පොලිසිය සහ හමුදාව යොදවා තිබූ නිසාත් අපිට අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම ඉතා අපහසු වුණා. අගුළු දමා තිබූ කාලය තුළ දී අපිට ආහාර මිලදී ගෙන ගබඩා කර තබා ගැනීමට අවශ්‍ය වුණත්, දෛනික වැටුප් ලබන අයට ප්‍රමාණවත් මුදලක් නොමැති වූ නිසා ඔවුන්ට බොහෝ දුෂ්කරතා වලට මුහුණ දීමට සිදු වුණා.

ගිය අවුරුද්දේ රාජ්‍ය නොවන සංවිධාන කිහිපයක් සහයෝගය ලබා දුන්නා. එම සහයෝගය සපයා දුන්නෙ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා. නමුත් අපි ජීවත්වෙන වාලච්චිනෙයි ප්‍රදේශයට ඒ ආධාර මොනවත් ලැබුණෙ නැහැ වගේ තමයි. අපි ඒ ප්‍රදේශයේ ඉන්න දෙමළ සහ මුස්ලිම් ප්‍රජාවගෙනුත් වෙන් වෙලා ඉන්නෙ. පවුල් කිහිපයක් විසිරී සිටිනවා: දෙමළ අය ඉන්න ප්‍රදේශයේ පවුල් පහකුත් මුස්ලිම් අය ඉන්න ප්‍රදේශවල තවත් පවුල් පහකුත් ජීවත් වෙනවා.

ඒ දවස්වල ප්‍රාදේශීය රාජ්‍ය නොවන සංවිධානයක් සහාය ලබා දුන්න; නමුත් ඒකෙ ප්‍රතිලාභ ලැබුණෙ පාර අයිනෙ ගෙවල්වල ජීවත් වෙන අයට විතරයි. ප්‍රධාන පාරෙන් ඈත, ඈතුළත ප්‍රදේශවල ජීවත් වුණු අයට මොනවත් ලැබුණෙ නැහැ. අපේ ප්‍රජාව තුළ වැන්දඹුවන් ඉන්නවා. ඔවුන්ට කිසිම සහයෝගයක් ලැබුණෙ නැහැ. අපේ ප්‍රජාවෙ අය එකිනෙකාට උදව් කරගත්තා, නමුත් අපි දුප්පත් නිසා අපිට එය දිගටම කරගෙන යන්න බැහැ.

## රජයෙන් ලැබුණු සහාය

අනෙකුත් ප්‍රජාවන්ට සාපේක්ෂව බැලූ විට අපගේ ප්‍රජාවට ලැබුණේ අඩු සහයෝගයක්. රජයේ සහාය යාන්ත්‍රණය ක්‍රියාත්මක කළේ ග්‍රාම සේවක හරහා, නමුත් ග්‍රාම නිලධාරීවරයා වාලච්චිනෙයි ප්‍රදේශයේ අපට ඒ පිළිබඳව නිතරම දැනුම් දෙන්නේ නැහැ. එම සහාය සපයාදීම් ගැන අපේ ප්‍රජාවට දැනගන්න ලැබුණේ ප්‍රදේශයේ තවත් කිහිප දෙනෙකුගෙන්. සමහර අවස්ථාවල අපේ ප්‍රජාවේ සමහර අය සහනාධාර සපයා දෙන තැනට ගිය විට ඒ වන විටත් සහනාධාර බෙදා අවසන් වී ඇති බවත්, නියමිත කාලය අවසන් වී ඇති බවත් ග්‍රාම නිලධාරීවරයා ඔවුන්ට දන්වා තිබුණා. අගුලු දැමීම නිසා පෘතුගීසි බර්ගර් ප්‍රජාවට නිවසෙන් පිටතට යාමට නොහැකි වූ නිසා ඔවුන්ට තොරතුරු ලැබුණේ නැහැ.

අපිට අපගේ ප්‍රජාව සඳහා ඇති එකම සාමූහික සංවිධානය වන පෘතුගීසි බර්ගර් සංගමය තිබෙනවා. 2020 වර්ෂයේ දී, අපේ රට වසංගතයේ බලපෑමට ලක්වී මාස හයකට පසු, සලාක මල්ලක් බැගින් බෙදා දෙන ලද නමුත් එය ලැබුණේ ඉතා සුළු පිරිසකට පමණයි. මඩකලපුවේ වැන්දඹුවන්ට රුපියල් 1,000 ක පැකේජයක් ලැබුණා. මම දන්නවා දේශපාලනඥයො සලාක ලබා දුනේනේ ප්‍රදේශයේ ඉන්න තමන්ගේ ආධාරකරුවන්ටයි.

නගර සභාවක හෝ ප්‍රාදේශීය සභාවක වත් අපට අපේ ප්‍රජාවගේ දේශපාලන නියෝජනයක් නැහැ. අපි ඉතා සුළු පිරිසක් නිසා අපිට කිසිවෙකු තෝරා පත්කර ගැනීමට හැකියාවක් නැහැ.

### ආසාදිතයින් අනුපාතය සහ මරණ සංඛ්‍යාව

මෙයට පෙර, අපේ ප්‍රජාවෙ එක් අයෙකුටවත් ආසාදනය වී තිබුණෙ නැහැ, ඒත් මෑතකදී අපේ ප්‍රජාවේ කිහිප දෙනෙක් ආසාදනය වෙලා තියෙනවා. අප්‍රේල් මාසයේ තුන් වන රැල්ල ආපු වෙලාවේ ත්‍රිකුණාමලයේ දී අපේ ප්‍රජාවේ තුන් දෙනෙක් මිය ගොස් තිබෙනවා. අගුලු දැමීම් ලිහිල් කලාට පස්සෙ දේශීය විදේශීය සංචාරකයින් විශාල පිරිසක් පැමිණ වෙරළ තීරය සංචාරකයින්ගෙන් පිරී ගියා. ඉන් පසුව ත්‍රිකුණාමලයෙ කොරෝනා වෛරසය පැතිරිලා මාසයකටත් වඩා වැඩි කාලයක් වසා දමා තිබුණා.

### සෞඛ්‍ය අංශයෙන් ලැබුණු සහාය

සති තුනකට පෙර මගේ සහෝදරියට වෛරසය ආසාදනය වුණ වෙලාවෙ ඔවුන් (සෞඛ්‍ය බලධාරීන්) ඇන්ටිජන් පරීක්ෂණය විතරයි කළේ. එහෙම වුනත්, ඔවුන් නිවසෙන් පිටත අනතුරු ඇඟවීමේ නිවේදනයක් ඇලෙව්වෙ වත් නැහැ; ඒවගෙම ඔවුන් අනෙක් සමීපතම පවුලේ සාමාජිකයින්ව පරීක්ෂා කර බැලුවෙත් නැහැ. නිරෝධායනයට ලක්කර සිටි අයට රජය සලාක මල්ලක් ලබා දුන්නා. ඒත් අපේ පවුලට ඒක ලැබුණෙ නැහැ. මෙම කාලය තුළ අපේ අසල්වැසියන් අපිට අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ගෙනත් දෙමින් උපකාර කළා, ඒත් අපේ අනිවාර්ය නිරෝධායන කාලය අවසන් වුණාට පස්සෙ, ඔවුන් අපට අවශ්‍ය දේවල් සඳහා වියදම් කළ මුදල ආපසු ගෙවන්න අපිට සිද්ධ වුණා.




*යාපනයේ පාසලක සෞඛ්‍ය උපදෙස් සහිත දැන්වීම*

### එන්නත්කරණය

බලධාරීන් වයස අවුරුදු 60 සහ එයට වැඩි පුද්ගලයින්ව එන්නත් කිරීමට පටන් ගත්තා. එම එන්නත් ලබා දුන්නේ සෞඛ්‍ය නිලධාරීන් මිස හමුදාවෙ අය නොවෙයි. අපේ ප්‍රදේශයේ ඔවුන් එන්නත ලබා දෙන්න පටන් ගත් විට ඔවුන් ඒ බව අපට දැනුම් දුන්නේ නැහැ. අපි එන්නත් ගැන දැනගත්තේ අනිත් අය එන්නත ගන්න යන විටයි. සමහර ප්‍රදේශවල ශබ්ද විකාශන යන්ත්‍ර භාවිත කර ජනතාව දැනුවත් කළා. මගේ අම්මයි තාත්තයි එන්නතේ පළමු මාත්‍රාව ගන්න ගිය වෙලාවෙ දවස් දෙකකට පස්සෙ ආයේ එන්න කියලා එයාලට කියලා තිබුණා. ඉතින් එයාල දවස් දෙකකට පස්සෙ ආයෙත් ගියා. එයාල පැය දෙකක් තිස්සෙ පෝලිමේ ඉඳල තිබුණා, ඒත් කලින් ආව අයට ඉස්සෙල්ලා පහුවෙලා ආව අයට එන්නත ලබා දීලා තිබුණා. මේ විදියෙ වෙනස්කම් කිරීම් සෑම තැනකම තියෙනවා.

වයස අවුරුදු 30 සහ එයට වැඩි පුද්ගලයින්ව එන්නත්කරණය කිරීම පටන් ගත්තට පස්සෙ මම එන්නත ලබා ගන්න ගියා. එන්නත් කිරීම සිදු කළේ අසල තියෙන, දෙමළ ජනතාව ඉන්න ප්‍රදේශයේ පාසලක. මම උදේ 9.00 ට විතර එතනට ගිහිල්ල සවස 2.30 වෙනකම් එතන හිටියා. ඊට පස්සෙ එයාල මට ෆෝම් එකක් දීලා, කාඩ් එකකුත් දුන්න; ඒත් එන්නත දුන්නේ නැහැ. හවස 3.00 ට විතර ඇවිත් කිව්වා එන්නත් ඉවරයි කියලා. එතන පිල්ලෙයාන් ඇතුළු රජයට සම්බන්ධ දේශපාලනඥයින් සිටියා; එයාල එම එන්නත මුලින් ම එයාලගේ ආධාරකරුවන්ට දෙන්න කියල එම ක්‍රියාවලියට බලපෑම් කළා. ඊළඟ දවසේ මම එන්නත ගන්න මුස්ලිම් අයගේ ප්‍රදේශයට ගියා. එතන ඉතාම හොඳින් සංවිධානය කරල තිබුණා. එතනදි එන්නත ගන්න මට ගතවුණේ පැය භාගයක් පමණයි. දැනට සති දෙකකට පෙර මට දෙවන මාත්‍රාවත් ලබා ගන්න පුළුවන් වුණා. නගරයෙන් බැහැර බොහොමයක් ප්‍රදේශවල එන්නත ලබා දීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ ග්‍රාම නිලධාරීවරයාගේ මූලිකත්වයෙන් නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක වෙනවා. ඒත් අනෙක් ප්‍රදේශවල වගේ මෙහෙ ඒක ක්‍රියාත්මක වූණේ නැහැ.

ප්‍රමුඛත්වය ලබා දෙන්නේ වයස අවුරුදු 60 ට වැඩි අයට සහ ඉදිරිපෙළ සේවකයින්ට කියල එයාල කිව්වට දේශපාලකයින්ගේ අනුබලය සහ බලපෑම මත එයට වඩා වයස අඩු බොහෝ දෙනෙකුට එන්නත ලබා දුන්නා.

### අධ්‍යාපනය

අධ්‍යාපනය අඩාල වෙලා. දුරස්ථ ඔන්ලයින් අධ්‍යාපනය නාගරික සහ ධනවත් පවුල්වලට සීමා වෙලා තියෙන්නෙ. ආර්ථික දුෂ්කරතා තියෙන ග්‍රාමීය පවුල් ගැටළු රැසකට මුහුණ දුන්නා. අධ්‍යාපන අමාත්‍යාංශය පාසල් පද්ධතිය සහ සිසුන් වෙනුවෙන් කිසිම දෙයක් කරලා නැහැ.

විශ්වවිද්‍යාල මට්ටමේදී අධ්‍යාපන ක්‍රියාවලිය ඉදිරියට ගෙන යාම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා. නැගෙනහිර විශ්වවිද්‍යාලය සිසුන්ට සහ විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ට නොමිලේ වේදිකාවක් සපයා දීම සඳහා Zoom සමාගම සමග ගිවිසුමක් අත්සන් කළා. විශ්වවිද්‍යාලය සඳහා නොමිලේ අන්තර්ජාල පහසුකම් සපයා දී ඇතත් පාසල් මට්ටමේ දී ගුරුවරුන්ට සහ සිසුන්ට තියෙන්නෙ අඩු පහසුකම් සහ තාක්ෂණය පිළිබඳ සීමිත දැනුමක්.



*සංචරණ සීමා ඉවත් කරනු ලැබීමෙන් පසුව සවස් කාලයේ පැවැත්වෙන පෞද්ගලික පංතියකට සහභාගී වන සිසුන් පිරිසක්*

ඔවුන්ට තමන්ගේ වියදමෙන් දුරකථන වැනි පහසුකම් ලබා ගැනීමටත් ඩේටා ගාස්තු ගෙවීමටත් සිදු වෙලා තිබෙනවා. සමහර ගුරුවරු තමන්ගේ සිසුන්ට අධ්‍යයන කට්ටල සහ පත්‍රිකා පවා සකස් කර මුද්‍රණය කර දුන්නත් ඔවුන්ට ඒවා මුද්‍රණය කිරීමේ සහ බෙදා හැරීමේ වියදම් වෙනුවෙන් කිසිම සහයෝගයක් ලැබුණෙ නැහැ. අගුළු දැමීම් හේතුවෙන් ඡායා පිටපත් මධ්‍යස්ථාන බොහොමයක් වසා තිබූ නිසා ගුරුවරුන්ට ඡායා පිටපත් ලබා ගන්න බොහෝ වෙහෙසෙන්න සිද්ධ වුණා.

මම හිතන්නේ රජයට සිසුන් සඳහා සියලුම පාඩම් බෙදා හරින්න ත්‍රෛභාෂා වෙබ් වේදිකාවක් ආරම්භ කරන්න පුළුවන්. සෑම පාසලක ම තියෙන්නෙ එකම විෂය මාලාවක් නිසා පාඩම් පැවැත්වීම පහසුයි. ඒ සඳහා වැය වන පිරිවැය අඩු නිසා සිසුන්ට සහ ගුරුවරුන්ට එමගින් යම් සහනයක් ලැබේවි. ඒ වගේම, සිසුන්ට පාඩම් අන්තර්ගතය බෙදා දීමට වේදිකා ලෙස රූපවාහිනිය, ගුවන්විදුලිය සහ යූ ටියුබ් භාවිතා කළ හැකියි. පෘතුගාලය වසංගත කාලය තුළදි ඒ රටේ අධ්‍යාපන පද්ධතිය මේ ආකාරයෙන් පවත්වාගෙන යන බව මට දැනගන්නට ලැබුණා.

## මානසික සෞඛ්‍යය

අගුලු දැමීමක් නොතිබියදීත් බොහෝ දෙනෙක් නිවසින් පිටතට යාමට බිය වුණා. ළමයින්ට සහ තරුණයින්ට විෂය බාහිර ක්‍රියාකාරකම්වල නිරත වෙන්න අවකාශයක් තිබුණෙ නැහැ. තරුණයින් ඔවුන්ගේ දුරකථනවලට ඇබ්බැහි වුණා. ඔවුන් ගෙන් සමහරෙක් ගේම්වලට ඇබ්බැහි වෙලා. ඔවුන්ගේ නිදා ගැනීමේ රටා සහ සිතීමේ රටා පවා වෙනස් වෙලා. වසංගතය හේතුවෙන් ඇතිවෙලා තිබෙන මානසික සෞඛ්‍ය තත්වය මෙහෙයවා ගැනීමට සෞඛ්‍ය අංශයට නොහැකියි. උපකාර කිරීමට සහ මගපෙන්වීම් ලබා දීමට හැකියාව තිබෙන පුද්ගලයින් ද දුෂ්කරතා රැසකට මුහුණ දීලා ඉන්නෙ.

## හමුදාකරණය

පසුගිය වසර එකහමාර තුළ හමුදාව සහ පොලිසිය නිරෝධායන නීතිය ක්‍රියාත්මක කරන්න අපේ පාරට අවිල්ලා හිටියෙ. ඔවුන් වීදිවල මුර සංචාරයේ යෙදෙමින් මිනිසුන්ගේ ජීවන රටා පරීක්ෂා කරමින් හිටියෙ. සමහර අය එළියට ගියාම ගුටි කෑවා. මම දැක්කා තරුණයින් කණ්ඩායම් යතුරුපැදි වලින් ප්‍රධාන පාරේ එහෙ මෙහෙ යමින් ඉන්න විට පොලිසිය සහ හමුදාව ඔවුන්ව දැකල ඔවුන්ට පහර දීලා ආපසු ගෙදර යැව්වා. මම දකින හැටියට නම් ඒක එහෙම වෙන්න ඕනැ, මොකද වසංගතයෙන් එල්ලවන අවදානම ගැන හිතන්නෙ නැතිව ඒ විදයට ක්‍රියා කරමින් ඔවුන් වගකීම් විරහිත ආකාරයට හැසිරුණු නිසා. ප්‍රධාන පාරෙන් ඇතුළට තියෙන ප්‍රදේශවල මිනිස්සු අගුළු දැමීම ගැන කිසිම තැකීමක් නැතිව එහෙ මෙහෙ යනවා. නිරෝධායන නීති ගැන කිසිදු තැකීමක් නොකර තැන තැන ඇවිදිමින් සිටි මුස්ලිම් ජාතිකයන් කිහිප දෙනෙකු විශේෂ කාර්ය බළකාය විසින් ප්‍රසිද්ධියේ දණ ගැස්වීමේ සිද්ධියක් එරාවූර් ප්‍රදේශයේ සිදු වුණා. එම සිදුවීමෙන් පසුව, එම සිද්ධියට සම්බන්ධ හමුදා නිලධාරීන්ව ස්ථාන මාරු කරලා. ඊට පස්සෙ හමුදාව වත්, පොලිසිය වත් මේ අවට ගැවසෙමින් ඉන්න පුද්ගලයින්ට මොනවත් කියන්න ගියේ නැහැ. කවුරුහරි මුඛ ආවරණයක් නොමැතිව ගියත් ඔවුන් මොනවත් කියන්නෙ නැහැ. මේ දැන් වුනත් මේ පැත්ත ලොක්ඩවුන් කරල තියෙන්නෙ. ඒත් මට පේනවා මිනිස්සු එහා මෙහා ඇවිදිනවා. සමහරු පාර අයිනේ ඉඳගෙන කතා කර කර ඉන්නවා. අපි නම් එළියට යන්නේ අත්‍යාවශ්‍ය දේකට විතරයි.

## වෛද්‍ය පරීක්ෂණ සහ වෛද්‍ය පහසුකම්

මගේ ඥාති සහෝදරයෙක් ඉන්නවා බන්ධනාගාර නිලධාරියෙක් කුරුණෑගල වැඩ කරන්නෙ. එයාට එයා වැඩ කරන බන්ධනාගාරයට යාමට පැය හැත්තෑ දෙකකට පෙර පී.සී.ආර්. පරීක්ෂණයක් කරන්න සිද්ධ වුණා. ඒ නිසා එයා එම්.ඕ.එච්. ඔෆිස් එකට ගිහිල්ල එයාගේ අවශ්‍යතාවය දැනුම් දුන්නා. ඒත් ඒ කියන කාලය ඇතුළත ඒක කරල දෙන්න බැරිවෙයි කියල එම්.ඕ.එච් ඔෆිස් එකෙන් කිව්ව. ඊට පස්සේ පුද්ගලික රෝහලකට යන්න කියලා එයාල අපිට කිව්ව. පුද්ගලික රෝහලෙන් පී.සී.ආර්. පරීක්ෂණය කරන්න රුපියල් 9,000 ක් අය කළා.

මෙයට මාසෙකට පෙර මගේ පියාට උණ රෝගයක් වැළඳුණා. ඔහුට කොවිඩ්-19 ආසාදනය වී ඇතැයි බියෙන් මම ඔහුව රෝහලට ගෙන ගොස් ඇන්ටිජන් පරීක්ෂණයක් කරන ලෙස ඔවුන් ගෙන් ඉල්ලා සිටියා. එම පරීක්ෂණය කරන්න අවශ්‍ය නම් ඔහුව රෝහලට ඇතුළත් කර ගත යුතු යැයි ඔවුන් කිව්වා. ඔහුව රෝහලට ඇතුළත් කිරීමට අකමැති නම්, ඔහුව එම්.ඕ.එච්. ළඟට ගෙන ගොස්, බෙහෙත් අරන් දී ගෙදර රැගෙන යා යුතු බව ද ඔවුන් පැවසුවා. එම රෝහල දිගු කලක් තිස්සේ පිරිසිදු කර තිබුණෙ නැහැ. වාට්ටු සහ වැසිකිළි ඉතා අපිරිසිදුවට තිබුණෙ. රෝහලේ අපිරිසිදු වටපිටාව ආසාදනය වීමට හේතු විය හැකි නිසා මම ලිපියක් ලියා මගේ පියාව නැවත නිවසට රැගෙන ගියා.



*පලන ලද විශාල දව කොට කිලිනොච්චිය '9 මාර්ගය ඔස්සේ ප්‍රවාහනය කරන අයුරු*

## පාරිසරික බලපෑම

මිනිස්සු කලින් උයන්න දර එකතු කර ගත්තා. ඒත් එල්.ටී.ටී.ඊ. සංවිධානය පරාජය කළාට පස්සෙ කාටවත් දර එකතු කරන්න ඉඩ දුන්නෙ නැහැ; ඒක දැන් නීති විරෝධී දෙයක් විදියටයි සලකන්නේ. දරවලින් බොහොමයක් භාවිතා කරන්නේ අඟුරු සෑදීමටයි. දේශපාලන අනුබලය සහිත මාෆියාවක් මගින් පාලනය කරන වැලි ගොඩදැමීම පුළුල්ව පැතිරිලා තියෙනවා. මෑතකදීත් දේශපාලන බලපෑම් මත දිසාපතිවරයාව ඉවත් කළා. දිසාපතිවරයා කලින් එල්.ටී.ටී.ඊ. සංවිධානය විසින් පාලනය කළ ඉඩම් ප්‍රදේශයක පරිපාලනයට සම්බන්ධ වෙලා හිටියෙ. එම ඉඩම් ගව පාලනය සඳහා වෙන් කරලා, ගැසට් කරලයි තිබුණෙ. කරුණා, පිල්ලෙයාන් සහ මහ ඇමැති අනුරාධ යහම්පත්ගේ අනුබලය මත ඇතැම් සිංහල අය ගොවිතැන් කිරීමට එම ඉඩම් මිලදී ගෙන තිබෙනවා. දිසාපතිතුමාව ඉවත් කර දැමුවා.

## ගෘහස්ත හිංසනය සහ මත්ද්‍රව්‍ය භාවිතය

මත්ද්‍රව්‍ය භාවිතය මෙහි සාමාන්‍ය මිනිස්සුන්ගේ ව්‍යාපාරයක් නොවෙයි. හමුදාවයි පොලිසියයි ඒකට සම්බන්ධයි. එක දවසක් එයාලා අසල නිවසකින් මත්කුඩු අල්ලගත්තා. ඊට පස්සේ එයාලා රත්තරන් බඩුවල බර කරන තරාදියෙන් ඒවායේ බර කිරා ගන්න බැංකුවට අරගෙන ගියා. මගේ සහෝදරිය බැංකුවේ වැඩ කරන්නෙ. එයා කිව්වා අල්ලා ගත්ත මත්ද්‍රව්‍ය වලින් භාගයක් පොලිසිය විකුණන්න හරි එයාලගේ භාවිතයට හරි අරගන්නවා කියල.

## ධනාත්මක ලක්ෂණ

ගෙවතු වගාව, විශේෂයෙන් ම ප්‍රජාව තම පවුලේ භාවිතය සඳහා එළවළු සහ පලා වර්ග වගා කිරීම වැඩි වෙලා තියෙනවා.

## දෙවන සම්මුඛ සාකච්ඡාව

කඳුකර ප්‍රදේශයේ ජීවත් වන, ප්‍රාදේශීය මාධ්‍යවේදියෙකු ලෙස සේවය කරන 25 හැවිරිදි මුස්ලිම් ප්‍රජාවේ තරුණයෙකු සමග මෙම සම්මුඛ සාකච්ඡාව සිදු කරන ලදී.

**වසංගතය පිළිබඳ ඔබගේ අත්දැකීම කුමක්ද සහ එය ඔබගේ ජීවන රටාවන් වෙනස් කර ඇත්තේ කෙසේද?**

මම උපාධිය ලබා ගත්තේ 2019 දෙසැම්බර් මාසයේ දී. මම මගේ අනාගතය ගැන බොහෝ බලාපොරොත්තු තියාගෙන හිටියෙ. වසංගතයෙන් පස්සෙ මට රැකියාවක් සොයා ගැනීම තරමක් අපහසු වුණා. මම තවමත් රැකියාවේ සුරක්ෂිතභාවය සහ රැකියාවේ ස්ථාවරත්වය හදාගන්න වෙහෙසෙමින් ඉන්නෙ. ඒ වගේම, මගේ ප්‍රදේශයේ ඉන්න තවත් බොහෝ දෙනෙක් දෛනික කුලිය ලබන කම්කරුවන්; ඔවුන් සියලු දෙනා ම මෙම "නව සාමාන්‍ය" තත්වයට හුරු වෙන්න වෙහෙසෙමින් ඉන්නෙ. ඔවුන්ට දෛනික ආහාර වේල සොයා ගැනීමත් දුෂ්කර යි.

## ජීවනෝපාය

මේ ප්‍රදේශයේ වැවිලි අංශයට සම්බන්ධ වෙලා ඉන්න අය අඩුයි. මේ පැත්තෙ අයගෙන් සමහරෙක් කොළඹ ප්‍රදේශයේත්, සමහරු ඇඟලුම් කර්මාන්ත අංශයේත්, සංචාරක ක්ෂේත්‍රයේත්, තවත් සමහරු පිටරටවලත් රැකියා කරනවා. කොහොම වුනත්, පහුගිය අවුරුද්දෙදි, වසංගතය හේතුවෙන් ඔවුන් ගෙන් බොහෝ දෙනෙකුට ඔවුන්ගේ රැකියා සහ ඔවුන්ගේ ආදායම් මාර්ග අහිමි වුණා. ආසාදනය වෙයි කියන අවදානමට මිනිස්සුන්ගේ තියෙන බිය නිසා දෛනික කුලිය උපයන සේවකයින්ට වැඩ ලැබෙන්නෙ නැහැ. ව්‍යාපාරවල නිරත වෙලා ඉන්න පුද්ගලයින් දුෂ්කරතාවලට මුහුණ දුන්නා. සමහරුන්ට තමන්ගෙ කඩ වසා දැමීමට සිදු වුණා. සිල්ලර බඩු වෙළඳාම් කරපු අයට නම් ජංගම අලෙවි කිරීම් වැනි වෙනත් ක්‍රියාමාර්ග තිබුණු නිසා දුෂ්කරතා අඩු යි.

මිනිසුන්ගේ මානසික සෞඛ්‍යයට සහ චින්තනයට සිදු වී ඇති බලපෑම මම නිරීක්ෂණය කළා. මගේ ගමේ ඉන්න අයගෙන් වැඩි දෙනෙක් මුස්ලිම් අය. ඔවුන්ට ආදාහනය කිරීමේ ප්‍රශ්නය සම්බන්ධයෙන් විවිධ ගැටළු සහ බිය තිබුණා. මිය ගිය පුද්ගලයෙකුට ආසාදනය වෙලා තිබුණොත් බොහෝ බාධාවන්ට සහ ආදාහනය කිරීමේ ප්‍රශ්නයට මුහුණ දෙන්න සිද්ධ වෙන බව දන්නා නිසා සමහරු මරණයක් වුනහම පී.සී.ආර්. පරීක්ෂණ කරන්න බිය වුණා. ඔවුන් ප්‍රාදේශීය භූමදාන පිළිවෙත් සැලකිල්ලට ගත යුතුයි.

## කොවිඩ් ආසාදන සහ මරණ

පළමු රැල්ල ඇති වූ අවස්ථාවේ ආසාදිතයින් ඉතා අඩු සංඛ්‍යාවක් හඳුනා ගත්තෙ. නමුත් දෙවන රැල්ලෙදි එම සංඛ්‍යාව වැඩි වුණා; තුන්වන රැල්ල දැඩි ලෙස බලපෑවා. 2021 අප්‍රේල් මාසයෙන් පස්සෙ, ආසාදනය වුණ බොහෝ දෙනෙක් රෝහල් ගත කරන්න සිද්ධ වුණා. අප්‍රේල් මාසයේ අවසානය වන විට, අපේ ප්‍රදේශයේ සිදු කළ පී.සී.ආර්. පරීක්ෂණ 300 ක් අතරින් බහුතරයක් දෙනා ආසාදිතයින් බව සොයා ගත්තා. ඒ නිසා සෞඛ්‍ය නිලධාරීන් මේ ප්‍රදේශය ලොක්ඩවුන් කරල අපේ ගම හුදෙකලා කළා.

## සෞඛ්‍ය අංශයෙන් ලැබුණු සහාය



එන්නත ලබා ගැනීම සඳහා කොළඹ සහසුපුර නිවාස සංකීර්ණයේ පෙළ ගැසී සිටි ජනතාව, ඡායාරූපයේ මූලාශ්‍රයː TRT World

සිදු වුන මරණ පිළිබඳව සියලු දෙනා ම සෞඛ්‍ය නිලධාරීන්ව දැනුවත් කළා. ඒ වගේම, සමහර ආසාදිතයින්ව හඳුනාගත්තහම, ඔවුන්ගේ පළමුවන සහ දෙවන පෙළ ආශ්‍රිතයින්ව හඳුනා ගැනීමට සහ නිරෝධායන ක්‍රියාවලිය නිසි ලෙස ඇඟයීමට ඔවුන්ව භාවිතා කළා. ඔවුන් ගොඩක් පරීක්ෂණත් සිදු කළා. ප්‍රතිඵල දැනුම් දීමට සාමාන්‍යයෙන් දින පහක් පමණ ගත වුණා.

සෞඛ්‍ය නිලධාරීන් එන්නත්කරණ ක්‍රියාවලිය පිළිබඳවත් නිසි දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කළා. හැකි ඉක්මනින් එන්නත ලබා ගන්න කියලා ඔවුන් ජනතාව දිරිමත් කළා; ඔවුන් මෙම ප්‍රදේශයේ එන්නත්කරණ ක්‍රියාවලිය හොඳින් සිදු කළා. මගේ ගමේ වයස අවුරුදු 30 ට වඩා වැඩි අයගෙන් බහුතරයක් දෙනා සම්පූර්ණයෙන් ම එන්නත්කරණය ලබා ගෙන ඉන්නෙ.

## රජයෙන් ලැබුණු සහාය

මගේ ගමේ අභ්‍යන්තර උපකාරක සේවාව හොඳයි. ඒත් එයාලා නිරෝධායනයට ලක්වෙලා ඉන්න පුද්ගලයින් සඳහා ලබා දෙන රුපියල් 10,000 ක අත්‍යාවශ්‍ය සලාකය ලබා දුන්නෙ නැහැ. ඒක දෙන්නේ දින 14 ක නිරෝධායනය යටතේ සිටින අයට පමණයි කියලා කිව්වා. අපේ ප්‍රදේශයේ නිරෝධායන කාලය දින 10 ට අඩුයි. මේ ප්‍රදේශයේ ඉන්න සමෘද්ධි ප්‍රතිලාභීන් සංඛ්‍යාව අඩුයි. නමුත් අඩු ආදායම්ලාභී ජනතාව සඳහා සහනාධාරය ලබා දෙනවා. දැන් රුපියල් 2,000 ක සහනාධාරයකුත් දෙන්න පටන් අරන්. ඒ ක්‍රියාවලීන් පිළිබඳව සහ ඒවා හොඳින් කළමනාකරණය කළාද නැද්ද යන්න ගැන මම එතරම් දන්නේ නැහැ. මේ ප්‍රදේශයේ එම ක්‍රියාවලියට සහයෝගය දක්වන්න දේශපාලන නියෝජිතයින් සම්බන්ධ වුනෙත් නැහැ. ඒත් එක ඇමැතිවරයෙක් කොත්මලේ සහ පූඬළු ඔය අවට ප්‍රදේශවල ජනතාවට උදව් කරනවා කියලා මට ආරංචි වුණා.




කොවිඩ්-19 නව කොරෝනා වෛරසය පැතිරීම වැළැක්වීමේ ක්‍රියාමාර්ගයක් ලෙස ප්‍රාදේශීය ප්‍රදේශ අතර සංචරණ සීමා පනවා තිබූ අවස්ථාවක යාපනය අලිමංකඩ ප්‍රදේශයේ මුරපොළක ශ්‍රී ලංකා පොලිස් විශේෂ කාර්ය බලකායේ සාමාජිකයින් මුඛආවරණ පැළඳ මුර රාජකාරියේ නිරතව සිටින අයුරු

## හමුදාකරණය

දෙවැනි රැල්ල අතරතුරදී ආරක්ෂක නිලධාරීන් ඇවිත් අපි ආරක්ෂා විය යුතු ආකාරය ගැන සහ මේ අර්බුදයෙන් ගොඩ එන්න සාමූහික ප්‍රයත්නයක් තිබීමේ අවශ්‍යතාවය පිළිබඳව ගම්වාසීන් සමග සාකච්ඡාවක් පැවැත්වූවා. හැමෝම උත්සාහ කළේ තත්ත්වය තේරුම්ගෙන ඒ අනුව වැඩ කරන්න. ආදාහනය සම්බන්ධ ප්‍රශ්නයේ බලපෑම හැරෙන්නට සුළුතර කණ්ඩායම්වල අයිතිවාසිකම් සම්බන්ධ ප්‍රශ්න තිබුණේ නැහැ. මගේ ගමේ ජනතාව ගෙන් බහුතරයක් මුස්ලිම් වුණත් අපි හැමෝම මේ ප්‍රදේශයේ සිංහල දෙමළ ගම්මාන සමග සමගියෙන් ජීවත් වෙනවා.

## අධ්‍යාපනය

මාර්ගගත අධ්‍යාපනය සඳහා අවශ්‍ය කරන මූල්‍ය සම්පත් සහ පහසුකම් නොමැති පුද්ගලයින්ට එය කොහෙත් ම ප්‍රායෝගික නොවන නිසා එමගින් අධ්‍යාපන ක්ෂේත්‍රයට බලපෑම් එල්ල වී තිබෙනවා. 2019 දී පෙර පාසලට ගිය ළමය දැන් ඉන්නේ එක ශ්‍රේණියේ හෝ දෙක ශ්‍රේණියේ. දැන් 5 ශ්‍රේණියේ ඉගෙනුම ලබන ළමයින්ට 4 ශ්‍රේණියේ දී ලැබෙන්න ඕනැ පුහුණුව ලැබුණෙ නැහැ. සාමාන්‍ය පෙළ විභාගයට පෙනී සිටි සිසුන්ට තවමත් ප්‍රතිඵල ලැබිලා නැහැ. මාර්ගගතව ඉගැන්වීමේ උත්සාහයන් ප්‍රායෝගික හෝ ඵලදායී නැහැ. මාර්ගගත ක්‍රමය ම අධ්‍යාපන ක්‍රියාවලිය සමග ඒකාබද්ධ කිරීමට අපහසුයි. සමහර ළමයි නිසි පරිදි පන්තිවලට සහභාගි නොවෙන නිසා ඔවුන් මුහුණ දෙන මානසික අභියෝග තිබෙනවා.

මේ වසර එකහමාර තුළ අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශාල හිදැසක් නිර්මාණය කර තිබෙනවා. ළමයි විෂය බාහිර ක්‍රියාකාරකම්වලට හෝ ක්‍රීඩාවලට සම්බන්ධ වෙලා නැහැ. සමහර ප්‍රදේශවලට අන්තර්ජාල සම්බන්ධතා සහ වෙනත් උපකරණ පහසුකම් නිසි පරිදි නැති නිසා මාර්ගගත අධ්‍යාපනයේ පිරිවැයත් ඉහළ යි.

## පරිසරය

කසළ කළමනාකරණය අත්‍යාවශ්‍ය සේවාවක් ලෙස ගැසට් කර තිබෙන නිසා කසල එකතු කරන අය දින දෙකකට වරක් පැමිණ ඒවා නිසි පරිදි එකතු කළා. නමුත් කොවිඩ් තත්වයට ඇති බිය නිසා ඔවුන් ආවෙ නැති දවසුත් තිබුණා.

## මානසික සෞඛ්‍යය

මම හිතන්නේ මේක වසංගතය හේතුවෙන් වක්‍රාකාරයෙන් පැනනගින ප්‍රශ්නයක්. සෑම කෙනෙකුගේම මානසික තත්ත්වයට බලපෑම් ඇතිවෙලා තියෙන්නෙ. ජනතාව ආර්ථිකය සහ ජීවනෝපාය සම්බන්ධ ගැටළු රාශියකට මුහුණ දීලා ඉන්න අතරෙ ඔවුන්ට මිනිසුන්ගෙ මරණ ගැන දැනගන්න ලැබෙන විට ඔවුන් බියට පත් වෙනවා. සෑම කෙනෙක් ම තමන්ගේ ජීවිත සැලසුම් සාර්ථක කර ගන්න වෙහෙසෙමින් ඉන්නෙ, ඒත් දැන් ඔවුන් තමන්ගේ අපේක්ෂාවන් ගැන ශුභවාදී නැහැ.

## ගෘහස්ථ හිංසනය, මත්ද්‍රව්‍ය භාවිතය සහ වෙනත් ගැටළු

මත්පැන් සහ වෙනත් මත්ද්‍රව්‍ය භාවිතය වැඩිවෙලා තියෙන්නෙ. ඇතිවී තිබෙන තවත් ප්‍රධාන ගැටළුවක් තමයි ජංගම දුරකථන වලට ඇබ්බැහි වීම.

ගෘහස්ථ හිංසනය සිදුවන අවස්ථා බොහෝ තිබිය යුතුයි, නමුත් බොහොමයක් සිදුවීම් එළියට එන්නේ කලාතුරකින්. මම හිතන්නේ මාධ්‍ය වලින් වාර්තා කරන්නේ එවැනි සිදුවීම් වලින් 10% ක විතර ප්‍රමාණයක් පමණයි, බහුතරයක් දෙනා පැමිණිලි කරන්නේ නැහැ.

## ධනාත්මක හැඩගැසීම්

ගෙවතු වගාවේ වැඩිවීමක් තිබීම ධනාත්මක දෙයක්. මංගල උත්සව සහ අවමංගල්‍ය උත්සව වලට සහභාගි විය හැකි සංඛ්‍යාව සීමා කිරීමත් ධනාත්මක දෙයක්. මිනිස්සු තමන්ගෙ ජීවිත ගත කළේ යන්ත්‍රසූත්‍ර වගේ; අගුළු දැමීම් නිසා ඔවුන්ට එම ජීවන රටාවෙන් ඈත්වෙලා පවුල් ජීවිතය කෙරෙහි වැඩි අවධානයක් යොමු කරන්න අවස්ථාව ලැබුණා. ඒ වගේම, සමහර අය ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා ප්ලාස්ටික් සහ පාවිච්චි කර ඉවතලන බඩු එකතු කිරීම වැනි කුඩා ව්‍යාපාර ආරම්භ කරල, අලුත් දේවල් හදන්න ඒවා භාවිතා කළා. ඒ වගේම තරුණ පිරිස අතර අත්කම් භාණ්ඩ නිෂ්පාදනය සහ අලෙවිය වැඩි වුණා.

## වෙනත් අදහස්

මේ අර්බුදය කවදා ඉවර වෙයිද කියලා අපි දන්නේ නැහැ. ඒත් මම හිතන්නේ ප්‍රධාන වශයෙන් ම මානසික සෞඛ්‍ය ගැටළු විසඳන්න මොනව හරි ක්‍රමවේදයක් සොයා ගත යුතුයි. ඒක වැදගත් කරුණක්, මොකද ඒ සම්බන්ධයෙන් උපකාර කරන්න කවුරුවත් නැහැ. ඒක රටේ බොහෝ දෙනෙකුට පොදු සංසිද්ධියක්. වසංගතය පොදු ප්‍රශ්න නිර්මාණය කළා, ඒත් ගත යුතුව තිබූ ඉතාමත් ම වැදගත් තීරණ බොහොමයක් ප්‍රමාද වුණා. දැන් ඔවුන් උත්සාහ කරමින් ඉන්නවා, ඒත් ඒක අශ්වයා පැනල ගියාට පස්සෙ ඉස්තාලයේ දොර වහනවා වගේ වැඩක්. එයාලා දොර වහන්න ගොඩක් ප්‍රමාද වෙලා. ප්‍රශ්නය ජයගත හැකි එකම ක්‍රමය තමයි සාමූහිකව එයට මුහුණ දීම සඳහා අපි එකට එකතුවෙන එක.

## තෙවන සම්මුඛ සාකච්ඡාව

**මඩකලපුව ප්‍රදේශයේ පදිංචි, දෙමළ ප්‍රජාවට අයත්, පර්යේෂකයෙක් සහ නාට්‍යකරුවෙක් ලෙස සේවය කරන වයස අවුරුදු 28 ක් වූ පිරිමි පුද්ගලයෙකු සමග මෙම සම්මුඛ සාකච්ඡාව පවත්වන ලදී.**

**වසංගතය පිළිබඳ ඔබගේ අත්දැකීම කුමක්ද සහ එය ඔබගේ ජීවන රටාවන් වෙනස් කර ඇත්තේ කෙසේද?**

වසංගත කාලය තුළදී මට නිවසේ සිට වැඩ කිරීමේ අවස්ථාව ලැබුණා. මේ ප්‍රදේශයේ ඉන්න අනෙක් අය සමග සංසන්දනය කර බැලූ විට, මම එතරම් මූල්‍ය හෝ වෙනත් දුෂ්කරතාවලට මුහුණ දුන්නේ නැහැ. නමුත් මගේ ගම පුරා ඉන්න බොහෝ දෙනෙක් අභියෝග රාශියකට මුහුණ දුන්නා. ඔවුන් ගෙන් වැඩි දෙනෙක් කෘෂිකර්මාන්තයට සහ ධීවර කර්මාන්තයට සම්බන්ධ රැකියාවල නිරතවෙලා ඉන්නෙ; තවත් සමහර අය දෛනික වැටුප් ලබන කම්කරුවන් සහ සංක්‍රමණික සේවකයින්. මේ වසංගතය ඔවුන්ට සහ ඔවුන්ගේ ජීවනෝපාය මාර්ගවලට දැඩි ලෙස බලපෑවා. අගුළු දැමීම් නිසා ඒ අයට පිටතට ගිහින් ඔවුන්ගේ අස්වැන්න විකුණා ගන්න බැරි වුණා. ඉඩම් නැති මිනිස්සු දෛනික කුලියට තමයි වැඩ කළේ; දැන් ඔවුන්ට ඔවුන්ගේ ආදායම සහ රැකියාවේ සුරක්ෂිතභාවය අහිමි වෙලා.

## රජයෙන් ලැබුණු සහය

මගේ ගමේ ඉන්න මිනිසුන් ගෙන් 70% ට වඩා වැඩි දෙනෙක් සමෘද්ධි ප්‍රතිලාභීන්; මේ අර්බුදය වෙලාවෙ ඔවුන්ට ඒක උපකාරී වුණා. නමුත් සමහර අවස්ථා වලදී නියමිත වේලාවට සහනාධාර ලැබුණෙ නැහැ. මේ ප්‍රදේශයේ සහනාධාර බෙදල දෙන්න දවස් හතරකට පහකට වඩා වැඩි කාලයක් ගත වුණා. සමහර අවස්ථා වලදී සහනාධාර බෙදීම පරිපාලනය කරපු අය ප්‍රතිලාභීන්ට පාසල් සහ රෝහල් පිරිසිදු කිරීම වගේ සමහර වැඩ කරන්න කිව්වා. මේ අවස්ථාවේ මිනිස්සු එක්රැස් වෙන එක අවදානම් සහගත දෙයක් නිසා ඒක හොඳ පියවරක් නොවෙයි - ඒක අගුලු දැමීමේ අරමුණට පටහැනි දෙයක්. සලාක බෙදා දීම පරිපාලනය කිරීම සහ බෙදා දීම සම්බන්ධ තවත් ගැටළු කිහිපයක් තිබුණා. සහනාධාර වගේ උපකාරයක් ලබාගන්න සුදුසුකම් නැති සහ අවශ්‍යතාවයක් නැති පුද්ගලයින්ට පවා එම සහනාධාර ලබා දුන්නා. ඒ ඔවුන් බලවත් පුද්ගලයින් සමග සම්බන්ධකම් තියෙන අය නිසා.



රු.5,000/= දීමනාව ලබා ගැනීම සඳහා

1. ගෘහ මූලිකයාගේ නම :
2. පවුලේ සාමාජිකයින් සංඛ්‍යාව :
3. ජාතික හැඳුනුම්පත් අංකය :
4. උපන් දිනය :
5. ස්ථිර පදිංචි ලිපිනය :
6. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :

*අගුළු දැමීම් හේතුවෙන් තම ජීවනෝපාය අහිමිවූ පුද්ගලයින්ට රජයෙන් ලැබෙන රු.5,000 ක දීමනාව ලබා ගැනීම සඳහා පිරවිය යුතු පෝරමය. ඡායාරූපයේ මූලාශ්‍රය:*Newswire.lk

පාසල්වල ආදි ශිෂ්‍ය සංගම්, ක්‍රීඩා සමාජ, සිවිල් සමාජය සහ ඩයලොග් වැනි සමහර පෞද්ගලික සමාගම් ද මිනිස්සුන්ට උපකාර කළා; ඒත් එවැනි ක්‍රියාමාර්ග ඉතාමත් සීමිත වුණා. උතුරු පළාත කේන්ද්‍ර කරගත් සමහර දේශපාලන පක්ෂත් යම් යම් ආධාරක යාන්ත්‍රණ ක්‍රියාත්මක කළා; ඒත් ඒවා මහා පරිමාණයෙන් ක්‍රියාත්මක වුණේ නැහැ.

## නීතිය හා සාමය

මුලින්ම අගුළු දැමීම් පනවපු වෙලාවෙ මිනිස්සු ඒක තදින්ම අනුගමනය කළා. ඒත් දැන් තියෙන අගුළු දැමීම යටතේ බොහෝ දෙනෙක් මේ සීමාකිරීම් නියම විදියට අනුගමනය කරන්නෙ නැතිව පිටතට යනවා. ඒකට හේතු කිහිපයක් තියෙනවා. මිනිස්සු අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය, ප්‍රධාන වශයෙන්ම ආහාර ද්‍රව්‍ය, සපයා ගන්න පිටතට යනවා. පොලිසිය සහ රජය ඒකට වගකිව යුතු නැහැ; ඔවුන් අගුළු දැමීම් බලාත්මක කරන්න සැලකිල්ලක් දක්වන බවක් පෙනෙන්නත් නැහැ. ඒ වගේම, ආර්ථිකයේ තත්ත්වයත්, මිනිසුන්ගේ අඩු ආදායම් තත්වයත් නිසා මිනිස්සු යමක් උපයා ගන්න නොඉවසිල්ලෙන් ඉන්නෙ. මෙවැනි පසුබිමක් තුළ, අගුළු දැමීමක් තියෙනවද නැද්ද කියලත් අපිට පේන්නෙ නැහැ. ගම්බද ප්‍රදේශවල මේ තත්ත්වය මෙයටත් වඩා දරුණුයි.

නීති කඩකරන අය පිළිබඳව බුද්ධි අංශවල නියෝජිතයින්ට තොරතුරු වාර්තා කරන සැඟවුණු ඔත්තුකරුවන් ගම්බද ප්‍රදේශවල ඉන්න අවස්ථා තියෙනවා; මිනිස්සු එළියට ගිහිල්ල ඉන්න වෙලාවෙ ඔවුන්ට පහර දුන් අවස්ථා තියෙනවා. ඒක නීති පැනවීමේ කුරිරු ක්‍රමයක්. උතුරු නැගෙනහිර යුද්දෙ අවසන් වුණාට පස්සෙ කාලය තුළ ආරක්ෂක අංශවලට සම්බන්ධ දෙමළ ජාතිකයින් විශාල සංඛ්‍යාවක් සිටිනවා; ඒ නිසා මේක හුරුපුරුදු රටාවක්. එරාවුර් ප්‍රදේශයේ මුඛ ආවරණ නොපැළඳ සිටි මුස්ලිම් ජාතිකයන් කිහිප දෙනෙකු ආරක්ෂක අංශ විසින් බලහත්කාරයෙන් දණ ගැස්වීමේ සිද්ධිය එයට උදාහරණයක්.

## සෞඛ්‍ය අංශයෙන් ලැබුණු සහාය



*ස්පර්ශ නොවන අධෝරක්ත ශරීර උෂ්ණත්වමානයක් දිගුකර සිටින පාසල් ශිෂ්‍යාවක්, ඡායාරූපයේ මූලාශ්‍රය:* The Island

මහජන සෞඛ්‍ය පරීක්ෂකවරු (PHI) සහ සෞඛ්‍ය අමාත්‍යාංශය (MOH) අනුගමනය කරන ප්‍රවේශයත් කාලයත් සමග වෙනස් වෙලා තියෙන්නෙ. වසංගතයේ මුල් කාලයේදී ඔවුන් මෙම ක්‍රියාවලිය සඳහා කැපවී සිටියා. දැන් ආසාදිතයින්ගේ සංඛ්‍යාව ඉහළ යමින් තියෙන්නෙ; ආහාරපාන සහ අනෙකුත් පහසුකම් ඇතුළු නිරෝධායන පහසුකම් ද යහපත් තත්වය නැහැ. කොහොම වුණත්, ඔවුන් එන්නත් කිරීමේ ක්‍රියාවලිය පරිපාලනය කළ ආකාරය ගැන නම් මම ඉතාමත් සතුටු වෙනවා. බොහෝ ගම්මානවල, වයස අවුරුදු 30 සහ එයට වැඩි පුද්ගලයින් ගෙන් 90% ක් විතර සම්පූර්ණයෙන් ම එන්නත් කරල තියෙන්නෙ.

## අධ්‍යාපනය

වර්තමාන අධ්‍යාපන ක්‍රමය බොහෝ දුරට ඔන්ලයින් ක්‍රමයට සිදු කරන්නෙ, නමුත් ඒක ඉතාමත් සීමා සහිත ක්‍රමයක්, මොකද නාගරික ප්‍රදේශවල ජනතාවට පමණයි ඒකට ප්‍රවේශ වෙන්න පුළුවන්. හොඳ මූල්‍ය පසුබිමක් තියෙන අයට පමණයි ඒකෙන් ප්‍රයෝජන ගන්න පුළුවන් වෙන්නෙ. ග්‍රාමීය ප්‍රදේශවල ජීවත් වෙන අයට එම පහසුකම් සඳහා වියදම් දරන්න බැහැ, තාක්ෂණය භාවිතා කරන්න අවශ්‍ය දැනුමත් නැහැ. ඔන්ලයින් අධ්‍යාපනය සඳහා ඉතාමත් ම වැදගත් දෙය වන තාක්ෂණය භාවිතා කිරීම ගුරුවරුන්ට නුපුරුදු දෙයක්. පෙන් ඩ්‍රයිව් එකක් කියන්නේ මොකක්ද කියල වත් නොදන්නා සමහර ළමයි ඉන්නව මම දැකල තියෙනවා. මඩකලපුවේ ගම්බද ප්‍රදේශවල අන්තර්ජාල සම්බන්ධතාවය ඉතාමත් දුර්වල යි. මෙම තත්වයන් යටතේ ඉගැන්වීමේ විකල්ප ක්‍රමය ලෙස ඔන්ලයින් ඉගැන්වීම් දිගටම සිදුකරන්නේ නම්, ගුරුවරුන්ට ඒ සඳහා සහාය සහ පුහුණුව අවශ්‍ය වෙනවා. සමහර ගුරුවරු සටහන් සහ ප්‍රශ්නපත්‍ර මුද්‍රණය කරල සිසුන්ට බෙදා දුන්න, ඒත් ඒ සඳහා වියදම ඉතා ඉහළ යි. මම දන්නවා සමහර ගම් ප්‍රදේශවල ප්‍රින්ට් කරන තැනක් හොයාගන්න කිලෝමීටර් 30 ට වඩා වැඩි දුරක් යන්න වෙනවා. සමහර පුද්ගලයින් සහ සිවිල් සමාජය ගුරුවරුන්ට සහ සිසුන්ට ඒකට සහයෝගය ලබා දුන්නා, ඒත් රජය සහ අධ්‍යාපන අමාත්‍යාංශය නිසි සහයෝගයක් ලබා දුන්නේ නැහැ.

## පරිසරය

එක්ස්ප්‍රස් පර්ල් නෞකාවේ අනතුරෙන් පස්සෙ ධීවරයො ඒකෙන් පීඩාවට පත්වුණා. ජලජ සම්පත් රාශියක් විනාශ වෙලා, මුහුදු ජීවීන් මිය ගියා. මඩකලපුවේ මුහුදුබඩ ප්‍රදේශවලත් සමහර සත්තු මැරුණ බව වාර්තා වුණා. පිටරටවල අපි වැඩ කරන ප්‍රදේශවල, විශේෂයෙන් ම මැද පෙරදිග රටවල වැඩ කරපු බොහෝ දෙනෙක් වසංගතය වැඩිවුණ නිසා ආපහු මේ රටට ආවා. ඔවුන්ට දැන් අවශ්‍ය තරම් සම්පත් නැහැ. ඔවුන් ගෙන් සමහරෙක් අනවසරයෙන් වැලි ගොඩදැමීටත්, වනාන්තර වලින් ගස් කැපීමටත් සම්බන්ධ වෙලා ඉන්නවා. වසංගතයට පෙරත් මෙම නීති විරෝධී කටයුතු සිද්ධ වුණා, ඒත් දැන් ඒවා වැඩි වෙලා තියෙන්නෙ.

## වැරදි තොරතුරු ප්‍රචාරය වීම

මිනිස්සුන්ට වසංගතය පැතිරීමේ රටා සහ අවදානම් පිළිබඳව අවබෝධයක් නැහැ. ඔවුන් සාමාන්‍යයෙන් කටකතා වලට ඇහුම්කන් දෙන නිසා සමහර අවස්ථාවල වසංගතයෙ තියෙන අවදානම් පිළිබඳව ඔවුන්ට අවබෝධ කර දීම තරමක් අපහසු යි. වඩා හොඳින් දැනුවත් කිරීමේ අවශ්‍යතාවය සැමවිටම තිබෙනවා.

## මානසික සෞඛ්‍යය සහ ගෘහස්ථ හිංසනය

බොහෝ දෙනෙකුට මරණ බිය ඇති වී තිබෙන නිසා ඔවුන් මානසිකව පීඩාවට පත්වෙලා ඉන්නෙ. ඒ අයට දැන් මීන් පෙර කරපු විදියට අවමංගල්‍ය කටයුතු කරන්න බැහැ. මිය ගිය පුද්ගලයාගේ දේහය බලන්න ලැබෙන්නෙ කිහිප දෙනෙකුට පමණක් නිසා එය මිනිසුන්ට දැඩි ලෙස බලපාලා තියෙනවා. ඒකෙන් ඔවුන් මානසික වශයෙනුත් පීඩාවට පත්වෙලා තියෙනවා. ඒ වගේම, සංචරණය සීමා කර තිබීම ළමයින්ට සහ තරුණයින්ට විශේෂයෙන් බලපාලා තියෙනවා. මූල්‍ය සහ අනෙකුත් බාධාවනුත් මානසික වශයෙන් අමතර කනස්සල්ලක් ඇති කරලා තියෙනවා.

ඒ වගේම, ප්‍රධාන වශයෙන් අවුරුදු 25-30 වයස් කාණ්ඩයට අයත් තරුණයින් අතර මත්ද්‍රව්‍ය භාවිතයත් වැඩි වෙලා තියෙනවා. වසංගතය ඇතිවෙන්න ඉස්සෙල්ල ආරක්ෂක අංශ සහ පොලිසිය ඒකට සහාය දුන්නා.

## ධනාත්මක හැඩගැසීම්



*අම්පාර පානම ප්‍රදේශයේ වගා බිමක වැඩකරන ගොවියෙක්*

ආහාර සුරක්ෂිතතාවය තිබීමේ අවශ්‍යතාවය සහ මිනිසුන්ගේ මුදල් හිඟකම හේතුවෙන් ගෙවතු වගාව වැනි ක්‍රියාකාරකම් දිරිමත් වෙලා තියෙනවා. සැම කෙනෙක් ම යමක් වගා කිරීමට උත්සාහ කරනවා.

ඒ වගේම, මේ කාලය තුළ දී මානුෂීය ක්‍රියාකාරකම් සහ ක්‍රියාමාර්ගත් වැඩි වෙලා තියෙනවා. මේක සැම කෙනෙකුට ම සහයෝගය අවශ්‍ය වෙලාවක් නිසා රාජ්‍ය නොවන සංවිධාන, ක්‍රීඩා සමාජ, සංගම්, ආගමික ආයතන, සමිති ආදිය සහයෝගය ලබා දීමට සම්බන්ධ වෙලා ඉන්නවා. ඒක ධනාත්මක වර්ධනයක් ලෙසයි මම දකින්නේ.

සමහර තරුණ තරුණියන් මුදල් ඉපැයීම සඳහා විවිධ භාණ්ඩ සැදීමට සහ වෙනත් ස්වයං රැකියා කිරීමට පටන් ගෙන තිබෙනවා. ඒ වගේම බොහෝ සංවාද මණ්ඩප නිර්මාණය වෙමින්, පරිසරය වැනි ප්‍රාදේශීය ගැටළු සම්බන්ධ ව්‍යාපෘති ක්‍රියාත්මක කර තිබෙනවා.

## සිව්වන සම්මුඛ සාකච්ඡාව

**ප්‍රජා ක්‍රියාකාරිණියක් සහ ගෙවිලියක් ලෙස කටයුතු කරන, අනුරාධපුර ප්‍රදේශයේ සිංහල ප්‍රජාවට අයත්, 48 හැවිරිදි කාන්තාවක් සමඟ මෙම සම්මුඛ සාකච්ඡාව සිදු කරන ලදී.**

**වසංගතය පිළිබඳ ඔබගේ අත්දැකීම කුමක්ද සහ එය ඔබගේ ජීවන රටාවන් වෙනස් කර ඇත්තේ කෙසේද?**

අගුළු දමා තිබූ කාලය තුළත් අපි අදාළ සෞඛ්‍ය ක්‍රියාමාර්ග අනුගමනය කිරීමට අපේ උපරිම උත්සාහය දැරුවා, ඒත් එම ක්‍රියාමාර්ග වලින් බොහොමයක් අපේ ජීවනෝපායයන්ට අභියෝග එල්ල කළා. බොහෝ වෙලාවට මම ප්‍රජාව සම්බන්ධ ක්‍රියාකාරකම් ගණනාවකට සම්බන්ධ වෙලා හිටියෙ. අපේ ගමේ ප්‍රජා ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වෙලා හිටිය අයට මේ වසංගතය බොහෝ බාධා ඇති කළා. අපි වසංගතයට පෙර සිදු කළා වගේ අපිට එක් රැස්වී සාකච්ඡා කිරීමට හැකියාවක් ලැබුණෙ නැහැ.

මගේ තාත්තා මිය ගියේ 2019 දෙසැම්බර් මාසයේ දී. ඊට පස්සේ හැම දේ ම ඉක්මනින් වෙනස් වුණා. අපිට මොනවත් කරන්න බැරි වුණා. අපිට තාත්තා වෙනුවෙන් දෙන තුන්මාසෙ දානෙ දෙන්නවත් ලැබුණෙ නැහැ.

## ජීවනෝපාය



*අනුරාධපුර ප්‍රදේශයේ ගෙවිලියන්*
*ඡායාරූපය: අමිල උඩගෙදර*

මගේ ස්වාමි පුරුෂයා ගොවියෙක්. අපි ප්‍රධාන වශයෙන් ම අඳ ගොවි ක්‍රමය යටතේ වී වගා කරන්නෙ. ආසාදනය වෙයි කියලා තියෙන බය නිසාත්, වෛරසය පැතිරෙයි කියල තියෙන බය නිසාත් මිනිස්සුන්ට එකට එකතුවෙලා හවුලෙ වැඩකරන්න බැරිවුණා. අපි එක්කෙනෙකුගෙන් තව කෙනෙකුට වෛරසය පැතිරෙන නිසා හැමෝම එකිනෙකා දිහා ඉතාමත් සැකකටයුතු ආකාරයෙන් බලන්න පටන් ගත්තා.

අපි එළවළු පළතුරුත් වගා කළා. මේ කාලය තුළ අපිට කෙසෙල් සහ අනෙකුත් එළවළු වගා වලින් හොඳ අස්වැන්නක් ලැබුණා. ඒත් අපිට ඒවා විකුණගන්න බොහෝ දුෂ්කරතාවලට මුහුණ දෙන්න සිද්ධ වුණා.

දෙවැනි රැල්ල ආවට පස්සෙ අපිට බඩු මිලදී ගන්න බැරි වුණා; අපේ අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලබා ගන්න අවහිරතා ඇති වුණා. ගෙවත්තෙ වගා කරලා අපට අවශ්‍ය ආහාර ටික වවාගන්න අපිට පුළුවන් වුණා. මෙයට මාස කිහිපයකට පෙර සිට රසායනික පොහොර තහනම ක්‍රියාත්මක වුණාට පස්සෙ අපිට කෘෂිකර්මාන්තයේ යම් යම් ගැටළු වලට මුහුණ දෙන්න සිද්ධ වුණා.

## රජයෙන් ලැබුණු සහාය

මෙයට පෙර රජය සමුපකාර යෝජනා ක්‍රම හරහා අත්‍යවශ්‍ය ද්‍රව්‍ය කළමනාකරණය කර ගැනීමේ ක්‍රමයක් ක්‍රියාත්මක කළා. ජංගම අලෙවිහල් තිබුණත් ඒවායේ බඩු මිල වැඩියි. ඒ වගේම, මුලදී අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය බෙදා හැරීමේ වැඩසටහනකුත් ක්‍රියාත්මක වුණා. ගිය අවුරුද්දේ හැමෝටම ඒක ලැබුණා, ඒත් ඒක අඛණ්ඩව ලැබුණෙ නැහැ. ඒ වගේම "සමෘද්ධියෙන්" ලබා දෙන රුපියල් 5,000 ක දීමනාවත් අපට ලැබුණා. පසුගිය මැයි මාසයේ අපට සම්පූර්ණ මුදල ලැබුණෙ නැහැ. නිලධාරීන් අපට ලබා දුන්නෙ අපට ලැබෙන මාසික " සමෘද්ධි" සහනාධාරය අඩු කරල ඉතිරි මුදල පමණයි කියලා අපට දැනගන්න ලැබුණා. ඒ වගේම එක පවුලකින් එක් අයෙකුට තමයි ඒක ලැබුණෙ, ලියාපදිංචි නොවූ අයට ඒක ලැබුණෙ නැහැ.

## සෞඛ්‍ය අංශයෙන් ලැබුණු සහාය

අලුත් අවුරුදු සමය අවසන් වන තුරු ම මගේ ගමේත්, මේ අවට ප්‍රදේශවලත් වසංගතයට අදාළව ඉතාමත් යහපත් තත්වයක් තිබුණෙ. ඊට පස්සෙ මේ ප්‍රදේශයේත් ආසාදනයවීම් බොහෝ වාර්තා වුණා. පසුගිය මාසයේ ගල්නෑවේ අවුරුදු 80 ක පුද්ගලයෙක් මරණයට පත් වුණා. සෞඛ්‍ය අංශය සහ නිලධාරීන් මේ ප්‍රදේශයට හොඳ සහයෝගයක් ලබා දුන්නා. මෙයට පෙර ජනතාවට උපදෙස් ලබා දෙමින් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වූවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනුත්, ප්‍රදේශයේ ග්‍රාම නිලධාරීන්ගෙනුත් හොඳ සහයෝගයක් ලැබුණා. සෞඛ්‍ය නිලධාරීන් පී.සී.ආර්. පරීක්ෂණ, ඇන්ටිජන් පරීක්ෂණ සහ නිවාස නිරෝධායන ක්‍රියාවලිය සිදු කළා. පසුගිය අප්‍රේල් මාසෙදී අපේ අසල්වැසියෙකුගේ දියණියක් කොළඹ සිට ගමට ආවා; ඊට පස්සෙ එයාට කොවිඩ් ආසාදනය වෙලා තියෙනවා කියලා තහවුරු වුණා. ඉන් පසුවත් සෞඛ්‍ය නිලධාරීන් ඇයගේ සමීප ආශ්‍රිතයින්ව නිරෝධායනය කරන්න ගම්වාසීන්ට උදව් කළා. අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සහ අවශ්‍යතා සපුරා ගන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සහාය වුණා. ඒ වගේම දුෂ්කර කාලවලදී ගම්වාසීන් හැමෝම තමන්ට හැකි පමණින් එකිනෙකාට සහයෝගය දුන්නා.

## එන්නත්කරණය




*සෞඛ්‍ය අංශයේ නිලධාරියෙක් කොවිඩ්-19 ඇස්ට්‍රා සෙනිකා එන්නතේ මාත්‍රාවක් ලබා ගනිමින්, 2021 ජනවාරි, කොළඹ, මූලාශ්‍රය: රොයිටර්, ඡායාරූපය: දිනුක ලියනවත්ත*

එන්නත්කරණ ක්‍රියාවලිය හොඳින් පරිපාලනය කළා. අපිට ගිය සතියේ පළමු වන මාත්‍රාව ලැබුණා; දෙවන මාත්‍රාව ගන්න තියෙන්නෙ ඊළඟ මාසෙ. ගමේ ඉන්න අවුරුදු 60 ට වැඩි වැඩිහිටි අයට මාත්‍රා දෙකම දීලා තියෙන්නෙ. එන්නත් කිරීම ගැන මුලදී ජනතාව තුළ යම් අකමැත්තක් තිබුණත් පසුව දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පැවැත්වූවා. එන්නත ලබා දීමේ ක්‍රියාවලිය හොඳින් සිදු වුණා. ග්‍රාම නිලධාරී වසම් 3 ක ජනතාව එක මධ්‍යස්ථානයක දී එන්නත් කළා. මෙම මධ්‍යස්ථාන තුළදී ත් සමාජ දුරස්ථභාවය සහ සෞඛ්‍ය

මාර්ගෝපදේශ පිළිපැදීම කිසිදු කලබලයකින් තොරව කළමනාකරණය කර ගන්න නිලධාරීන්ට පුළුවන් වුණා.

## අධ්‍යාපනය

මේක මගේ ගමේ පවුල් මුහුණ දීල තියෙන ලොකු ප්‍රශ්නයක්. වසංගතය හේතුවෙන් පාසල් වැහුවට පස්සෙ බොහෝ අධ්‍යාපන කටයුතු ඔන්ලයින් ක්‍රමයට මාරු වුණා. ඔන්ලයින් අධ්‍යාපනය සඳහා අපට දුරකථන, ඩේටා පහසුකම් වගේම හොඳ සංඥා ආවරණයකුත් අවශ්‍ය වෙනවා. අපේ ගමේ බොහෝ පවුල්වලට ඒ සඳහා අවශ්‍ය දුරකථන නැහැ; ඒකට වියදම් දරන්න තරම් මූල්‍ය ශක්තියකුත් නැහැ. අනෙක් ප්‍රධාන ම ගැටළුව තමයි දුරකථන සම්බන්ධතා ආවරණය සහ සංඥා පහසුකම් නැති එක. මේ ඇමතුම ගන්නත් මට අපි කලින් හඳුනාගෙන තිබුණ සංඥා ආවරණයක් තියෙන ස්ථානයකට එන්න සිද්ධ වුණා. මගේ දුව ඉන්නෙ 5 ශ්‍රේණියේ, එයා ශිෂ්‍යත්ව විභාගයට සූදානම් වෙමින් ඉන්නෙ. ඒ නිසා එයාට බොහෝ විට පෞද්ගලික පන්තිවල සහායත් අවශ්‍ය වෙනවා. ඒකට ඔන්ලයින් පන්තිවලට සහභාගි වෙන්න වෙනවා. එයා මට කියල තියෙන විදියට, ඔන්ලයින් ක්‍රමයට අධ්‍යාපනය ලබා ගන්න එක තරමක් අපහසු දෙයක්; ඒ සඳහා අවශ්‍ය පහසුකම් සපයා ගැනීමේ දී විතරක් නොවෙයි, පාඩම් වලට අවධානය යොමු කරගෙන ඉන්නත් අපහසුවක් තියෙනවා. සමහර පවුල්වල පාසල් යන වයසේ ළමයි දෙතුන් දෙනෙක් ඉන්නවා. ඒ හැම ළමයට ම ඔන්ලයින් අධ්‍යාපනයට සම්බන්ධ වෙන්න සිද්ධ වෙනවා. ඒත් බොහෝ අවස්ථාවල දී, හැම ළමයෙකුට ම එක දුරකථනයක් බැගින් ලබා දීලා පහසුකම් සලසන්න ඉතා අපහසුයි. ඒ වගේම සමහර ප්‍රදේශවල ළමයි කිහිප දෙනෙක් එකතුවෙලා එක දුරකථනයකින් සම්බන්ධ වෙන්න උත්සාහ කරනවා මම දැකලා තියෙනවා.

සමහර ළමයි අධ්‍යාපනය අතහැර දාලා කෘෂිකාර්මික කටයුතු වලටයි, වෙනත් රැකියාවලටයි යොමුවෙලා ඉන්නවා. මුද්‍රණය කර ගැනීමේ පහසුකම් තියෙන ගුරුවරු ඔන්ලයින් අධ්‍යාපනයෙ තියෙන දුෂ්කරතා මගහරවා ගැනීමේ ක්‍රමයක් ලෙස පාඩම් මුද්‍රණය කරලා සිසුන් අතර බෙදා දීලා තියෙනවා.

## මානසික සෞඛ්‍යය

මේ ගම්මානවල බොහෝ දෙනෙක් පවතින ආර්ථික සහ ජීවනෝපාය ගැටළු නිසා මානසික පීඩනයට ලක්වෙලා ඉන්නෙ. සාමාන්‍යයෙන් ගැමියෝ එකට එකතුවෙලා කරන වැඩවලදි හරිම සාමූහිකව කථාබහ කරමින් වැඩකරන්නෙ; ඒත් ඒ අයට ඒ සඳහා එතරම් ඉඩක් ලැබුණේ නැහැ.

## ගෘහස්ථ හිංසනය

මිනිස්සු ඔවුන්ගෙ ගෘහ ජීවිතය තුළ සිරවී සිටින නිසා යම් යම් ගැටළු ඇතිවෙලා තියෙනවා. ආරක්ෂක තත්වය නිසා මත්ද්‍රව්‍ය භාවිතයත් සීමාසහිත වෙලා තියෙන්නෙ, ඒත් සමහරු මත්පැන් පානය කරනවා. සමහර විට එය ස්වාමිපුරුෂයා සහ භාර්යාව අතර අඬදබර ඇතිවෙන්නත් හේතුවෙලා තියෙනවා.

## පරිසරය

වනාන්තර විනාශ කිරීමට සම්බන්ධ සිද්ධීන් කිහිපයකුත් තිබුණා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයෙක් යම් ඉදිකිරීම් කටයුත්තක් සඳහා එම දැව යොදා ගැනීමේ සිද්ධියකට සම්බන්ධ වෙලා තිබුණා; ඒත් පස්සෙ ගමේ අය බලධාරීන්ට පැමිණිලි කරල ඒ ගැන නීතිමය පියවර ගෙන තිබුණා. නිධන් හෑරීමේ සිද්ධීන් කිහිපයකුත් සිදුවෙලා තියෙනවා.

## වැරදි තොරතුරු ප්‍රචාරය වීම

කෙනෙකුට යම් ප්‍රවෘත්තියක් දැනගන්න ලැබුණට පස්සෙ එයා එක්වරම ඒ ගැන ක්‍රියාමාර්ගයක් ගන්නෙ නැතිව අන් අයගෙන් අහල ඒක තහවුරු කර ගන්න උත්සාහ කරනවා. වසංගත කාලයට පෙර සිට ම ලිංගික හිංසනයන් සම්බන්ධ බොහෝ සිදුවීම් වාර්තා වෙලා තියෙනවා. ප්‍රධාන ම ප්‍රශ්නය තමයි මිනිසුන්ට වැඩි අවබෝධයක් නොමැතිකම සහ කිසිවකු පැමිණිලි නොකර සිටීම. ඒක සාමූහිකව එකතුවෙලා වෙනස් කළ යුතු දෙයක්. ගමේ සමහර සංගම් මේ පිළිබඳව පවුල් සෞඛ්‍ය නිලධාරීන්ටත් පොලිසියටත් දැනුම් දීලා තියෙනවා, ඒත් ගමේ තියෙන මෙවැනි ප්‍රවණතා වෙනස් කරන්න කවුරුවත් පියවර ගෙන නැහැ.




*රූපසටහනේ මූලාශ්‍රය: ගරදමබාඩසැඅි*

## ධනාත්මක හැඩගැසීම්

ගෙවතු වගාව වැඩිවීම ධනාත්මක හැඩගැසීමක්. මිනිස්සු බොහෝ විට ගෙදර ම සිටින නිසා ඒ අයට ඒකට වෙලාව තියෙනවා. මේ හැඩගැසීම නිසා මේ පැත්තේ පවුල්වලට ආහාර හිඟයක් ඇති වුණේ නැහැ.

## වෙනත් අදහස්

හදිසියේ ම රසායනික පොහොර තහනම් කළ නිසා කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ ගැටළු රාශියක් ඇතිවී තිබෙනවා. ගොවිතැනට අවශ්‍ය ජලය නොලැබීම නිසා ප්‍රශ්න ඇති වුණා. මේ තියෙන වාතාවරණය තුළ කෘෂිකර්මාන්තය සහ අනෙකුත් ජීවනෝපායන්

වැඩිදියුණු කිරීම සඳහා ලබා දෙන ඕනෑම සහයෝගයක් ඉතාමත් වැදගත් වෙනවා.

## පස්වන සම්මුඛ සාකච්ඡාව

**අනුරාධපුර, කැකිරාව ප්‍රදේශයේ ජීවත් වන, දෛනික වැටුප ලබන කම්කරුවෙක් ලෙස සේවය කරන, දරුවන් දෙදෙනෙකු සිටින වයස අවුරුදු 42 ක් වූ කාන්තාවක් සමග මෙම සම්මුඛ සාකච්ඡාව පවත්වන ලදී.**

**වසංගතය පිළිබඳ ඔබගේ අත්දැකීම කුමක්ද සහ එය ඔබගේ ජීවන රටාවන් වෙනස් කර ඇත්තේ කෙසේද?**

මමයි මගේ මහත්තයයි දවසෙ කුලියට වැඩ කරල ජීවත් වෙන්නෙ. අපේ ලොකු පුතා පාසල් අධ්‍යාපනය අවසන් කරලා වෘත්තීය පුහුණු පාඨමාලාවක් හදාරමින් ඉන්නෙ; අනිත් පුතා පහ ශ්‍රේණියේ. ඒත් වසංගතය නිසා අපිට වැඩට යන්න බැරි වුණා. මේ කාලය තුළ අපිට ආදායම් නොලැබුණු නිසා විශාල පාඩුවක් විඳගන්න සිද්ධ වුණා. අතර අපි වැඩිපුරම කළේ ගෙවත්තෙ වගා කරන එක. අපි බෝංචි, මඤ්ඤොක්කා, බණ්ඩක්කා, වම්බටු සහ තවත් බෝග වර්ග කිහිපයක් වගා කළා. අපිට එම භෝග වල අස්වැන්නෙන් අපගේ ආහාර අවශ්‍යතා බොහොමයක් පියවා ගන්න පුළුවන් වුණා. ඒ හැරෙන්නට අපිට ලැබුණු "සමෘද්ධි" දීමනාව හැර වෙනත් කිසිම ආදායමක් තිබුණේ නැහැ. "සවිත්‍රි" කියන රාජ්‍ය නොවන සංවිධානයත් මැයි මාසයේ දී අපිට සලාක මල්ලක් ලබා දුන්නා. අපිට ඔන්ලයින් අධ්‍යාපනය සඳහා පහසුකම් නොතිබුණු නිසා මගේ බාල පුතාගේ අධ්‍යාපන කටයුතු අඩාල වුණා.

### ජීවනෝපාය

අපේ ගම බොහෝ පිටිසර ගමක්. යුද්දෙ තිබුණු කාලේ ගම්මු මෙහි පදිංචි වුණා. රජය අපි හැමෝටම ඉඩම් දීලා තියෙනවා. මහා පරිමාණයෙන් ගොවිතැන් කරන්න තරම් ලොකු ඉඩම් කාටවත් නැහැ. මේ වන විට එක ඉඩම් කොටසක පවුල් තුන හතරක් ජීවත් වෙනවා. ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ගෙවතු වගාව, එළවළු භෝග සහ පළතුරු වගාවට අනුගත වෙලා ඉන්නෙ. ඒ වගේම තවත් සමහර අය මැහුම්, අත්කම් භාණ්ඩ විකිණීම වැනි කුඩා ස්වයං රැකියාවල නිරත වී ඉන්නවා. ගඩොල් හදන්න අවශ්‍ය මැටි, ඒකට සුදුසු පස් වැනි අමුද්‍රව්‍ය මෙහෙ තියෙන නිසා සමහර අය ගඩොල් හදන්න පටන් අරන් තියෙනවා. බොහෝ විට ඔවුන් විකුණන්නේ පුළුස්සා නැති, වේලන ලද ගඩොල්. තවත් සමහර අය ඇණවුම් වලට සිමෙන්ති බ්ලොක් ගල් හදනවා. ඒත් මේ සීමා පනවා තිබෙන තත්ත්වයන් යටතේ ඒවා ප්‍රවාහනය කිරීම සහ විකිණීම අපහසු වෙලා තියෙන නිසා මෙම කටයුතු සාර්ථකව කරගන්න අපහසු වෙලා තියෙනවා. විශාල වශයෙන් ආදායම් අහිමිවීම නිසා අපේ ජීවනෝපායන්ට දැඩි බලපෑමක් එල්ල වෙලා තියෙන්නෙ.

### රජයෙන් ලැබෙන සහයෝගය

ගිය අවුරුද්දේ අපිට රුපියල් 5,000 ක සමෘද්ධි දීමනාවක් ලැබුණා. ඒත් මේ අවුරුද්දේ ඒක අඩු කරලා, අපිට රුපියල් 3,000 යි ලැබුණේ. තවත් සමහර සමෘද්ධි ප්‍රතිලාභීන්ට අඩු ආදායම්ලාභී පවුල්වලට ලබා දෙන රුපියල් 5,000 ක මුදල ලැබුණා. සමහර ප්‍රාදේශීය දේශපාලනඥයින් මෙම වැඩසටහන්වලට බලපෑම් කරනවා. එයාලගේ සමහර ආධාරකරුවන්ට සුදුසුකම් නොතිබුණත් මේ ආධාර ලබා දුන්නා. ග්‍රාම නිලධාරී සහ අනෙකුත් නිලධාරීන් ඒ පිළිබඳ සමහර පවුල් නිසි ලෙස දැනුවත් නොකරපු නිසා පවුල් කිහිපයකට එය ලබා ගන්නත් බැරි වුණා.

### සෞඛ්‍ය අංශයෙන් ලැබන සහාය

මේ කාලය තුළ සෞඛ්‍ය බලධාරීන් අපට හොඳින් සහයෝගය ලබා දුන්නා. මේ ළඟ තියෙන ගමක කිහිප දෙනෙකුට ආසාදනය වුණා. ඒ ආසාදිත පුද්ගලයින්ගේ සමීප ආශ්‍රිතයන් වුණු ගම්වැසියන් 4 දෙනෙක්ව හඳුනා ගත්තා. ඉට පස්සෙ එයාලව නිරෝධායනය කරන්න සිද්ධ වුණා. සෞඛ්‍ය නිලධාරීන් එයාලට අවශ්‍ය උපදෙස් ලබා දීලා, ඒ පවුල්වලට අත්‍යවශ්‍ය ද්‍රව්‍යත් බෙදා දුන්නා. ගමේ අනිත් අයත් එකට එකතුවෙලා එයාලට සහයෝගය දුන්නා. ග්‍රාම නිලධාරීවරයාගේ සම්බන්ධීකරණය යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එයාලට රු. 10,000 ක සලාක මල්ල ලබා දුන්නා. සෞඛ්‍ය නිලධාරීන් පී.සී.ආර්. පරීක්ෂණ සහ ඇන්ටිජන් පරීක්ෂණ කරන්න උදව් කළා.

### එන්නත්කරණය

එන්නත් කිරීමේ ක්‍රියාවලිය ත් හොඳින් පරිපාලනය කරල තිබුණා. මේ වන විට ගමේ අවුරුදු 30 ට වැඩි පුද්ගලයින් ගෙන් 90% ක් ම සම්පූර්ණයෙන් එන්නත් කරල තියෙන්නෙ. එන්නත් කිරීමේ ක්‍රියාවලිය පිළිබඳව ගමේ දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයකුත් පැවැත්වුණා. ඒ වගේම, එන්නත්කරණ මධ්‍යස්ථානවලදීත් ඔවුන් වැඩි වේලාවක් ගන්නෙ නැතිව, කලබලයක් ඇති නොවෙන විදියට හොඳින් පරිපාලනය කරලා තිබුණා. මුලදි නම් එන්නත ගැන යම් යම් සැකයන් ඇති වෙලා තිබුණා. සමහර අය ඒ ගැන කතා නොකර ඉන්න උත්සාහ කළා. ඒත් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වුවට පස්සෙ ඒ ගැටළු විසඳුණා. නිලධාරීන් ග්‍රාම නිලධාරී වසම් තුනක පුද්ගලයන් එකට එකතු කරල එන්නත් ලබාදීමේ වැඩසටහනක් හල්පිටිගම පාසලේදී පැවැත්වූවා.

## අධ්‍යාපනය



*පාසල් සිසුන් විවේක කාලයේදී එකට එක්වී යමක් නිරීක්ෂණය කිරීමෙහි නිරතව සිටිමින්, පන්නිපිටිය, කොළඹ, 2021*

අධ්‍යාපනය සම්පූර්ණයෙන් ම ඔන්ලයින් ක්‍රමයට මාරු වෙලා තියෙන්නෙ. මේ නිසා දුෂ්කරතා රාශියක් නිර්මාණයය වෙලා තියෙනවා. අවශ්‍ය තාක්ෂණික පහසුකම් නැති නිසා බහුතරයක් දෙනාට ඒකට ප්‍රවේශවෙන්න බැරිවෙල තියෙනවා. මේ ප්‍රදේශයේ අන්තර්ජාල සම්බන්ධතාවය ඉතාමත් දුර්වලයි. අපේ ප්‍රදේශයේ පවුල් වලින් බොහොමයකට ඩේටා සඳහා වියදම දරන්න බැරි නිසා ඔන්ලයින් අධ්‍යාපනයට ප්‍රවේශ වෙන්න බැරි වෙලා තියෙනවා. විශේෂයෙන් ම සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාගවලට පෙනී සිටින සිසුන්ට විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙන්න සිද්ධ වුණා. ඔවුන්ට විභාගෙට අවශ්‍ය පාඩම් සම්පූර්ණ කර ගන්න බැරි වුණා. ඔවුන්ට පොත්පත් සහ වෙනත් අධ්‍යාපනික ද්‍රව්‍ය සොයා ගැනීමටත් අපහසු වුණා. ඔවුන් කිසිවකුටවත් පුස්තකාලවලට ප්‍රවේශ වෙන්න ලැබුණෙවත් නැහැ. අධ්‍යාපන අමාත්‍යාංශයෙන්වත් අනෙකුත් අධ්‍යාපන නිලධාරීන්ගෙන්වත් කිසිම සහයෝගයක් ලැබුණෙත් නැහැ.

## මානසික සෞඛ්‍යය

අගුළු දමා තිබූ කාලය තුළදී මිනිසුන්ට බොහෝ මානසික පීඩාවන් ඇති වුණා. ඔවුන් ගෙන් බොහෝ දෙනෙකුට තමන්ගෙ ජීවනෝපාය අහිමි වෙලා, ඔවුන්ගේ දරුවන් ඔන්ලයින් අධ්‍යාපනය ලබා ගැනීම සම්බන්ධ දුෂ්කරතා රාශියකටත් මුහුණ දුන්නා.

## ගෘහස්ථ හිංසනය



*ඡායාරූප මූලාශ්‍රය: Colombo Gazette*

ප්‍රචණ්ඩත්වයේ යම් වැඩිවීමක්, විශේෂයෙන් ම පවුල් තුළ ප්‍රචණ්ඩත්වය ඉහළයාමක් දක්නට ලැබුණා. මෙයට ප්‍රධාන ම හේතුව වුණේ ජීවනෝපාය දුෂ්කරතා ඇතුළුව ඔවුන්ට ඇති වූ දුෂ්කරතා නිසා ඇති වූ පීඩනයයි. එසේම, සෑම පවුලක සියළුම සාමාජිකයින් නිවසේ රැඳී සිටියා - ඔවුන් කලින් සිටියාට බොහෝ සෙයින් වැඩි කාලයක් නිවසේ රැඳී සිටියා.

## ධනාත්මක හැඩගැසීම්

මේ කාලය තුළ ගම්වාසීන් සියලු දෙනා ම විවිධ ආකාර වලින් එකිනෙකාට උපකාර කළා. ගෙවතු වගාව ආරම්භ කිරීමත් සමග විවිධ පවුල් විවිධ භෝග වගා කරන්න පටන් ගත්තා. ඔවුන්ට ඒවායින් අස්වැන්න ලැබෙන විට ඔවුන් එම එළවළු, පළතුරු ආදිය තමන්ට නැති භාණ්ඩ සමග හුවමාරු කර ගන්න පටන් ගත්හ. ඔවුන් භාණ්ඩ හුවමාරු ක්‍රමය නැවත හඳුන්වා දෙන්න පටන් ගත්තා. මිනිස්සු ක්‍රියාශීලීව ගෙවතු වගාවෙ නිරත වෙමින්, තමන්ගෙ ගෙවත්තේ තමන්ට හැකි සෑම දෙයක් ම වවන්න උත්සාහ කළා.

## හයවන සම්මුඛ සාකච්ඡාව

**අනුරාධපුර ප්‍රදේශයේ ජීවත්වන ප්‍රජා ක්‍රියාකාරිනියක් සහ වගාකරන්නියක් වන, සිංහල ප්‍රජාවට අයත් වයස අවුරුදු 61 ක කාන්තාවක සමග මෙම සම්මුඛ සාකච්ඡාව සිදු කරන ලදී.**

**වසංගතය පිළිබඳ ඔබගේ අත්දැකීම කුමක්ද සහ එය ඔබගේ ජීවන රටාවන් වෙනස් කර ඇත්තේ කෙසේද?**

මගේ පවුලේ හැම දෙනාට වගේම ගමේ අනිත් අයටත් ඒක දුෂ්කර කාලයක් වුණා. අපේ ජීවනෝපාය වලට බොහෝ අවහිරතා ඇති වුණා. දුන් මිනිසුන්ගේ මූල්‍ය තත්ත්වය හොඳ නැහැ. අපේ පවුලේ පස් දෙනෙක් ඉන්නවා. මගේ මහත්තයා වඩු කාර්මිකයෙක්. එයා කොළඹ පදිංචිවෙලා ඉඳන් එහෙ වැඩ කරමින් හිටියෙ. ඒත් අගුළු දැමීම හේතුවෙන් එයාට 2020 අප්‍රේල් මාසයේ දී නැවත ගමට එන්න සිද්ධ වුණු නිසා එයාගේ ආදායම අහිමි වුණා. ආපහු ගමට ආවට පස්සෙ එයා ප්‍රධාන වශයෙන් ම ගෙවතු වගාවෙ සහ කෘෂිකාර්මික කටයුතුවල නිරත වෙලා ඉන්නවා.

මට පුත්තු දෙන්නෙකුයි දුවෙකුයි ඉන්නවා. ඒ හැමෝම විවාහ වෙලා ඉන්නෙ. එක්කෙනෙක් අපිත් එක්ක ජීවත් වෙනවා. මම ගෙවත්තේ බෝග වගා කරන වැඩවලට සම්බන්ධ වෙලා හිටියෙ. අපි ඒකෙන් ලබා ගන්න අස්වැන්න අනුරාධපුරේ පොළට ගෙනිහින් විකුණලා හොඳ ආදායමක් උපයා ගත්තා. ඒත් කොවිඩ් වසංගතය ආවට පස්සෙ අපිට ඒ අවස්ථාව නැතිවෙලා ආදායම අහිමි වුණා.

## ජීවනෝපාය

ඔවුන් ගෙන් බොහෝ දෙනෙක් තමන්ට වැඩි මුදලක් උපයා ගත හැකි අලුත් දේවල් කරන්න උත්සාහ කළා. ගිය අවුරුද්දේ පළමුවෙනි ලොක්ඩවුන් එක ඉවරවුනාට

පස්සේ මම පොඩි කොළකෑද කඩයක් පටන් ගත්තා. මම උදේට කුරක්කන් කැඳ, කොළ කැඳ, සව් කැඳ ආදී දේවල් විකුණුවා. මම රජයේ සහ අනෙකුත් කාර්යාල සේවකයින්ගෙන් අමතර ඇණවුම් ලබා ගෙන සෑහෙන මුදලක් උපයා ගත්තා. දැන් නම් ඒ ව්‍යාපාරය කරගෙන යන්නත් ටිකක් අමාරුයි. මම ඉස්සර කුඩා කුළුබඩු කඩයක් පවත්වාගෙන ගියා - ඒකෙ ප්‍රධාන වශයෙන් ම ගම්මිරිස්, කුරුඳු, කුරක්කන් සහ කරදමුංගු තමයි විකුණුවේ. ඒ වගේම මම ඉස්සර තල කැරලිත් හදලා විකුණුවා. කාන්තාවෝ තවත් බොහෝ දෙනෙක් මෙවැනි කුඩා ව්‍යාපාර සමග සම්බන්ධ වෙලා ඉන්නවා. මේ සියල්ල ම ගමේ කාන්තාවෝ තමන් විසින් ම ආරම්භ කරන ලද උත්සාහයන්.

## රජයෙන් ලැබුණු සහාය

සමෘද්ධි ණය ලබා ගැනීමේ අවස්ථාවක් තිබුණා, ඒත් ඒ හැරෙන්නට, අනෙක් ආධාරක වැඩසටහන් වලින් බොහොමයක් දේශපාලන බලපෑම් තියෙන අයට පක්ෂපාතී ඒවා. දේශපාලකයෝ උදව් කරන්නේ තමන්ගේ ආධාරකරුවන්ට විතරයි. ඒක හරියට දේශපාලකයින්ට සම්බන්ධකම් තියෙන අයට රැකියා අවස්ථා ලබා දෙනවා හා සමාන වැඩක් තමයි. රුපියල් 5,000 ක සහනාධාරය ලබා දුන්නේ දැනටමත් සමෘද්ධි සහනාධාරය ලබන පුද්ගලයින් සඳහා පමණයි. අනෙක් අයට ඒක ලැබුණේ නැහැ. මෙම වැඩපිළිවෙළ යටතේ රුපියල් 5,000 ක දීමනාව ලබා ගත් සමහර පුද්ගලයින් වර්තමානයේ පවතින වාතාවරණය තුළ අනෙක් අය හා සසඳන විට හොඳ ආදායම් මට්ටමක් තිබෙන පුද්ගලයින්. තවත් බොහෝ අසරණ මිනිසුන්ට කිසිම දෙයක් ලැබුණේ නැහැ. මේ කාලය තුළ අපිට සමෘද්ධි රුපියල් 5,000 ක දීමනාව මේ දක්වා දෙපාරක් ලැබිලා තියෙනවා. එකක් 2020 අවුරුද්දේ ලැබුණේ, අනෙක 2021 අවුරුද්දෙ පහුගිය මැයි මාසෙ ලැබුණේ.

අනෙක් රුපියල් 5,000 සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ආධාර ලබා දුන්නේ අඩු ආදායම්ලාභීන්ටයි. අපේ ගමේ සමහර අයටත් ඒක ලැබුණා.

## නීතිය හා සාමය



*කොළඹ, වැල්ලවත්ත ප්‍රදේශයේ සනීපාරක්ෂක කම්කරුවන්*

සාමාන්‍යයෙන් ජනතාව ගෙන් බොහෝ දෙනෙක් සෞඛ්‍ය නියමයන් අනුගමනය කළා, ඒත් අගුළු දැමීම් මිනිසුන්ගේ ජීවනෝපාය සහ ආදායම කෙරෙහි විශාල බලපෑමක් එල්ල කළා. අපිට අපේ අස්වැන්න විකුණා ගන්නත්, අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය මිලදී ගන්නත් දුෂ්කරතා රාශියකට මුහුණ දෙන්න වෙනවා. අප ගැන කවුරුවත් සලකා බැලුවෙ නැහැ. සමස්තයක් විදියට ගත්තහම, මේ තත්ත්වය කළමනාකරණය කර ගන්න නිසි සැලැස්මක් තිබුණෙ නැති නිසා එය බිම් මට්ටමේ දුප්පත් ජනතාවට බලපෑවා.

## සෞඛ්‍ය අංශයෙන් ලැබුණු සහාය

එක සිද්ධියක් තිබුණා ගෙදරක බණ පිංකමක් තිබිලා, දානයක් දීපු සිද්ධියක්. මේකට සෙනග ගොඩක් එකතු වෙලා, ඒත් සෞඛ්‍ය නීති පිළිපැදලා නැහැ. මේ ගැන කවුරුවත් සොයා බලා නැහැ. මේ ගැන හොයල බලන්න මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් කිසිවෙක් ඇවිල්ලා නැහැ. අපි 1990 ට දැනුම් දුන්න, ඒත් කවුරුවත් ආවේ නැහැ. මේකට සහභාගි වුණු හැමෝට ම ඇන්ටිජන් පරීක්ෂණ හෝ පී.සී.ආර්. පරීක්ෂණ කරන්න විදියක් නැහැ. මේක සිද්ධ වෙලා දැන් දින 8 ක් වෙනවා, ඒත් තවමත් මේ ගැන හොයලා බලන්න කවුරුවත් ආවෙ නැහැ.

මීට පෙර කොවිඩ් රෝගීන්ගේ සමීප ආශ්‍රිතයින් කියල හඳුනාගත්ත අය හුදකලා කරන්න රජයෙන් සහාය දුන්නා. ඒ දවස්වල ඒ හැමෝටම ගමේ අය උදව් කළා.

## එන්නත්කරණය

එන්නත්කරණ වැඩපිළිවෙල ක්‍රියාත්මක කිරීම හොඳින් සිද්ධ වුණා. ඒක සාර්ථකව පරිපාලනය කරලා, මේ වන විට වයස අවුරුදු 30 සහ එයට වැඩි පුද්ගලයින් ගෙන් බහුතරයකට අවම වශයෙන් එක් මාත්‍රාවක්වත් ලබා දීලා තියෙන්නෙ. අවුරුදු 60 ට වැඩි පුද්ගලයින්ට මාත්‍රා දෙක ම ලබා දීලා තියෙන්නෙ. මෙයට පෙර සමහර වයස්ගත පුද්ගලයින්ට එන්නත් කිරීම ගැන හොඳ ආකල්පයක් තිබුණෙ නැහැ. නමුත් සෞඛ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් ම පැවැත්වූවා.

## ප්‍රජා සංගම්

වසංගතයට පෙර හොඳ ක්‍රියාමාර්ග කිහිපයක් ම තිබුණා. ගමේ කාන්තාවො 15 දෙනෙකු අතරේ ඉතිරි කිරීමේ වැඩසටහනක් පටන් ගන්න අපට පුළුවන් වුණා. දැන් අපිට සෑහෙන ඉතුරුම් ප්‍රමාණයක් තියෙනවා. ඉතින් මේ කාලය තුළදී අපි අපේ මේ කාන්තා එකමුතුව හරහා ණය වැඩසටහනක් ආරම්භ කරලා, ඒ ඉතිරිකිරීම් වලින් කෙටි කාලයක් සඳහා අඩු පොළී අනුපාතවලට ණය ලබා දුන්නා. මේ දක්වා ම එම වැඩසටහන හොඳින් ක්‍රියාත්මක වෙලා තිබෙන නිසා, ඒක පුළුල් කරල තවත් පියවරක් සම්පූර්ණ කරන්නයි අපි උත්සාහ කරමින් ඉන්නෙ.

## ධනාත්මක හැඩගැසීම්

අපි දුෂ්කරතා මැද ජීවත් වෙන මේ කාලෙ ගෙවතු වගාව වැඩි වුණා. ගිය අවුරුද්දෙදි වසංගතයට පෙර ගොවිජන සේවා අධිකාරිය වැඩසටහනකුත් ක්‍රියාත්මක කළා. ඒ වගේම තවත් බොහෝ දෙනෙක් අත්කම් භාණ්ඩ සෑදීම වැනි කුඩා ස්වයං රැකියාත් ආරම්භ කළා. ගම්වැසියො බොහෝ දෙනෙක් ටික කාලයක සිට

කාබනික කෘෂිකර්මාන්තයේ යෙදී සිටියා. ඒ නිසා හදිසියේ ම රසායනික පොහොර තහනම් කිරීම ඒ අයට එතරම් බලපෑවෙ නැහැ. විශේෂයෙන් ම මධ්‍යම හා කුඩා මට්ටමේ ගොවීන්ට ඒතරම් බලපෑමක් ඇති කළේ නැහැ. ඒත් මහා පරිමාණයෙන් වගා කරන ගොවීන්ට, විශේෂයෙන් ම වී වගා කරන ගෙවීන්ට ඒක ලොකු ප්‍රශ්නයක් වුණා.

ගැමියන් අතර සාමූහික දැනුවත්භාවය මේ කාල පරිච්ඡේදය තුළ ඇතිවූ ධනාත්මක දෙයක් ලෙස සැලකිය හැකියි.

## අධ්‍යාපනය

අධ්‍යාපන ක්ෂේත්‍රය නම් සම්පූර්ණයෙන් ම කඩා වැටිල තියෙන්නේ. මගේ දුවගේ ලොකු පුතා ඉන්නේ ඉස්කෝලේ 7 ශ්‍රේණියේ. මේ දවස්වල අධ්‍යාපන කටයුතු සිදු කරන්නේ ප්‍රධාන වශයෙන් ම ඔන්ලයින් ක්‍රමයට. එයාලට දුරකථන සහ අනෙක් උපකරණ වර්ග නැහැ. මම ගොඩක් වෙලාවට මගේ ෆෝන් එක එයාට දෙනවා. ඒත් මම බොහෝ ප්‍රජා ක්‍රියාකාරකම් කරනවා - අපිටත් ඔන්ලයින් රැස්වීම් තියෙනවා. මේවා එකම වෙලාවල් වලට තියෙන විට ඒක ගැටළුවක් වෙනවා. අපිට සම්බන්ධතා සහ සංඥා ගැටළුත් ඇති වෙනවා. සමහර වෙලාවට වඩා හොඳින් සංඥා ලබා ගන්න අපිට ගොඩක් දුර යන්න සිද්ධ වෙනවා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ තියෙන දුෂ්කරතා වලට නිසි සැලැස්මක් හෝ විසඳුමක් නැහැ. පසුගිය වසරේ දී ගුරුවරු මුද්‍රිත සටහන් ලැයිස්තු සහ සටහන් සිසුන් වෙත යැවීමට යම් උත්සාහයක් දැරුවා. ඒ වගේම, සමහර ගුරුවරු වැඩ ලැයිස්තු උය්වීවච හරහා ළමයින්ට යවලා ඒ පිළිබඳ පසු විපරම් සිදු කළා, නමුත් ඒකත් හරියට කරගෙන යන්න බැරි වුණා. 2020 වර්ෂයේ මාර්තු මාසයේ සිට සිසුන් දුෂ්කරතාවලට මුහුණ දුන්න නිසා ඔවුන්ගේ දැනුමේ සහ ඉගෙනීමේ විශාල අඩුවක් තිබෙනවා. මෙම තත්වය මීළඟ ශිෂ්‍ය පරම්පරාවට ඉතා අහිතකර ලෙස බලපෑ හැකියි. සමහර ළමයි ඉගෙනීම අතහැරලා මොනවහරි රස්සාවක් කරන්න හදනවා. නමුත් සමහරු විශ්වවිද්‍යාල වලට යනවා. එයාලට ප්‍රශ්න නැහැ. එයාල නිසි පරිදි එයාලගේ වැඩ කරගෙන යනවා.

## ගෘහස්ථ හිංසනය

වසංගතයට සහ අගුලු දැමීම් වලට පෙරත් ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය ප්‍රශ්නයක් වෙලා තමයි තිබුණේ, ඒත් දැන් ඒක වැඩි වෙලා තියෙනවා. සමහරු සිය දිවි නසාගන්නත් උත්සාහ කළා, ඒත් අපි එකට එකතුවෙලා ඔවුන්ට උදව් කළා. ඒ වගේම මත්ද්‍රව්‍ය හා මත්පැන් භාවිතයත් වැඩිවෙලා තියෙන්නෙ.

## මානසික සෞඛ්‍යය

මෙම කාලය තුළ තරුණ තරුණියන් මානසික ගැටළු වලට මුහුණ දුන්නා. පවුල් සෞඛ්‍ය නිලධාරීන් මගපෙන්වීම් අවශ්‍ය සියලු දෙනාට ම උපකාර කළා. හිරිහැර කිරීම් පිළිබඳ සිද්ධීන් කිහිපයක් ද වාර්තා වුණා, අපි එකට එකතුවෙලා නීති සහාය ලබා ගත්තා.

## වෙනත් අදහස්

අදාළ ගැටළු විසඳන්න නම් රජයේ සහාය තිබිය යුතුයි. විශේෂයෙන් ම පොඩි මිනිස්සු සම්බන්ධයෙන් වන විට, රජයේ නොසැලකිලිමත්කම ඉතාම කණගාටුදායකයි. එයාල නාගරික ප්‍රදේශවල ජනතාව ගැන විතරයි හිතන්නේ, බිම් මට්ටමේ තියෙන යථා තත්වය ගැන කවුරුවත් දන්නේ නැහැ. ආණ්ඩුවේ ප්‍රතිචාරය ඉතා ම ගැටලු සහගත යි. ඔවුන් සියලු දෙනා ම ගමට එන්නේ ඡන්දෙ කාලෙට විතරයි.

## හත්වන සම්මුඛ සාකච්ඡාව

**අනුරාධපුර, ඉපලෝගම ප්‍රදේශයේ පදිංචි, සිංහල ප්‍රජාවට අයත් වගාකරන්නියක, දෛනික කුලියට වැඩකරන කම්කරුවෙකු සහ ප්‍රජා ක්‍රියාකාරිනියක ලෙස කටයුතු කරන, 52 හැවිරිදි කාන්තාවක සමග මෙම සම්මුඛ සාකච්ඡාව පවත්වන ලදී.**

**වසංගතය පිළිබඳ ඔබගේ අත්දැකීම කුමක්ද සහ එය ඔබගේ ජීවන රටාවන් වෙනස් කර ඇත්තේ කෙසේද?**

මම ඉපලෝගම ප්‍රදේශයේ ප්‍රජා කටයුතු වලට සම්බන්ධ වෙලා ඉන්නෙ. මම මේ ප්‍රදේශයේ තියෙන ප්‍රධාන ම කාන්තා සංගමයේ ලේකම්. මගේ දුව ගිය අවුරුද්දේ විශ්වවිද්‍යාලයට තේරුණා, දැන් අධ්‍යයන වාරෙ පටන් අරගෙන තියෙන්නෙ.



*අනුරාධපුර ප්‍රදේශයේ ගෙවිලියක්,*
*ඡායාරූපය: අමිල උඩගෙදර, 2021*

කොවිඩ් වසංගතය අපේ ප්‍රදේශයටත්, ජනතාවටත් දැඩි ලෙස බලපාලා තියෙනවා. මම ගමේ දවසේ කුලියට වැඩකරන කම්කරුවෙක් ලෙස රැකියාව කළේ, ඒත් මට දැන් එවැනි වැඩ ලැබෙන්නෙ නැහැ. අපේ ප්‍රදේශයේ ඉන්න කිහිප දෙනෙකුට ම ආසාදනය වුණා. ඔවුන් දැන් තියෙන අගුලු දැමීම් තත්වය යටතේ ඉන්නෙ, ඒක තරමක් අපහසු දෙයක්.

මීට පෙරත් අපේ ජීවිතවල බොහෝ දුක් කම්කටොළු තිබුණා, ඒත් අපි කවදාවත් මේ වගේ තත්වෙකට පත්වෙයි කියලා හිතුවෙ නැහැ. අපිට නම් ධෛර්යය තියෙන එක තමයි වැදගත් වෙන්නෙ. අපිට අපේ ජීවනෝපාය වලින් බොහොමයක් අහිමි වෙලා

තියෙන්නෙ. මේ තත්වය අපේ සෞඛ්‍යයටවත් ආර්ථිකයටවත් යහපත් නැහැ.

## ජීවනෝපාය



*අනුරාධපුරය ප්‍රදේශයේ ගෙවිලියන්,*
*ඡායාරූපය: අමිල උඩගෙදර, 2021*

අපේ ගමේ එදිනෙදා කුලී වැඩ කරන අය ගොඩක් ඉන්නවා. අපට මෙහෙ හොඳ ඉඩම්, දේපළ නැහැ. අපි එල්.ටී.ටී.ඊ. පාලන ප්‍රදේශයට ආසන්න මායිම් ගම්මානයක් ලෙස සලකපු ත්‍රිකුණාමලයේ මොරවැව ප්‍රදේශයේ ජීවත් වෙලා හිටියෙ. යුද්දෙ කාලෙ දී ඒ ප්‍රදේශවල ප්‍රචණ්ඩත්වය වැඩි වුණාට පස්සෙ රජයෙන් අපට ඉපලෝගමින් ඉඩම් දීපු නිසා අපි 1985 දී මෙහෙට ඇවිත් පදිංචි වුණා. අපිට ලොකු කුඹුරු නැහැ. අපිට වී වගාකරන්න ඕනැ නම් ඒක කරන්න වෙන්නේ 'අඳේට' කියන බදු ඉඩම් ක්‍රමයට. මේ ප්‍රදේශයේ සමහර අය හමුදාවේ සේවය කරනවා, ඒත් ගම්වැසියන් ගෙන් බහුතරයක් දෙනා දවස් කුලියට කම්කරුවන් ලෙස වැඩ කරන්නෙ. නමුත් දැන් මේ තත්වය යටතේ, කරන්න වැඩ තිබුණත් කවුරුවත් අපට වැඩ දෙන්නේ නැහැ. මෙහෙ මේසන් වැඩ, වඩු වැඩ කරන අයත් ගොඩක් ඉන්නවා, ඒත් මිනිස්සු ආසාදනය වෙයි කියන අවදානම නිසා ඒ අයටත් වැඩ ලබා දෙන්නේ ඉතාම කලාතුරකින්. මේ කාල සීමාව තුළ මිනිසුන්ට විශාල ලෙස ආදායම් අහිමි වෙලා තියෙන්නේ. ඒත් අපිට කොපමණ කාලයක් මේ විදියට කටයුතු කරගෙන යන්න වෙයිද කියලා අපි දන්නෙ නැහැ. අපි අතරින් බොහෝ දෙනෙක් ගෙවතු වගාවත්, එළවළු පළතුරු වැනි භෝග වගාවත් සිදු කරනවා. ඉස්සර අපි අපේ අස්වැන්නෙන් වැඩිපුර තියෙන ඒවා සති පොළට හරි ඉරිදා පොළට හරි ගෙනිහිල්ලා විකුණනවා. ඒත්, දැන් තියෙන අගුලු දැමීමත් එක්ක අපිට ඒක කරන්න බැහැ. ඒ ආදායමත් අපිට නැතිවෙලා තියෙන්නෙ. වගා වලින් වැඩි හරියක් සිදු කළේ කාබනික ක්‍රමයට.

## රජයෙන් ලැබුණු සහාය

අපට නිශ්චිත සහයෝගයක් ලබා දුන්නේ නැහැ. අපි ඉතුරු කර ගත්ත සල්ලි ටිකක් තිබුණා. ඒක තමයි අපිට උපකාර වුණේ. සමහර කාන්තා සංවිධාන අපට සහාය දුන්නා. අපි සාමාජිකයින් අතරෙ සලාක මල්ලක් බෙදා දුන්නා. අපිට ලැබුණු මූල්‍ය ආධාර වලින් කොටසක් වියදම් කරලා තමයි අපි ඒවා මිලදී ගත්තේ.

සමෘද්ධි දීමනාව ලැබුණේ එක පවුලකින් එක් අයෙකුට විතරයි. සමහර අය වකුගඩු රෝගීන්ට ලැබෙන දීමනාව සහ වැඩිහිටි දීමනාව වැනි වෙනත් සහනාධාර යෝජනා ක්‍රම වලට ප්‍රවේශ වුණා. ඒ සියලු ම ප්‍රතිලාභීන් සිටින පවුල්වලට එක් දීමනාවක් පමණයි ලැබුණේ.

වසංගතය ආරම්භයේ දී දේශපාලකයින් සහ නියෝජිතයින් යම් යම් ආකාර වල වැඩසටහන් ක්‍රියාත්මක කළා. එක් මන්ත්‍රීවරයෙක් අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය පාර්සලයක් බෙදා දෙන්න පටන් ගත්තා, ඒත් එක් වරක් බෙදා දුන්නට පස්සේ ඒක අයෙත් ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ වගේම, තවත් සීමා සහිත ක්‍රියාමාර්ග කිහිපයක් තිබුණා. ඒත් අවශ්‍යතා සහිත බොහෝ දෙනෙක් හිටියත්, ඔවුන්ට ඒ තරම් දෙයක් ලැබුණෙ නැහැ.

## සෞඛ්‍ය අංශයෙන් ලැබුණු සහාය

ඒ අය බොහෝ සෙයින් උපකාර කළා, විශේෂයෙන් ම ගම්වල දැනුවත්භාවය වැඩි කරන්න එයාලා බොහෝ උපකාර කළා. ගමේ ගෙදරක දානයක් දුන්න අවස්ථාවේ එක් සිදුවීමක් වුණා. ඒ දානෙ ගෙදරට ආපු එක් කෙනෙක් ආසාදිතයෙක් වෙලා හිටපු නිසා ඒක ලොකු අවුලකට හේතු වුණා. මා ඇතුළු තවත් බොහෝ දෙනෙකුට නිරෝධායනය වෙන්න සිද්ධ වුණා. තවත් පවුල් 5 ක් නිරෝධායනය කළා. අපට හැමෝම උදව් කළා, අත්‍යාවශ්‍ය අවශ්‍යතා සපුරා ගන්න සෞඛ්‍ය අංශයයි, ග්‍රාම නිලධාරීවරයයි, ගම්වාසීනුයි අපට උදව් කළා. අපිට රුපියල් 10,000 ක සලාක මල්ලකුත් ලැබුණා.

## එන්නත්කරණය

එන්නත් ලබාදීම හොඳින් පරිපාලනය කරලා තියෙනවා. කිසිදු තදබදයක් හෝ වෙනත් ප්‍රශ්නයක් තිබුණේ නැහැ. මුලදී සමහර අය එය ලබා ගන්න කැමති වුනේ නැහැ, ඒත් දැනුවත් කිරීම් වලින් පස්සෙ එයාලත් ගිහින් එන්නත විද ගත්තා.

## අධ්‍යාපනය

වර්තමාන තත්වය යටතේ වැඩියෙන් ම පීඩාවට පත්වී ඇති ප්‍රධාන ම ක්ෂේත්‍ර වලින් එකක් තමයි අධ්‍යාපන ක්ෂේත්‍රය. මගේ දුව විශ්වවිද්‍යාලයට තේරිලා ඉන්නෙ, එයාගේ විශ්වවිද්‍යාල කටයුතු වලින් වැඩි ප්‍රමාණයක් අන්තර්ජාලය හරහා යි සිදු කරන්නෙ. පාසල් යන ළමයිනුත් විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙනවා. ඔන්ලයින් අධ්‍යාපන ක්‍රමය හැම දෙනාට ම ඵලදායී ක්‍රමයක් නොවෙයි. ඔවුන්ට ඔන්ලයින් අධ්‍යාපනය අඛණ්ඩව සිදු කර ගෙන යාමට පහසුකම්, අවශ්‍ය උපකරණ වර්ග, මූල්‍ය සම්පත් ආදිය නැහැ. ඒ වගේම, මේ ප්‍රදේශයට අන්තර්ජාල ආවරණය සැහෙන්න දුර්වලයි. මේ දුරකථන සංවාදයේ යෙදෙන විටත් ඔබට සිදුවන බාධාවන් නිසා ඔබට ඒක දැනෙනවා ඇතැයි කියලා මම හිතනවා. දැන් වුණත් මම අන්තර්ජාල ආවරණය වඩා හොඳින් තියෙන තැනකට ඇවිල්ලා ඉන්නෙ. අපි හැමෝම දුරකථන ඇමතුම් ලබා ගන්න මෙමෙ ස්ථානය බහුලව භාවිතා කරනවා.




*යාපනය ඩෙල්ෆ්ට් දූපතේ පියෙක් තම දියණියව ප්‍රාථමික පාසලට රැගෙන යයි*

## වැරදි තොරතුරු ප්‍රචාරය

එන්නත් පිළිබඳව යම් යම් සැකයන් තිබෙන බවට කථා පැතිරිලා තිබුණා, ඒත් එන්නත්කරණ වැඩසටහන ක්‍රියාත්මක කරන විට සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමත් සමග එම සැකයන් දුරු වුණා.

## මානසික සෞඛ්‍යය

මම හිතන්නේ මිනිස්සු මානසික සෞඛ්‍ය ගැටලු රාශියකට මුහුණ දීලා තියෙනවා. විශේෂයෙන් ම ගම්වැසියන් බොහෝ දෙනෙකුට තමන්ගෙ ආදායම් මාර්ග අහිමි වූ නිසායි එවැනි ගැටළුවලට මුහුණ දීලා ඉන්නෙ. ඒකෙ ප්‍රතිඵලයක් විදියට ඔවුන් බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දෙමින්, බියට පත්වෙලා ඉන්නවා. පොදුවේ ගත්තහම, මිනිස්සුන්ට ගමන් බිමන් යාමේ නිදහස අහිමි වෙලා තියෙන්නෙ, ඔවුන්ට රැස්වීම සඳහා අවස්ථාවකුත් නැහැ. තරුණ පරම්පරාව ඔවුන්ට තිබෙන සීමිත අනාගත අවස්ථාවලට මුහුණ දෙන්න වෙහෙසෙමින් ඉන්නෙ. ඔවුන්ට තමන්ගෙ අනාගතය ගැන ඉතාමත් සැක සහිත යි.

## ධනාත්මක හැඩගැසීම්

හැම කෙනාම ගෙවතු වගා කරන්නයි, වවන්නයි පටන් අරගෙන තියෙන්නෙ. ඒ නිසා එයාලාට ආහාර හිගයකට මුහුණ දෙන්න සිද්ධ වෙන්නෙ නැහැ. හැමෝම එකිනෙකාට උදව් කර ගත්තා, තමන්ට වැඩිපුර තියෙන දේවල් තමන් ළඟ නැති දේවල් එක්ක හුවමාරු කර ගත්තා. අත්කම් භාණ්ඩ සෑදීම සහ අත්යන්ත්‍ර රෙදි නිෂ්පාදනය වැනි අනෙකුත් කුඩා කර්මාන්තවල වැඩිවීමක් සිදු වෙලා තියෙන්නෙ. ඔවුන් කලින් තමන්ගෙ නිෂ්පාදන අලෙවි කර ගත්තා, ඒත් අගුලු දැමීමත් සමග ඒ සඳහා තිබෙන අවකාශය හැකිළී ගිහින් තියෙන්නෙ.

## අටවන සම්මුඛ සාකච්ඡාව

**අනුරාධපුර ඉපලෝගම පදිංචි, ඇඟළුම් කම්හල් සේවිකාවක් සහ වගාකරන්නියක් වන 61 හැවිරිදි කාන්තාවක සමග මෙම සම්මුඛ සාකච්ඡාව සිදු කරන ලදී.**

**වසංගතය පිළිබඳ ඔබගේ අත්දැකීම කුමක්ද සහ එය ඔබගේ ජීවන රටාවන් වෙනස් කර ඇත්තේ කෙසේද?**

වසංගතය පටන් ගත්ත කාලෙදි මගේ මහත්තයාගෙ සහෝදරයාගේ පුතාට ආසාදනය වුණා. එයා නාවික හමුදාවේ සේවය කරන්නෙ, වැඩ කරමින් හිටියෙ කොළඹ. ඊට පස්සෙ එයාව නිරෝධායනය කරලා හිටියා. ඒක තමයි මේ රෝගය ගැන මට මුලින් ම ලැබුණු ඍජු අත්දැකීම.

මම නිරීක්ෂණය කළ තවත් දෙයක් තමයි මේ රෝගය බොහොමයක් මිනිස්සු ආසාදිතයින් දිහා වෙනස් ආකාරයකට බලන එක. මිනිස්සු ඔවුන් දිහා බලන ආකාරය වෙනස් කළා; ඔවුන් සමග එක්ව කටයුතු කරන්න කැමති වුණේ නැහැ. රෝගය පැතිරීමත් සමග සම්බන්ධතා රටාත් වෙනස් වෙලා තියෙන්නෙ. නිලධාරීනුත් එහෙමයි.

## ජීවනෝපාය



*යාපනය කරෙයිනගර් දූපතේ ධීවර ප්‍රජාව*

ජීවත්වීම ඉතාමත් දුෂ්කර වෙලා තියෙන්නෙ. අපිට රජයෙන් ප්‍රමාණවත් සහයෝගයක් ලැබුණෙ නැහැ. අපි ණය අරගෙන තියෙනවා; ඒවයේ පොළී ගොඩාක් වැඩි නිසා අපි ඒවා ගෙවන්න වෙරදරමින් ඉන්නෙ. මගේ දුවගේ මහත්තයා ලීසිං ක්‍රමයට වාහනයක් ගත්තා; ඒක ආපහු ගෙවන්නත් අපි වෙහෙසෙමින් ඉන්නෙ. අපි ඒක ගත්තෙ පොඩි ව්‍යාපාරයක් කරන්න, ඒත් ඒක නඩත්තු කරන්න අමාරු නිසා අපි ඒක හමුදාවට කුලියට දුන්නා. මගේ බෑනා ඉදිකිරීම් වැඩ කරමින් සිටියේ, ඒත් වසංගත තත්වය තුළ ඒවා කරගෙන යන්න බැරි වුණා. කොහොම වුණත්, අපේ ගෙවත්ත නිසා අපි ආහාර සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් කිසිම දුෂ්කරතාවකට මුහුණ දුන්නේ නැහැ.

## රජයෙන් ලැබුණු සහාය

අපට රුපියල් 5,000 ක සමෘද්ධි ප්‍රතිලාභ දීමනාව ලැබුණා. මේ ළඟ ගෙදරක එක්කෙනෙක් කොවිඩ් හැදිලා මැරුණා. ඒ කාලය තුළ නිරෝධායනය කරලා හිටපු පවුල්වලට රුපියල් 10,000 ක සලාක මල්ලක් ලබා දුන්නා. මගේ මහත්තයාගේ සහෝදරයාගේ පුතා නිරෝධායනය කරලා ඉන්න අවස්ථාවේත් අපිට රුපියල් 10,000 ක අත්‍යාවශ්‍ය සලාක බඩු මල්ලක් ලැබුණා. මේ ප්‍රදේශයේ සමෘද්ධි නිලධාරීන් සහ ග්‍රාම

සේවක එම සහාය සපයා දීම් හොඳින් පරිපාලනය කළා.

දේශපාලන නියෝජිතයින් ගෙන් (පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන්) කිසිම සහයෝගයක් ලැබුණේ නැහැ. ප්‍රාදේශීය සභාවේ සභාපති විතරයි අපිට උදව් කළේ, අපිව බලාගත්තේ.

**නීතිය හා සාමය**

මිනිස්සුන් ගෙන් බොහෝ උපදෙස් නිසි පරිදි පිළිපදින්නේ නැහැ. මම දකින විදියට ගොඩක් ඒවා අය ගණන් ගන්නේ නැහැ. දුෂ්කරතා තියෙනවා තමයි, ඒත් සියලු ම දෙනා මේක වගකීමක් ලෙස භාරගත යුතුයි. ලබා දෙන උපදෙස් පිළිපදින්න සෑම කෙනෙක්ම බැඳී සිටිය යුතුයි. සමහර අය ගමේ ඉන්න විට මුඛ ආවරණ දාගන්නේ නැහැ. මේ ආසන්නයේ කොවිඩ් හේතුවෙන් සිදු වුණු මරණ දෙකක් වාර්තා වෙලා තියෙනවා, ඒත් ඒ සම්බන්ධයෙන් මොනවත් ගැටළුවක් ඇතිවුණේ නැහැ.

**සෞඛ්‍ය අංශයෙන් ලැබුණු සහාය**

මේ ප්‍රදේශයේ සෞඛ්‍ය බලධාරීන්ගෙන් ලැබෙන සහයෝගය ඉතා අඩුයි. දැනුවත්කිරීම් සිදුකිරීම සම්බන්ධ බොහෝ ගැටලු ඇති වුණා. මේ ළඟ ගෙවල්වල මරණ දෙකක් සිදු වුණා. ඒ එක ගෙදරක මුලින්ම පොඩි දුවට ආසාදිත වෙලා, ඊට පස්සේ ලොකු දුවට බෝවෙලා එයා මැරුණා. ඊට පස්සෙ පී.එච්.අයි. මහත්තයා ඇවිල්ලා එයාලව නිරෝධායනය කළා. අපි ඒ අම්මව රෝහලට ගෙනියන්න 1990 ට කථා කළා. එයා රෝහලේ දී මිය ගියා. පී.එච්.අයි. මහත්තුරුත් හොඳින් ප්‍රතිචාර නොදැක්වූ අවස්ථා තියෙනවා. අපට ළඟින් ම තියෙන රෝහල තමයි ගමට කිලෝමීටර් 4 ක් දුරින් තියෙන කලාවැව රෝහල. අනෙක් රෝහල තියෙන්නෙ කිලෝමීටර 6 ක් දුරින් කැකිරාවේ.

**හමුදාකරණය**

අපේ එක පුතෙකුත් ඉන්නෙ හමුදාවේ. එයා කොමාන්ඩෝ බලකායේ ඉන්නේ. සෞඛ්‍ය නිලධාරීන්ගේ සහායත් සමග ඔවුන්ගෙන් ලැබෙන සහයෝගයත් අපි අගය කළ යුතුයි. ඔවුන් යුද්දෙ කාලෙදි බොහෝ කැපකිරීම් කරලා, දැන් මේ සෞඛ්‍ය අර්බුදයෙදිත් ඒ වගේම කැපකිරීම් කරනවා. හමුදාවේ බොහෝ දෙනෙකුට ආසාදනය වී ඇති බව මගේ පුතා මට කිව්වා. මගේ පුතාට ආසාදනය වුනාට පස්සේ මම එයාව විවේචනය කළ සමහර අය සමග වාද කළා. මේ සෞඛ්‍ය අර්බුදයේදීත් එයාලා ජනතාව වෙනුවෙන් ගන්නා උත්සාහය සහ කැපකිරීම් අපි පිළිගැනීමට ලක් කරනවා කියල මම එයාට කිව්වා. ජනතාවට ඕනෑ සුරක්ෂිත රටක්. මේකත් ඒකෙ කොටසක්. ඒක අපිටත් ඉතාම වේදනාකාරී යි.

**එන්නත්කරණය**

එන්නත්කරණ වැඩසටහන සිදුකෙරෙමින් පවතිනවා, වයස අවුරුදු 60 සහ එයට වැඩි පුද්ගලයින්ට දැන් මාත්‍රා දෙකම ලබා දීලා තියෙන්නේ. මටත් ලැබුණා. අපේ ගමේ පදිංචි වෙලා ඉන්න දෙන්නෙක් හිටියා, එයාලගේ ගම් ප්‍රදේශ ගලේවෙල සහ තංගල්ල. ඒත් ඒ දෙන්නට එන්නත දුන්නේ නැහැ. ගලේවල එක්කෙනා එයාගේ ගමට ගිහිල්ලා එන්නත ලබා ගත්තා. ඒත් තංගල්ලේ එක්කෙනා අවුරුදු 68 ක කෙනෙක්. එයාට එන්නත ගන්න එහෙට යන්න බැරිවුණා. ග්‍රාම නිලධාරීවරයා කිව්වා එන්නත ගන්න නම් එයාලා ඡන්ද ලැයිස්තුවට එයාලගේ නම් ඇතුළත් කරගන්න ඕනෑ කියලා, ඒත් අගුලු දැමීම් නිසා එයාලට ඒකට යොමු වෙන්න බැරිවුණා. ඒ දෙන්නත් අවුරුදු 60 ට වැඩි දෙන්නෙක් නිසා ඒ දෙන්නටත් එන්නත දෙන්න ඕනැ.

සමහරුන්ට එන්නත ගැන තියෙන සැක නිසා එන්නත ලබා ගැනීම ප්‍රතික්ෂේප කළා.

**අධ්‍යාපනය**

මේ අවට පාසල් යන ළමයි දහයකට පහළොවකට වඩා ඉන්නවා. හැකියාව තියෙන අය දුරකථනයක් අරගෙන ඔන්ලයින් අධ්‍යාපනය දිගටම කරගෙන යනවා, ඒත් බහුතරයක් දෙනාට ඒකට වියදම් දැරිය නොහැකි නිසා ඔවුන් නිකම්ම කාලය ගත කරනවා. මේ දවස්වල ළමයි බොහෝ විට ඔන්ලයින් ක්‍රමයට පවත්වන උපකාරක පන්ති වලට සහභාගී වෙනවා. ඒත් මේ ළඟ තියෙන කරබාව පාසලේ ඔන්ලයින් ඉගැන්වීම් සිදු කරන්නෙ නැහැ.

**පාරිසරික ගැටළු**

අපේ ගම තියෙන්නෙ ඓතිහාසික විජිතපුර බලකොටුව ආසන්නයේ. පුරාවිද්‍යාත්මක වටිනාකම් සහිත ස්ථාන රාශියක් තියෙන ගල්නිඳියාය කියලා ප්‍රදේශයක් තියෙනවා. ඒ ප්‍රදේශය අවට නිධන් හෑරීම සම්බන්ධ යම් යම් ගැටලු ඇති වුණා. ඊට පස්සෙ මිනිස්සු එකිනෙකාව සැක කරන්න පටන් අරන්, ඉඩමක වැසිකිළි කාණු පද්ධතියක් ඉදිකරන්න හැරුවත් තවත් බොහෝ ප්‍රශ්න ඇති වුණා. මේ ප්‍රශ්නය වසංගතයට පෙරත් තිබුණා. පහුගිය දවස් වල නිධන් හැරූ බවට සැකපිට පුද්ගලයින් හය දෙනෙකු අත්අඩංගුවට ගත්තා.

වනාන්තර විනාශ කිරීම සම්බන්ධයෙන් නම් විශේෂ ගැටළු ඇති වුණේ නැහැ, මොකද අපේ ගම අවට වනාන්තරයක් නැති නිසා. මිනිස්සු ගහක් කපන්න කලින් ග්‍රාම නිලධාරීගෙන් ඒකට අවසර ගන්නවා.

ඒත්, කසළ එකතු කිරීම සම්බන්ධයෙන් නම් ගැටලු ඇති වුණා. ගමේ මිනිස්සු මේ ළඟ තැනකට කුණු ගෙනත් දාන්න පුරුදුවෙලා හිටියෙ. පස්සෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මේ කුණු කොම්පෝස්ට් කරලා පොහොර නිෂ්පාදනය කරන්න වෙනත් වැඩපිළිවෙළක් ආරම්භ කළා.

**වැරදි තොරතුරු ප්‍රචාරය කිරීම**

ගමේ සිදුවුණු කොවිඩ් ආශ්‍රිත මරණ පිළිබඳව ගම්වාසීන් අතරෙ යම් යම් සැකයන් සහ වැරදි තොරතුරු ප්‍රචාරය වෙමින් තිබෙනවා.




### ගෘහස්ථ හිංසනය, මත්ද්‍රව්‍ය භාවිතය සහ වෙනත් ගැටළු

මත් ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ ගැටලු රාශියක් තිබෙනවා. මත් ද්‍රව්‍ය භාවිතය වැඩි වෙලා තියෙන්නෙ, ඒක දිගුකාලීන ගැටලුවක් බවට පත් වෙලා. පොලිසියට දැනුම් දුන්නත් වැඩක් වෙන්නෙ නැහැ. පොලිසිය ඔවුන්ට වක්‍රව සහයෝගය දෙනවා. ගම පුරාම කසිප්පු තියෙනවා. මිනිස්සු බීලා ගෙදර ඇවිල්ලා පවුලෙ ඉන්න අනෙක් අයත් එක්ක රණ්ඩු වෙනවා.

### ධනාත්මක හැඩගැසීම්

ගෙවතුවගාව සහ කාබනික ගොවිතැන වැඩි වීම ධනාත්මක දෙයක්. මමත් ඒකට සම්බන්ධ වෙලා ඉන්නේ. අපි යම් යම් ප්‍රශ්නවලට මුහුණ දෙනවා, ඒත් අපි ඒවා දිගටම කරගෙන යනවා.

ඒ වගේම අපි ප්‍රධාන වශයෙන්ම සාවිත්‍රි සංවිධානය හරහා විශාල ප්‍රජා සේවයක් ඉටු කළා. ඒත් අපිට ඒවා කරගෙන යද්දි දුෂ්කරතාවන්ට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. ගොඩක් වෙලාවට අපි දැන් ඒවා ඔන්ලයින් ක්‍රමයට තමයි කරගෙන යන්නෙ.

### වෙනත් අදහස්

පවතින ආර්ථික තත්ත්වය බොහෝ දුෂ්කරතා ඇති කරලා තියෙනවා. ජීවන වියදම් ඉතාමත් ඉහළ යි. අත්‍යවශ්‍ය ද්‍රව්‍ය රාශියක මිල ඉහළ ගිහින් තියෙන්නෙ - අර්තාපල්, සීනි, කිරි පිටි ඇතුළු බොහෝ දේවල් වල මිල ඉහළ ගිහින්. අපි මේ දේවල් දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුයි.

### නවවන සම්මුඛ සාකච්ඡාව

**මාතර, දෙනියායේ පදිංචි මලෙයියහ දෙමළ ප්‍රජාවට අයත් 24 හැවිරිදි තරුණයෙකු සමග මෙම සම්මුඛ සාකච්ඡාව සිදු කරන ලදී. ඔහු රැකියාවක් සොයමින් සිටින අයෙකු වේ.**

**වසංගතය පිළිබඳ ඔබගේ අත්දැකීම කුමක්ද සහ එය ඔබගේ ජීවන රටාවන් වෙනස් කර ඇත්තේ කෙසේද?**

කුමන වයස් කාණ්ඩයකට අයත් වුනත් සෑම කෙනෙක් ම දුෂ්කරතාවලට මුහුණ දෙනවා. මම කලින් රැකියාවක් කළා, ඒත් මට ඒක දිගට ම කරගෙන යන්න බැරි වුණා. මගේ වයසේ ම ඉන්න, ඒ කියන්නේ තවදුරටත් තමන්ගේ අධ්‍යාපන කටයුතු කරගෙන යා යුතු වයසේ ඉන්න තරුණ තරුණියන්ටත් දැන් තිබෙන තත්ත්වය තුළ කිසිම දෙයක් පටන් ගන්න බැරි වෙලා තියෙනවා. මේක යෞවනයින් විවිධ දේ අත්හදා බැලිය යුතු වයස වුණත්, දැන් විවිධ අවහිරතා තියෙන නිසා අපේ කාලය නිකම්ම නාස්ති වෙලා යනවා.

ගුවන්විදුලි මාධ්‍ය කලාවේ රැකියාවක් කරන්න මගේ හීනයක් තියෙනවා. ඒකට මට කොළඹ ගිහින් මගේ වෘත්තියේ ආයෝජනය කරන්න යමක් උපයා ගන්න ඕනෑ. කලින් මම මගේ රැකියාවෙන් යමක් උපයාගෙන ඒ සඳහා මුදලක් ඉතිරි කළා. ඒත් දැන් මට ඒක කරන්න විදියක් නැහැ. වෙනත් ආදායම් මාර්ගයකුත් නැහැ.

### ජීවනෝපාය



*හපුතලේ තේ වත්තක නෙලන ලද තේ දළු රැගෙන යන කම්කරුවෙක්, 2017*

මේ ප්‍රදේශයේ මිනිස්සුන් ගෙන් වැඩිදෙනෙක් වැවිලි අංශයේ වැඩ කරන්නේ. ඔවුන් තේ වගාවේ සෑම අංශයකට ම සම්බන්ධ වෙලා ඉන්නවා - වැඩිපුර ම කරන දේවල් තමයි තේ දළු නෙලීම, ප්‍රවාහනය, සහ වතු පරිපාලනය. මිනිසුන් ගෙන් 90% ක් ම තේ වගාවෙන් තමයි තමන්ගෙ ජීවිකාව උපයා ගන්නේ. මගේ පවුලේ අම්මයි, තාත්තයි, බාප්පලයි දවස් කුලියට වැඩ කරන අය. අපි ජීවත්වෙන්නෙ සහ අවශ්‍යතා කළමනාකරණය කරගන්නේ ඒ ආදායමෙන්. ඒ විදියට බැලුවහම, අපේ දවසේ ආදායම නැතිවෙන හැම දවසක්ම අපේ මුළු පවුලට ම බලපානවා. මගේ ආච්චියි සීයයි ගොඩක් වයසයි, එයාලට බෙහෙත් ඕනෑ. ඒවා කළමනාකරණය කර ගැනීමේ දී අපි දුෂ්කරතාවලට මුහුණ දෙනවා.

තවත් සමහර පවුල්වල යොවුන් වියේ කවුරුත් නැති නිසා එයාලා බොහෝ දුෂ්කරතාවලට මුහුණ දෙනවා, මොකද එයාලා වයසට ගියහම එයාලට තනිවම මොනවත් කර ගන්න බැරිවෙන නිසා. ඔවුන්ව රැක බලාගන්න කවුරුවත් නැහැ. තරුණ තරුණියන් දේවල් කළමනාකරණය කර ගන්න අඩු තරමේ යමක් උත්සාහ කරනවා.

### ආසාදන සහ මරණ

කොවිඩ් මරණ නම් කිසිවක් වාර්තා වුණේ නැහැ, ඒත් සමහර පුද්ගලයින්ට ආසාදනය වුණා. එයාලයි, එයාලගේ සමීප ආශ්‍රිතයිනුයි නිරෝධායනය කරන්න සිද්ධ වුණා. වතුකරයේ බොහෝ කම්කරුවන් ජීවත්

වෙන්නේ ලයින් කාමරවල (කුඩා වතු නිවාසවල). මේ නිවාස සීමිත ඉඩකඩක් තුළ, කුඩා කාමර වගේ එකිනෙකට ඉතා සමීපව පිහිටලා තියෙන්නේ. නවගම්මාන කියලා තැනක් තියෙනවා, එතැන විතරයි ගෙවල් අතරෙ ඇති තරම් ඉඩ තියෙන්නේ. අනෙක් තැන්වල එක් එක් නිවාසය අතරෙ අඩි දහයකවත් පරතරයක් නැහැ. මේ වගේ තත්ත්වයක් තුළ අපේ අල්ලපු ගෙදර කාටහරි නිරෝධායනය වෙන්න සිද්ධ වුණොත් අපිටත් කොහේවත් යන්න බැරි වෙනවා. මේ වන විට නිවාස නවයක් විතර නිරෝධායනයට ලක්කරලා තියෙන්නෙ. මමත් මුද්‍රණාලයක අර්ධකාලීන රැකියාවක් කරමින් හිටියෙ. ඒත් මේ නිවාස නවය ම නිරෝධායනයට ලක් කළාට පස්සේ මටත් වැඩට යන්න විදයක් තිබුණේ නැහැ. තවත් විශාල පිරිසක් මේ තත්ත්වයට මුහුණ දෙන නිසා ඔවුන්ටත් ආදායම් අහිමි වෙලා තියෙන්නෙ.

## රජයෙන් ලැබුණු සහාය

2020 අවුරුද්ද අග ලොක්ඩවුන් එක තිබුණ වෙලාවෙ ආණ්ඩුව අපට රුපියල් 5,000 ක දීමනාවක් බෙදා දුන්නා. ඒක හොඳට පරිපාලනය කරලා තිබුබා. ඒකට තේ වතුවල වතු අධිකාරීවරුන්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් වැනි බොහෝ දෙනෙක් උදව් කළා. මම දන්න විදියට මේ අයගෙන් 95% ක් විතර ම ඒ දීමනවා ලබා ගත්තා. මගේ සීයාට රුපියල් 2,000 ක දීමනාවක් ලැබුණා, ඒත් අපේ ගෙදරට ගෙවල් දෙකකට එහා පැත්තේ තවත් සීයා කෙනෙක් ඉන්නවා, එයාට ඒ දීමනාව ලැබුණෙ නැහැ. මම එයාලගෙන් ඇහුවම එයාලා කිව්වා ඒක පරිපාලනය කරන විදිය අනුව වර්ගීකරණය කිරීමේ යම් ක්‍රමයක් තියෙනවා කියලා. ඒත් මට ඒ කියපු දේ තේරුණේ නැහැ. අපේ ප්‍රදේශයේ දෙමළ ජනතාවට සමෘද්ධි ලැබුණේ නැහැ. අපි උත්සාහ කළා, ඒත් අපට ඒක ලබා ගන්න බැරි වුණා.

## නීතිය හා සාමය

මිනිසුන්ගෙන් බොහොමයක් දෙනා නීති රීති පිළිපදිනවා, ඒත් සමහර අය, විශේෂයෙන් ම තරුණයින් තැන් තැන්වල යනවා. අපේ ගමෙන් පිට අය අපිට ගොඩක් උදව් කළා. එයාලා අපිට ගොඩක් සහනාධාර ලබා දුන්නා. ගුරුවරු, විදුහල්පතිවරු, සමහර දේශපාලන නියෝජිතයො, හිතවතුන් වැනි බොහෝ දෙනෙක් ඔවුන්ට හැකි පමණින් අපට සහයෝගය ලබා දුන්නා. නිරෝධායන නීති උල්ලංඝණය කිරීම් සම්බන්ධ කිසිම ගැටළුවක් ඇති වුණේ නැහැ. හැමෝම අත්‍යාවශ්‍ය දේවල් එකතු කරගෙන ගෙදර හිටියා. ඒත් එයාලා මුඛ ආවරණ පළඳින එක, අත් පිරිසිදු කර ගන්න එක වගේ දේවල් හොඳින් අනුගමනය කළේ නැහැ. වගකීමක් ගන්නෙ නැතිව, මුඛ ආවරණ පළඳින්නේ නැතිව හිටපු ඕන තරම් මිනිස්සු මම දැක්කා.

## සෞඛ්‍ය අංශයෙන් ලැබුණු සහාය

එයාලා අපේ ගමට නම් හොඳට ම සහයෝගය දුන්නා. එයාලා හැම දෙනා ම කැපවීමෙන් වැඩ කළා. කවුරුහරි කෙනෙක්ව නිරෝධායනය කරන්න සිද්ධ වුණා නම්, එයාලා දවස් දෙකකට වරක් ඇවිල්ලා එයාගේ තත්වය පරීක්ෂා කරලා බලනවා. අපි එයාලගේ සහයෝගය අගය කරනවා. මගේ ගමේ නම් ඔවුන් මට හොඳින් සහයෝගය දුන්නා, ඒත් දෙනියායේ අනෙක් ප්‍රදේශ ගැන මම එතරම් දන්නේ නැහැ. ඒත් මම සමාජ මාධ්‍ය වල දැක්ක මිනිස්සු එයාලව අගය කරල තිබුණා.

## එන්නත්කරණය

බලධාරීන් එන්නත්කරණ වැඩසටහන පවත්වනා කියලා නිවේදනය කළා, ඊට පස්සෙ සයිනොෆාර්ම් එන්නත ලබා දුන්නා. ඔවුන් ඒක මුලින් ම ලබා දුන්නේ වයස අවුරුදු 60 සහ එයට වැඩි පුද්ගලයින්ට යි. ඔවුන් විශේෂ ඉල්ලීමක් මත ඒක දෙනියායේ වෘත්තීය සමිති සාමාජිකයින්ට ලබා දුන්නා. මගේ වයස අවුරුදු 24 යි. මමත් වෘත්තීය සමිතිය හරහා එන්නත ලබා දෙන ලෙස ඉල්ලීමක් කළා. මටත් මාත්‍රා දෙක ම විදලා තියෙන්නෙ. ප්‍රාදේශීය ලේකම්වරයාත් මේ ක්‍රියාවලියට සහාය දැක්වූවා. විශේෂිත ගැටළු නම් මොනවත් වාර්තා වුණේ නැහැ. සමහර අය එන්නත ලබා ගැනීම ප්‍රතික්ෂේප කළා, ඒත් පස්සෙ අපේ ප්‍රජාවේ අනෙක් අය එයාලට මග පෙන්වමින් එයාලව දැනුවත් කළා, ඒ වගේ ක්‍රියාමාර්ග වලින් පස්සෙ බොහෝ දෙනෙක් එන්නත ලබා ගත්තා.



*හම්බන්තොට, සූරියවැව ප්‍රදේශයේ කුඩා දරුවෙක් මුඛ ආවරණයක් පැළඳ*

## අධ්‍යාපනය

කොවිඩ් වසංගතය අධ්‍යාපනයට විශාල වශයෙන් බලපෑවා, අධ්‍යාපනයේ ප්‍රමිතිය බිංදුවට ම බැහැල තියෙන්නෙ. මගේ මල්ලි පහේ ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටිනවා. එයාට ඔන්ලයින් පංතිවලට ඉන්න සිදු වුණා, ඒත් ඒක සාර්ථක නැහැ. ඒක පන්ති කාමරයක ඉඳන් ලබන අධ්‍යාපනයට සමාන නැහැ. ඔන්ලයින් පංතියට වෙන් කරලා තියෙන කාලය ඇතුළත ගුරුවරුන්ට බැහැ ළමයින්ට කරුණු අවබෝධ කරල දෙන්න. මල්ලිට ඔන්ලයින් ක්‍රමය එපා වෙලා ඉන්නෙ. අපිට ළමයින්ට බල කරන්න බහැ. එයාලාට උගන්වන්න තියෙන ක්‍රම, එහෙම නැත්නම් පවුලේ අය ගෙන් එයාලාට උපකාර ලබා දෙන්න තියෙන ක්‍රම ඉතා අල්පයි. ළමයින්ගෙන් බොහෝ දෙනෙකුට තමන්ගේ මූලික අධ්‍යාපනය අමතක වෙලා තියෙන්නෙ. එයාලාට පංති නැහැ, පුවත්පත් නැහැ, එයාලාට විභාගවලට පාඩම් කරන්න ඕනැ කියලා හිතෙන්නේ නැහැ. මේ ළමයින් ගෙන් බොහෝ දෙනෙකුට දුරකථන සහ වෙනත් පහසුකම් නැහැ. ඉස්සර මම මගේ ෆෝන් එක මල්ලිට දුන්න පාඩම්වලට ඉන්න. තවත් සමහර ළමයි

පහසුකම් හා උපකරණ නැති නිසා එයත් එක්ක එකතු වුණා. අවශ්‍ය උපකරණ ලබා ගන්නයි, ඩේටා වලටයි එයාලාට විශාල මුදලක් වැය කරන්න සිද්ධ වෙනවා .

මීට මාස දෙකකට පෙර ගුරුවරු අධ්‍යයන ද්‍රව්‍ය සහ විභාග ප්‍රශ්න පත්‍ර ළමයින් අතර බෙදා හැරියා. ඒත් දැන් ගුරුවරු වර්ජනය කරන නිසා ඒවා කරන්නේ නැහැ.

## වැරදි තොරතුරු ප්‍රචාරය

ආසාදනය වෙච්ච අය ගැන, ඒ අයගෙන් ආසාදනය බෝවුණු අය ගැන, ආසාදනය වෙච්ච නැති අය ගැන බොරු ප්‍රවෘත්ති විශාල ප්‍රමාණයක් පැතිරිලා තිබුණා. ඒවා කටකතා.



*වසංගත කාලය තුළ ජනමාධ්‍ය*

## මානසික සෞඛ්‍යය

බොහෝ අය ජීවත් වෙන්නේ පරාජිත මානසිකත්වයකින්. වැඩියෙන් ම පීඩාවට පත් වෙලා ඉන්නේ තරුණ පිරිස යි. මමත් බොහෝ දේවල් කරන්න උත්සාහ කළා, ඒත් කිසිවක් කර ගන්න බැරි වුණා. බොහෝ තරුණයින්ට තියෙන්නේ ඒ සමාන හැඟීමක්. සිද්ධ වෙමින් තියෙන්නෙ මොකක්ද කියලා ළමයින්ට තේරුම් ගන්න බැහැ. එයාලාට එයාලගේ ජීවිතයේ දඟකාර, විමසිලිමත් කාලය අහිමි වෙලා තියෙන්නේ. මගේ මල්ලිත් එහෙමයි. එයා ගෙදරට ම හිර වෙලා හිටිය නිසා බොහෝ වෙලාවට යාළුවොත් එක්ක සෙල්ලම් කරන්න බැරි වුණා. ප්‍රායෝගිකව, අත්දැකීමෙන් ඉගෙන ගන්න එක ළමයින්ගේ වයසට වැදගත් දෙයක්, ඒත් එයාලට ඒකට තියෙන කාලයත් අවස්ථාවත් නැති වුණා කියලයි මට හිතෙන්නේ. ඒක එයාලාගේ ජීවිතවල විශාල අඩුවක් සහ රික්තයක් ඇති කරාවි.

ළමයින්ගේ ජීවිතයේ ඒ පැත්ත සම්බන්ධයෙන් කවුරුවත් ඔවුන්ට සහයෝගය දැක්වූයේ නැහැ. යම් උපදේශනයක් සිදු කළා නම් ඒක එයාලට ප්‍රයෝජනවත් වෙන්න තිබුණා. අපට ගොඩක් උදව් ලැබුණත් ඒ උදව් ලැබුණෙ මේ වගේ පැති සම්බන්ධයෙන් නෙමෙයි. ඒ වගේම උදව් කරන්න හැකියාව තියෙන අයටත් ඒක කරන්න බැරි වුණා, මොකද එයාලත් බොහෝ දුෂ්කරතාවලට මුහුණ දුන්න නිසා. බොහෝ දෙනෙක් ෆේස්බුක්, වට්ස්ඇප් වගේ සමාජ මාධ්‍යවලට ඇබ්බැහි වෙලා ඉන්නෙ. ඒ අය උදේ ඉඳන් රෑ වෙනකම් ජංගම දුරකථන පාවිච්චි කරනවා. බැටරිය චාර්ජ් කර ගන්න ඕනැ වෙලාව වත් එයාලා දන්නේ නැහැ. සමහර අය තේ ෆැක්ටරියෙ වැඩට ගිහිල්ල, සල්ලි ටිකක් හොයාගෙන මිල අධික දුරකථන අරගෙන තියෙනවා. එයාලා මහන්සි වෙලා හම්බකරලා, වැඩකට නැති දේවල්වලට කාලය නාස්ති කරනවා. එයාලගෙ තාරුණ කාලෙ ගැන හිතලා බැලුවහම ඒක හරිම කණගාටුදායක තත්වයක්.

## ගෘහස්ථ හිංසනය, මත්ද්‍රව්‍ය භාවිතය සහ වෙනත් ගැටළු

ගැටළු කිහිපයක් තියෙනවා. තරුණයන් මත්පැන්වලට ඇබ්බැහි වෙලා. සමහර බාලවයස්කාර ළමයි පවා බොන්න පුරුදු වෙලා, බීඩි බොන්නත් පටන් අරන්.

තරුණයින් සහ ළමයින් බොහෝ දෙනෙක් ෆෝන් එකටත්, ෆෝන් එකේ ගේම්වලටත් ඇබ්බැහි වෙලා ඉන්නෙ. සමහර වෙලාවට මම කෙනෙකුට කතා කළොත් එයාට ඇහෙන්නේ නැහැ. එයාලා ඉන්නේ යථාර්ථයෙන් ඈත්ව වෙනත් ලෝකෙක. ඒක වැඩිවෙමින් පවතින ගැටළුවක් බවට පත්වෙමින් තියෙන්නෙ. එයාලා හොඳ දේවල් ගැන උනන්දුවක් නැහැ. ප්‍රශ්නෙ තියෙන්නෙ එයාලාට ඉස්කෝලෙ යන්නත් බැරිවෙලා තියෙන්නෙ. කවුරුවත් එයාලව අමතන්නේ නැති නිසා එයාලාට හුදකලා බවක් දැනෙනවා.

## ධනාත්මක හැඩගැසීම්

කොම්පෝස්ට් සෑදීම සහ ගෙවතු වගාව සම්බන්ධයෙන් යම් යම් ක්‍රියාමාර්ග ගෙන තිබෙනවා, ඒත් සමහරුන්ට වැස්ස සහ කාලගුණ විපර්යාස නිසා ඒවා කරගෙන යන්න බැරිවෙලා තියෙනවා. මම විනෝදාංශයක් විදියට පරවියන් ඇති කිරීම සහ මාළු ඇති කිරීම සිදු කළා. ඒත් දැන් අපි අමතර ආදායමක් උපයා ගත හැකි දේවල් තමයි පටන් ගන්නෙ.

## හමුදාකරණය

කොවිඩ් තත්වය පාලනය කිරීම අපි හැමෝගෙම වගකීමක්. අපිට දැන් ලොක්ඩවුන් එකක් පනවල තියෙන්නෙ, ඒත් කවුරුවත් ඒවා නිසි ලෙස පිළිපදින්නෙ නැහැ. මම දැන් දෙනියාය නගරයට ගියොත් මට දකින්න පුළුවන් මිනිස්සු බොහෝ දෙනෙක් තැන් තැන්වල ඇවිදිමින් ඉන්නවා. ජනතාව නිසි පරිදි නීති රීති පිළිපැදිය යුතුයි. සෞඛ්‍ය නිලධාරීන් සහ ආරක්ෂක නිලධාරීන් හරහා ඒක පරිපාලනය කරන්න වඩා හොඳ යාන්ත්‍රණයක් තියෙන්න ඕනෑ. මේකට වගකියන්න ඕනෑ  කවුද කියලා, අසාර්ථක වෙන්නේ කවුද කියලා මම දන්නෙ නැහැ.

ඉක්මනින් ම මේ තත්වය ජය ගන්න නම් අපි ඒක සාමූහිකව කරන්න ඕනෑ. ඒත් ඒක සිද්ධ වෙන්නෙ නැහැ. පසුගිය දවසක මම දැක්කා හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රකාශයක් කරමින් කියලා තිබුණා කොවිඩ් වසංගතය සෞඛ්‍ය නිලධාරීන්ට අදාළ කාරණයක් මිස හමුදාපතිවරයාට අදාළ ප්‍රශ්නයක් නෙමෙයි කියලා. ඒ කාරණය ඇත්තක්, මොකද සෞඛ්‍ය අර්බුදයක් කළමනාකරණය කරන්න තරම්

ප්‍රමාණවත් දැනුමක් ආරක්ෂක නිලධාරීන්ට තියෙනවද කියන එක ප්‍රශ්නයක්.

### වෙනත් අදහස්

මිනිසුන් තුළ තියෙන මානසික අවපීඩනයෙන් හා පරාජිත මානසිකත්වයෙන් ඔවුන්ව මුදවා ගැනීමට, විශේෂයෙන් ම තරුණ පරම්පරාව එම මානසිකත්වයෙන් මුදවා ගැනීමට විකල්ප උපාය මාර්ගයක් සලසනව නම් ඒක ඉතාමත් හොඳයි. මේක ඉතාමත් වැදගත් කාරණයක්. ඒ වගේම තරුණ පරම්පරාවට හොඳ මග පෙන්වීමකුත් අවශ්‍ය යි.

### දහවන සම්මුඛ සාකච්ඡාව

**මාතර, දෙනියාය ප්‍රදේශයේ පදිංචි සිංහල ප්‍රජාවට අයත්, ප්‍රාදේශීය කෘෂිකර්ම සංවිධානයක ක්ෂේත්‍ර නිලධාරිනියක් ලෙස සේවය කරන, වයස අවුරුදු 24 ක කාන්තාවක සමග මෙම සම්මුඛ සාකච්ඡාව සිදු කරන ලදී. එමෙන් ම, ඇය ශිෂ්‍යාවක් ද වේ.**

**වසංගතය පිළිබඳ ඔබගේ අත්දැකීම කුමක්ද සහ එය ඔබගේ ජීවන රටාවන් වෙනස් කර ඇත්තේ කෙසේද?**

මේක සිද්ධවෙන්න ඉස්සෙල්ල මම ප්‍රධාන වශයෙන් ම මගේ අධ්‍යාපනය කටයුතු වලට අවධානය යොමු කරමින් හිටියෙ, ඒත් මේ තත්වය බොහෝ දුෂ්කරතා ඇති කරලා තියෙනවා. මගේ ගම අවට ප්‍රදේශයේ ජීවත් වන තවත් බොහෝ දෙනෙකුටත් මේ තත්වය බලපාලා තියෙන්නේ ඒ විදියටමයි. මම පාසල් අධ්‍යාපනය අවසන් කරලා කෘෂිකර්මාන්තය දෙසට යොමුවෙලා ඉන්නේ. මම විශ්වවිද්‍යාලයකට ඇතුළත් වෙන්න බලා සිටින අතරතුර ඔන්ලයින් ක්‍රමයට තවත් අමතර පාඨමාලාවක් හදාරමින් ඉන්නෙ. මගේ ගෙදර තියෙන ප්‍රදේශයට අන්තර්ජාල සම්බන්ධතාවය නැහැ. සමහර වෙලාවට වෙන ගෙවල්වලට ගිහින් අපේ නෑදෑයොත් එක්ක ඉන්න වුණා.

### ජීවනෝපාය

මෙහෙ ඉන්න ගොඩක් අය තේ වතුවල හරි තේ ෆැක්ටරිවල හරි වැඩ කරන අය. ඒත් එයාලාගෙන් බොහෝ දෙනෙකුට දිනපතා වැඩට යන්න බැරිවුණා. වැඩ කරන විට සේවකයින් විශාල සංඛ්‍යාවක් එකට එක්වෙන එක සීමා කරන්න එම කර්මාන්තශාලාවල පරිපාලනය විසින් සේවා මුර ක්‍රමයකට අනුව වැඩ කිරීමේ ක්‍රමයක් ආරම්භ කළා. එකෙන් සේවකයින්ගේ වැටුප් අඩු කිරීමකුත් සිදුවුණා. ඉස්සර වැඩ කරන දින ගණනට අනුව වැටුප් ලබා ගත්ත මෙම සේවකයින්ට දැන් ෆැක්ටරියෙ ඔවුන් වැඩ කරන පැය ගණනට පමණයි වැටුප් ලැබෙන්නෙ.

වැවිලි අංශයේ ප්‍රශ්න රාශියක් තියෙනවා. තේ වතුවල වැඩ කරන බොහෝ කම්කරුවන් කුඩා ගෙවල්වල (ලයින් වල) එකිනෙකාට ඉතා ආසන්නව ජීවත් වෙන්නෙ. මේ තත්වය වෛරසය පැතිරෙන්න හේතුවක් වුණා, ඒකෙන් ආසාදිතයින් සංඛ්‍යාව වැඩිවෙලා බොහෝ පුද්ගලයින් සංඛ්‍යාවක් මිය ගියා. ඒ වගේම එයාලට තියෙන සනීපාරක්ෂක පහසුකම් ද ඉතා සීමිතයි. එක ලයින් කාමර පෙළකට පොදුවේ එක ළිඳක් බැගින් තියෙන්නෙ.

සැලුන්, කෑම කඩ වගේ ඒවා පවත්වාගෙන යාමෙන් දෛනිකව මුදලක් උපයා ගත්ත අනෙක් අයටත් එයාලගේ ආදායම අහිමි වුණා. උදාහරණයක් විදියට, මේ ප්‍රදේශයේ ජීවත් වන දෙමළ ප්‍රජාවේ සාමාජිකයින් බොහෝ දෙනෙක් සැලුන් සහ රූපලාවන්‍යාගාර පවත්වාගෙන ගියා, ඒත් මේ සීමා කිරීම් එක්ක මෙම ව්‍යාපාර දිගටම පවත්වාගෙන යන්න ක්‍රමයක් නැහැ. ඒ වගේම, තමන්ට ආසාදනය වෙයි කියන බයට මිනිස්සු සේවා ලබා ගන්න මේ ස්ථානවලට යන්නත් බයයි.

### රජයෙන් ලැබුණු සහයෝගය

අඩු ආදායම්ලාභී පවුල් වලට ලබා දුන්න රුපියල් 5,000 ක දීමනාව ගමේ අයගෙන් වැඩි දෙනෙකුට ලැබුණා. ඒ වගේම, නිරෝධායනයට ලක්වෙලා ඉන්න පුද්ගලයින්ට ලබා දෙන රුපියල් 10,000 ක සලාක මල්ල පසුගිය මැයි මාසය දක්වා ම ලබා දුන්නා. ඒත් ඊට පස්සෙ නිරෝධායනයට ලක් වීමට සිදු වුණත් බොහෝ පවුල්වලට එය ලැබුණේ නැහැ. මම දන්න විදියට, දැනට තිබෙන අගුලු දැමීමත් එක්ක ලබා දෙන රුපියල් 2,000 ක දීමනාව ලැබීලා තියෙන්නේ ගමේ එක් අයෙකුට පමණයි. මේ ප්‍රදේශයේ සමෘද්ධි ප්‍රතිලාභීන් අඩු සංඛ්‍යාවක් ඉන්නෙ.

වසංගතයේ මුල් අවධියේ දී නම් විෂබීජනාශක දියර සහ මුහුණු ආවරණ ලබා දීමට දේශපාලකයින් සහ මහජන නියෝජිතයින් යම් යම් වැඩපිළිවෙළ ක්‍රියාත්මක කළා. ඒ වගේම, නිරෝධායනය විය යුතු පුද්ගලයින් සම්බන්ධයෙනුත් යම් යම් ක්‍රියාමාර්ග තිබුණා. ඔවුන්ට අත්‍යාවශ්‍ය භාණ්ඩ ලබා දුන්නා. ඒ හැරෙන්න එතරම දෙයක් වුණේ නැහැ.

### සෞඛ්‍ය අංශයෙන් ලැබුණු සහාය

මේ ප්‍රදේශයේ මුල් ම රෝගියා වාර්තා වුණේ 2021 පෙබරවාරි මාසයේදී යි. වරින් වර රෝගීන් එක්කෙනා දෙන්නා වාර්තා වුණා. නමුත් අප්‍රේල් අවුරුදු උත්සවයෙන් පස්සේ තමයි රෝගීන් සංඛ්‍යාව වැඩි වුණේ. දෙනියාය ප්‍රදේශයේ කොවිඩ් ආසාදනය වෙලා එක වයෝවෘද්ධ පුද්ගලයෙක් මිය ගියා. ඊට පස්සේ, 24 හැවිරිදි තවත් පුද්ගලයෙක් ඊයේ මැරුණා. සෞඛ්‍ය නිලධාරීන් ජනතාවට හොඳ සහයෝගයක් ලබා දුන්නා. මීට පෙර මේ ප්‍රදේශයේ එක් ආසාදිතයෙක්ව හඳුනාගත්තහම, පී.එච්.අයි. මහත්තයා ඒ ආසාදිත පුද්ගලයාගේ සමීප ආශ්‍රිතයින් ලෙස හඳුනාගෙන ඇති සියලු දෙනාට ම පී.සී.ආර්. පරීක්ෂණයි ඇන්ටිජන් පරීක්ෂණයි සිදු කළා. නිරෝධායනය විය යුතු පුද්ගලයින්ටත් පී.එච්.අයි. මහත්තයා අදාළ මගපෙන්වීම් ලබා දෙමින්, දැනුවත් කරමින් සහයෝගය ලබා දීලා නිරතුරුව ම නිරීක්ෂණය කළා. මේ දවස්වල ගෙදර ඉඳන් ම නිරෝධායන වෙන එක දිරිමත් කරන නමුත්, ඉඩකඩ සහ පහසුකම් නැති නිසා වතුකරයේ අවට ප්‍රදේශවල ඒක කරන්න තරමක් අපහසුයි.

### එන්නත්කරණය

අප්‍රේල් සහ මැයි මාස වලදී, එයාලා වයස අවුරුදු 60 සහ එයට වැඩි පුද්ගලයින්ව එන්නත් කරන්න පටන් ගත්තා, ජූනි මාසයේ දී අවුරුදු 30 සහ එයට වැඩි පුද්ගලයින්ව එන්නත් කරන්න පටන් ගත්තා. මගේ වයස අවුරුදු 24 යි, ඒත් මම වැඩ කරන තැනින් විශේෂ ඉල්ලීමක් කරපු නිසා මාව සම්පූර්ණයෙන් ම එන්නත් කළා. එයාලා කිසිම කලබලයක් ඇති නොවෙන විදියට ඒක හොඳින් පරිපාලනය කළා.

### නීතිය හා සාමය

වසංගතයේ මුල් අවධියේ දී මිනිස්සු වැඩි දෙනෙක් නිරෝධායන නීති නියම විදියට අනුගමනය කරන්න පුරුදු වෙලා හිටියා. ඒත් ඊට පස්සෙ කවුරුවත් ඒවා එච්චර ගණන් ගත්තෙ නැහැ. නගරබද ප්‍රදේශ වල නම් තත්ත්වය නිරීක්ෂණය කරන්නයි පාලනය කරන්නයි පොලිසිය සහ අනෙකුත් ආරක්ෂක නිලධාරීන් යොදවලා තිබුණා. ඒත් ගම්බද ප්‍රදේශවල ඒවා ගැන හොයල බලන්න කවුරුවත් හිටියේ නැහැ. මිනිස්සු නිරෝධායන නීති පිළිපැද්දෙ නැහැ. කඩයක් ඉස්සරහ පැත්තෙන් වහල තිබුණත් පිටිපස්ස පැත්තෙන් බඩු විකුණන ක්‍රමයක් තියෙනවා. මිනිස්සු ගෙදර තියෙන ඒකාකාරී බවෙන් හෙම්බත් වෙලා ඉන්න නිසා ඒ වගේ තැන්වලට එකතු වුණා. එයාලා තේ බොමින් එක එක්කෙනා එක්ක කතා කරන්න (ඕපාදූප කියන්න) පුරුදුවෙලා හිටියා. මම දන්න තරමට නම්, ආරක්ෂක නිලධාරීන් නිරෝධායන නීති ක්‍රියාත්මක කරන්න අවධානය යොමු කළේ නැහැ.

### අධ්‍යාපනය

ඔන්ලයින් අධ්‍යාපනය සම්බන්ධ බොහෝ දුෂ්කරතා තියෙනවා. බොහොමයක් මිනිස්සුන්ට ඔවුන්ගේ ආර්ථික තත්වය අනුව, ඇන්ඩ්‍රොයිඩ් ෆෝන් එකක් මිලදී ගන්ඩ අමාරුයි. පංති ගාස්තු ගෙවලා නැති අයට ඔන්ලයින් පන්තිවලට ප්‍රවේශ වෙන්ඩ දෙන්නෙ නැහැ. පංති ගාස්තු ගෙවලා නැති අය බැංකුවට ගිහිල්ලා සල්ලි ගෙවන්න ඕනැ. ඒත ලොක්ඩවුන් කරලා තියෙන කාලේ ඒක කරන්න අමාරු වැඩක්. එයාලට ඔන්ලයින් ක්‍රමයට මුදල් ගෙවන්න පහසුකම් නැහැ. එයාලා ගෙන් වැඩි දෙනෙක් මේ පහසුකම ගැන දන්නෙත් නැහැ. ගුරුවරුන්ගේ වර්ජනය නිසා දැන් මොනවත් ම කරන්නේ නැහැ. සමහර ප්‍රදේශවල නම් ඉස්කෝලෙනුයි, ගුරුවරුයි ළමයින්ට ඉගෙන ගන්න මගපෙන්වීමක් කරන්න වට්ස්ඇප් හරහා හරි, එහෙම නැත්නම් මුද්‍රණය කරලා හරි පාඩම් යවන්න පටන් අරගෙන තියෙනව කියලා මට දැනගන්න ලැබුණා. මම දන්න තරමින් මේ ප්‍රදේශවල නම් ඒ වගේ වැඩපිළිවෙළක් යොදලා නැහැ. මීට ඉස්සෙල්ල ඔන්ලයින් අධ්‍යාපනයට සම්බන්ධ වෙන්න බැරි ළමයින්ට සහයෝගය දෙන වැඩපිළිවෙලක් තිබුණා. එයාලට ළඟ තියෙන ඉස්කෝලෙට ගිහිල්ලා, තමන්ගෙ ගෙදර ඉඳන් අධ්‍යයන කටයුතු කරගෙන යන්න ඕනැ කරන අධ්‍යයන ද්‍රව්‍ය ටික ලබා ගත හැකි ක්‍රමයක් තිබුණා, ඒත් ඒක තිබුණෙ දවස් දෙකක් විතරයි.

### ගෘහස්ත හිංසනය, මත්ද්‍රව්‍ය භාවිතය සහ වෙනත් ගැටළු

මම දකින විදියට නම් තරුණයින් අතර මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතය වැඩි වෙලා තියෙන්නෙ. ගම් ප්‍රදේශවල ලොක්ඩවුන් කාලෙත් අරක්කු විකුණන කඩ තියෙනවා. මේ තත්ත්වයත් එක්ක ඒක වැඩිවෙලා. පාසල් ගමන අවසන් කරපු අයයි, තරුණ පිරිසයි වැඩි දෙනෙක් මේකට ඇබ්බැහි වෙලා ඉන්නෙ.

### ධනාත්මක හැඩගැසීම්

ගෙවතු වගාව වැඩි වෙලා, තවත් වැඩි දියුණු වෙලා තියෙනවා. ඒ වගේම, ගෙදරදි ම කොම්පෝස්ට් සහ කාබනික පොහොර නිෂ්පාදනය කර ගන්න එකත් ඉහළ ගිහින් තියෙනවා. හදිසියේ පොහොර තහනම් කිරීමත් එක්ක ආණ්ඩුවත් ඒකට සහාය දෙනවා. තවත් සමහර තරුණයො විසිතුරු මත්ස්‍ය වගාව වගේ කුඩා ව්‍යාපාර පටන් අරගෙන තියෙනවා.

### එකොලොස්වන සම්මුඛ සාකච්ඡාව

**බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රදේශයේ සිංහල ප්‍රජාවට අයත්, වයස අවුරුදු 34 ක් වූ පිරිමි පුද්ගලයෙකු සමග මෙම සම්මුඛ සාකච්ඡාව සිදු කරන ලදී. මේ වන විට ඔහු කොළඹ ප්‍රදේශයේ පෞද්ගලික සමාගමක බෙදාහැරීම් කළමනාකරුවෙක් ලෙස සේවය කරයි. එබැවින් ඔහු ඔහුගේ රැකියාවේ අවශ්‍යතාවය මත ඔහුගේ කාලයෙන් වැඩි කොටසක් ඔහුගේ ගම් ප්‍රදේශයෙන් බැහැරව කොළඹ අගනගරයේ ජීවත් වෙයි.**

**වසංගතය පිළිබඳ ඔබගේ අත්දැකීම කුමක්ද සහ එය ඔබගේ ජීවන රටාවන් වෙනස් කර ඇත්තේ කෙසේද?**

මම හෝමාගම පිහිටි පෞද්ගලික සමාගමක ලොජිස්ටික්ස් මැනේජර් කෙනෙක් විදියට සේවය කරන්නෙ. වසංගතය පැතිරීමත් එක්ක අපට බොහෝ දුෂ්කරතාවලට මුහුණ දෙන්න සිද්ධ වෙලා තියෙනවා, අපේ අලෙවිය පහත වැටුණා. අපි සාමාන්‍යයෙන් අලෙවි කරන්නෙ දේශීය වෙළෙඳ පොළට, ඒ අතරෙ අපි ජාත්‍යන්තර වෙළෙඳාමත් පටන් ගත්තා. ඒත් මේ ගෝලීය අර්බුදයත් එක්ක අපේ අපනයන සම්පූර්ණයෙන් ම නතරවුණා. ඒක නිසා දැන් සමාගමේ සීමිත මෙහෙයුම් ප්‍රමාණයක් සිදු කරන්නෙ.

## ජීවනෝපාය




*පොතුවිල් ප්‍රදේශයේ ධීවර ප්‍රජාව*
*ඡායාරූපය: චතුරංග ප්‍රදීප්, 2021*

මේක සම්පූර්ණයෙන් ම අනපේක්ෂිත තත්වයක්නෙ. 2020 මාර්තු මාසේ මුලින් ම රට ලොක්ඩවුන් කිරීමත් එක්ක හදිසියේ හැමදේම වෙනස් වුණා. ඊට ඉස්සෙල්ලා මම කොළඹ තැනක් කුලියට අරගෙන, වැඩට යන දවස්වල එහේ නතර වෙලා හිටියෙ. මට ඒකට ලොකු මුදලක් වියදම් කරන්නත් සිද්ධ වුණා. මගෙ අතේ ලොකුවට ඉතිරිකර ගත්ත මුදලක් තිබුණෙත් නැහැ. මම කුලියට ගත්ත තැනට ඩිපොසිට් එකක් විදියට සහ ඇඩ්වාන්ස් එකක් විදියට රුපියල් 75,000 ක් ගෙවලා තිබුණේ, මුලින් ම ලොක්ඩවුන් කළ වෙලාවෙ අපේ කොම්පැනිය වැහුවා. ඊට පස්සෙ මම බණ්ඩාරවෙල මගේ ගමට ගියා. ඉතින් ඒ ගෙවල් අයිතිකාරයා ඒ කාලය තුළ ඇති වූ තත්වයට එයාලට කරන්න දෙයක් නැහැ කියලා මගෙ ඩිපොසිට් එකෙන් මාස 3 ක කුලිය කපා ගත්තා.

මගේ මූලික වැටුප හැරෙන්නට, මම සිදුකරන අලෙවියට අනුව මගේ ආදායම වැඩි වෙනවා, ඒත් මුළු රට ම ලොක්ඩවුන් කළාට පස්සෙ අලෙවිය සම්පූර්ණයෙන් ම නතර වුණා. සාමාන්‍යයෙන් මම රුපියල් 75,000 ත් 80,000 ත් අතර මුළු මුදලක් උපයා ගත්තා, ඒත් මේ කාලය තුළ ඒක අඩු වුණා. මම කලින් අරගෙන තිබුණු ණය ටිකකුත් ගෙවන්න වුණ නිසා ගොඩක් දුෂ්කරතාවලට මුහුණ දෙන්න සිද්ධ වුණා. මගේ පවුලේ දැන් රැකියා කරන්නේ අම්මයි මමයි විතරයි. මගේ අම්මා ගුරුවරියක් ලෙස සේවය කරන්නෙ. මගේ පියා දැන් විශ්‍රාම ගිහිල්ලා ඉන්නෙ. අම්මට ස්ථාවර ආදායම් මාර්ගයක් තියෙනවා. ඒක මේ කාලය තුළ පවුලේ අනිත් තුන්දෙනාට විශාල උපකාරයක් වුණා. මේක අපට මේ තරම් බලපෑව නම්, අනෙක් අඩු ආදායම්ලාභීන්ට සහ දවස් කුලියට වැඩ කරන අයට කුමක් වෙන්න ඇත්ද? අපි ඒකත් අවබෝධ කර ගත යුතුයි. කොහොම වුණත්, අපි හැමෝම දැන් අඩු වියදම් සහිත ජීවිතයකට හුරුවෙලා ඉන්නෙ, අපි තවමත් අපිට හැකි පමණින් අන් අයටත් උදව් කරන්න උත්සාහ කරනවා.

මගේ ගමේ තේ වතුවලයි රබර් වතුවලයි වැඩකරන කම්කරුවො ගොඩක් ඉන්නවා. මේ වසංගතයත් සහ ලොක්ඩවුන් එකත් ඒ අංශයේ ඉන්න දවස් කුලියට වැඩකරන කම්කරුවන්ටත් බලපාලා තියෙන්නෙ. කර්මාන්තශාලා සහ සමාගම් ඒවායෙ දේශීය වෙළඳාමෙ මෙන්ම ජාත්‍යන්තර වෙළඳාමෙත් පහත වැටීමකට මුහුණ දීලා තියෙනවා. මේ දක්වා ම අලෙවිය හරිගිහිල්ලා නැහැ. වැටුප් අඩු කිරීම් සහ වෙනත් ගැටළු හේතුවෙන් බොහෝ කම්කරුවන් දුෂ්කරතාවලට මුහුණ දීලා ඉන්නෙ. ඔවුන්ගේ ජීවන රටාවලට බලපෑම් ඇති වෙලා තියෙනවා. බණ්ඩාරවෙල පිහිටල තියෙන්නෙ කඳුකර ප්‍රදේශයේ. පොදු ප්‍රවාහනය සීමා වෙලා තියෙන්නෙ, ඒත් නාගරික ප්‍රදේශවල තියෙනවා, සමහර දුෂ්කර ප්‍රදේශවල මුළු දවසටම ධාවනය වෙන්නේ බස් එකක් හෝ දෙකක් පමණයි. අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ලබා ගන්න ජනතාවට ඇතැම් විට දුෂ්කරතා රාශියකට මුහුණ දෙන්න සිද්ධ වෙලා තියෙනවා.

## නීතිය හා සාමය

මිනිසුන්ට ගමන් බිමන් යාමට නොහැකි වී තිබෙන නිසා ඔවුන්ගේ අත්‍යාවශ්‍ය අවශ්‍යතා සපුරාගැනීමට බොහෝ දුෂ්කරතාවලට මුහුණ දෙන්න සිදු වෙලා තියෙනවා. ජීවන වියදම ඉහළ යමින් පවතින නිසා මිනිස්සු තමන්ට එදිනෙදා අවශ්‍ය කරන ආහාර ටික ලබා ගන්නත් ඔවුන්ගේ මාසික වියදම් පියවා ගන්නත් වෙර දරමින් ඉන්නෙ. සැපයුමත්, ඉල්ලුමත් අතර අසමතුලිතතාවයක් තියෙනවා. අද වුනත් ඉන්ධන, කිරිපිටි, සීනි, හාල් වගේ දේවල් වල සැපයුම සහ මිල පිළිබඳ විශාල ගැටළුවක් තියෙනවා. මට මාසික ආදායමක් තියෙනවා, ඒත් දවස් කුලියට වැඩකරන අය විශාල දුෂ්කරතාවලට මුහුණ දෙනවා. ඒ අය එයාලගෙ දරුවන්ට උගන්වන්නේ කොහොමද?

## රජයෙන් ලැබුණු සහාය

රජය යම් සහයෝගයක් ලබා දීලා තියෙනවා, ඒත් ඒක ප්‍රමාණවත්ද කියන එක තමයි ගැටළුව? මම මේ ප්‍රශ්නය බණ්ඩාරවෙල ප්‍රදේශයේ මගේ දෙමළ මිතුරන් කිහිප දෙනෙකුගෙනුත් ඇහුවා, එයාලා කිව්වේ සාමාජිකයො 4 දෙනෙක්, 6 දෙනෙක් විතර ඉන්න පවුලකට මේ සහයෝගය ප්‍රමාණවත් නැහැ කියලා - ළමයින්ගෙ අවශ්‍යතායි වැඩිහිටියන්ගේ අවශ්‍යතායි ඉටු කරල දුන්නහ ම ඒව දවස් දෙක තුනකට විතරයි ප්‍රමාණවත් වෙන්නෙ කියලා. බණ්ඩාරවෙල ප්‍රදේශයේ සහනාධාර බෙදා දීමේ කටයුතු හොඳින් පරිපාලනය කරපු බව මම දන්නවා. ඒ ළඟ තිබුණු වෙනත් ග්‍රාම නිලධාරී වසමක ග්‍රාම නිලධාරීවරයෙකුගේ වංචාවක් නිසා යම් යම් ප්‍රශ්න ඇති වුණා, ඒ වගේම තවත් සමහරු ඒ සහනාධාර මුදල වෙනත් දේවල් වලට යොදාගෙන තිබුණා. සමස්තයක් විදියට බැලුවම ඒ ක්‍රියාවලිය හොඳයි, ඒත් එම ක්‍රියාවලිය විනිවිදභාවයෙන් යුතු ක්‍රියාවලියක් වෙන්න ඕනැ. නගර සභාවයි, අනෙක් දේශපාලන නියෝජිතයොයි මිනිසුන්ට උදව් කරන්න දරපු උත්සාහයන් අවමයි, නමුත් ප්‍රදේශයේ තියෙන සමහර ආගමික ආයතන උදව් කළා.

## සෞඛ්‍ය අංශයේ සහාය

දැන් මම වැඩිපුර ම ඉන්නේ හෝමාගම. මිනිස්සු බොහෝ විට නිරෝධායන රෙගුලාසියි අනෙකුත් සෞඛ්‍ය මාර්ගෝපදේශයි වඩා හොඳ ආකාරයකට

අනුගමනය කළා. ඒ සම්බන්ධයෙන් ආරක්ෂක නිලධාරීනුයි සෞඛ්‍ය අංශයි සෑහෙන කාර්ය භාරයක් ඉටු කරලා තියෙනවා. ඒ වගේම ඔවුන් විශේෂයෙන් දියතලාව රෝහලේ සහ බණ්ඩාරවෙල රෝහලේ නිලධාරීන් මිනිස්සුන්ට හොඳින් සැලකුවා. ඇවිදගන්න බැරි සමහර වයෝවෘද්ධ පුද්ගලයින්ට ඔවුන්ගේ නිවෙස්වල සිටියදී ම ප්‍රතිකාර කළා. ආසාදිත පොකුරු හරහා කොවිඩ් පැතිරෙන්න පටන් ගත්තට පස්සෙ, ඔවුන් පුද්ගලයින්ව හුදකලා කරමින් නිරෝධායන ක්‍රියාවලීන්ට බොහෝ සෙයින් උපකාර කළා. විශේෂයෙන් ම එම්.ඕ.එච්. එකේ නිලධාරීනුයි පී.එච්.අයි. මහත්තුරුයි නිරන්තරව අධීක්ෂණය කරමින්, අවශ්‍ය මගපෙන්වීම් ලබා දෙමින් උපකාර කළා.

## එන්නත්කරණය

එන්නත්කරණ ක්‍රියාවලියේ පළමු වැනි අදියරේ දී සෞඛ්‍ය අමාත්‍යාංශය අවධානය යොමු කළේ කොළඹ සහ බස්නාහිර පළාත පිළිබඳව යි. ගිය සතියෙ තමයි එයාලා බණ්ඩාරවෙල ප්‍රදේශයේ ප්‍රතිශක්තිකරණ ක්‍රියාවලිය පටන් ගත්තේ. මගේ තාත්තට දැන් වයස අවුරුදු 63 යි. අම්මගෙ වයස අවුරුදු 60 යි. දැන් මේ ප්‍රදේශයේත් වේගයෙන් කොවිඩ් පැතිරෙනවා. බණ්ඩාරවෙල සහ දුරබැහැර ප්‍රදේශවලත් එන්නත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කළ යුතුයි කියලයි මම හිතන්නෙ.

## අධ්‍යාපනය

ඔන්ලයින් ක්‍රමයට ඉගැන්වීම ඉතාමත් අසතුටුදායක ක්‍රමයක්, ඒක අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇතිවෙලා තියෙන ගැටළු විසඳන්න තියෙන ඉතා සීමිත විසඳුමක්. ඔන්ලයින් තාක්ෂණය අපේ රටේ තවමත් දියුණු වෙමින් පවතින දෙයක් නිසා ඒක ඉතාමත් සීමා සහිතයි. බොහෝ දියුණු රටවල් මෙම ක්‍රම සොයා ගෙන භාවිතා කරනවා, ඒත් අපේ රට තවමත් සංවර්ධනය වෙමින් පවතින රටක්. අපට බොහෝ දුෂ්කරතා තියෙනවා. අන්තර්ජාල ආවරණය සීමිතයි. මිනිසුන් ගෙන් බහුතරයකට ඇන්ඩ්‍රොයිඩ් ෆෝන් වැනි මිල අධික උපාංග මිලදී ගැනීමේ හැකියාවක් නැහැ. බොහෝ පවුල් තම දරුවන්ගේ අධ්‍යාපන කටයුතු වලට අවශ්‍ය පොත්පත් සහ අනෙකුත් අවශ්‍යතා සපුරා දෙනවා, ඒත් ඔන්ලයින් අධ්‍යාපනය සඳහා අවශ්‍ය වියදම් දරන්න ඔවුන්ට තරමක් අපහසුයි.

ඔන්ලයින් අධ්‍යාපනයේ තියෙන වටිනාකම සීමිතයි. පාසල් අධ්‍යාපනය ඊට වඩා පුළුල්: ඒ හරහා ළමයින්ට එකට එකතුවෙලා අන්‍යෝන්‍ය වශයෙන් කටයුතු කරන්න, ක්‍රීඩා කරන්න, සාමූහිකව වැඩ කරන්න සහ මිතුරන් ඇති කරගන්න අවස්ථාවක් ලැබෙනවා. දරුවන් අධ්‍යාපනය තුළින් ග්‍රහණය කර ගත යුතු තවත් බොහෝ සාරධර්ම තියෙනවා. ඔන්ලයින් ඉගැන්වීම හරහා ලබන අධ්‍යාපනය හුදෙක් විෂයමාලාවට පමණක් සීමා වෙලා තියෙන්නෙ. දරුවන්ට මග හැරුණු බොහෝ දේවල් තියෙනවා. ඔවුන්ට ප්‍රායෝගික දැනුමක් ලැබෙන්නෙ නැහැ. වඩා යහපත් පාසල් පද්ධතියක් නිර්මාණය කරමින් සාරධර්ම ඉගැන්විය යුතුයි. උසස් පෙළ විභාගයට මුහුණ දෙන සිසුන් ගෙන් වැඩි දෙනෙක් වසංගතය සහ අගුලු දැමීම් හේතුවෙන් මුහුණ දුන් සියලු ප්‍රමාදයන් නිසා විශාල පීඩනයකට මුහුණ දීලා ඉන්නෙ. එයාලා තමන්ගෙ අපේක්ෂාවන් ඉදිරියට ගෙන යන්න වෙර දරමින් ඉන්නෙ. දැන් විශ්වවිද්‍යාලයට ඇතුළත් වුණු විශ්වවිද්‍යාල සිසුන් සහ ඇතුළත් වීමට බලාපොරොත්තුවෙන් ඉන්න සිසුන්ගේ තත්වයත් ඒ විදියමයි.

මම හිතන්නේ පාසල් ළමයින්ට එන්නත් ලබා දීලා ඉක්මනින් ම පාසල් පටන් ගන්නව නම් හොඳයි, මොකද එහෙම වුනොත් අඩුම තරමින් ඔවුන්ට ඔවුන් මුහුණ දෙන ප්‍රශ්න මගහරවා ගැනීමට ඒකෙන් යම් අවස්ථාවක් නිර්මාණය වෙයි.

## පරිසරය




*කොළඹ මහ නගර සභාවේ සනීපාරක්ෂක කම්කරුවන් කොම්පඤ්ඤවීදිය ප්‍රදේශයේ කසල එකතු කරමින්*

මම නිරීක්ෂණය කළ ආකාරයට, හෝමාගම ප්‍රදේශයේ කසළ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ක්‍රියාවලියේ යම් යම් ගැටළු තියෙනවා. පැහැදිලිව ම, මෙම වසංගත තත්ත්වය තුළ කසළ ප්‍රතිචක්‍රීකරණය කළමනාකරණය කිරීමේ ප්‍රායෝගික දුෂ්කරතා තියෙනවා. සියලු දෙනා ම නගර සභාවට හෝ පිරිසුදු කිරීමේ හා කසළ කළමනාකරණය කිරීමේ නිරත වන පුද්ගලයින්ට දොස් පවරන්නට උත්සාහ කරනවා, මොකද ඒක එයාලගේ කාර්යය සහ වගකීම නිසා. නමුත් ජනතාවටත් තමන්ගේ නිවසේ එකතු වන කසළ ටික නිසි පරිදි කළමනාකරණය කර ගන්න වගකීමක් තියෙනවා. මිනිස්සු ඔවුන්ගේ ආකල්ප සහ හැසිරීම් වෙනස් කර ගත්තොත් මේක තවදුරටත් වැඩිදියුණු කර ගත හැකි දෙයක්. පිටරටවල් කොච්චර ලස්සනද කියලා හැමෝම කතා කරනවා, ඒත් තනි තනිව තමන්ගේ දායකත්වයෙන් රට පිරිසිදුව තියාගන්න කවුරුත් වැඩ කරන්නේ නැහැ. බොහෝ අය තමන්ගෙ කසළ මලු නගරාසන්න ප්‍රදේශවල හුදකලා ප්‍රදේශවලට විසි කරන්න උත්සාහ කරනවා. ලොක්ඩවුන් කරල තියෙන කාලයෙදි පවා මේක බොහෝ විට සිද්ධ වෙනවා. කසළ කළමනාකරණය ගැන කථා කරන විට, ඒක වඩා හොඳින් පරිපාලනය කරන්න ක්‍රියාමාර්ග ගත යුතුයි. වන විනාශයත් මේ විදියට ම සිද්ධ වෙනවා.

මේ කාලය තුළ මිනිස්සුන්ගේ මානසිකත්වය වෙනස් වෙලා තියෙන්නෙ. මිනිස්සු විශාල පීඩනයකට ලක්වෙලා ඉන්න නිසා කවුරුවත් අනෙක් අය ගැන

සිතන්න තරම් තත්වයක නැහැ. මිනිස්සු තමන්ගෙ යහපත ගැන හිතනව මිසක් සමාජයට බලපාන දේවල් ගැන ඔවුන් හිතන්නෙ නැහැ.

## වැරදි තොරතුරු ප්‍රචාරය කිරීම

නිසි තොරතුරු දැන ගැනීම මිනිස්සුන්ගෙ අයිතියක්, ඒත් ශ්‍රී ලංකාවේ නියම තොරතුරු හෙළිදරව් වෙන්නෙ වැරදි ස්ථානයක දී, එහෙම නැත්නම් වැරදි කාලවලදී. මේ වසංගතය පටන් ගත්ත දවසෙ ඉඳන් මේක වඩාත් හොඳින් පෙනෙන්න තියෙනවා. මිනිස්සු සැබෑ තත්ත්වය දන්නවා නම් ඔවුන්ට නිසි ප්‍රතිචාර දැක්විය හැකියි. සමාජ මාධ්‍ය හරහා ප්‍රචාරය වන ඇතැම් තොරතුරු ඉතා ගැටලු සහගතයි. ඒවගෙ තොරතුරු වලින් මිනිස්සු වැරදි පැත්තකට යොමු වෙන්න පුළුවන්. සම්ප්‍රදායික හා විද්‍යුත් මාධ්‍ය ත් ඒ විදියම යි. වසංගතයට පෙර සිටම එම මාධ්‍ය පක්ෂග්‍රාහීව යි තිබුණෙ. මිනිස්සු ඒ මාධ්‍යවල පක්ෂග්‍රාහීභාවයෙන් පාට කරපු කාච හරහා තමයි දේවල් දකින්න පටන් අරන් තියෙන්නෙ.

බණ්ඩාරවෙල ප්‍රදේශය සලකා බැලුවම, සමහර පැතිවල මිනිස්සු බලන්නේ රජයට අයත් රූපවාහිනී නාලිකා විතරයි. ඒ නාලිකාවල කියන දේ අනුව කටයුතු කරන අය එයාලගේ කාචයෙන් පුළුල් සමාජය දකින්න පුහුණු කරනවා. ඔවුන්ට මග හැරෙන තවත් බොහෝ පැති තියෙනවා. ඒ අය ඒ පක්ෂග්‍රාහීකම් එක්ක වැරදි පැත්තට යනවා. ඒකෙ ප්‍රතිඵලයක් විදියට ඔවුන් තුළ සමබරතාවයක් දකින්න නැහැ. අපි මේක වසංගත කාලය තුළත් දැක්කා. උදාහරණයක් විදියට, පසුගිය මාර්තු මාසයේ දී සමහර රූපවාහිනී නාලිකා කොවිඩ් සුව කරන බව පැවසෙන විද්‍යාත්මක නොවන "මැජික් ඖෂධයක්" ගැන ප්‍රචාරණය ප්‍රචලිත කළා. ඒකට කිව්වෙ "ධම්මික පැනිය" කියලා. සමහර අය ඒ කතා විශ්වාස කළා.

මාධ්‍ය සදාචාර සම්පන්නව කටයුතු කළ යුතුය; ඔවුන්ගේ වාර්තා සමබර විය යුතුයි; රජයත් මේ කරුණු සම්බන්ධයෙන් වගකිව යුතුයි. පසුගිය දවස්වල මාධ්‍ය මගින් ඉන්ධන හිඟයක් පිළිබඳ වාර්තා පළ වුණා. මිනිස්සු ඉන්ධන ටැංකි පුරවා ගන්න පෝලිම් ගැහෙන්න පටන් ගත්හ. ඒත් සැබෑ තත්වය ඊට වඩා වෙනස් වුණ. දැන් තියෙන සීනි, කිරිපිටි ප්‍රශ්නත් ඒ විදියමයි. විවිධ නාලිකා තමන්ගේ දේශපාලන වාසියට විවිධ දේ කියනවා. මේ වැරදි තොරතුරු නිසා ජනතාව පීඩාවට පත්වෙනවා. මාධ්‍ය වගකීමෙන් යුතුව කටයුතු කරමින් නියම වෙලාවට නිවැරදි තොරතුරු ලබා දිය යුතුයි. සමාජ මාධ්‍ය සම්බන්ධයෙන් තියෙන ප්‍රශ්නෙත් මේ විදියමයි. දේශපාලන කාරණා සම්බන්ධයෙන් අදහස් ප්‍රකාශ කරන්න තියෙන නිදහස උල්ලංඝනය නොකර, සමාජ මාධ්‍ය පාලනය කිරීම සඳහා පවතින නීති රීති වැඩිදියුණු කළ යුතුය.



*හම්බන්තොට ගැමි ප්‍රදේශයක තිබෙන කුඩා කඩයක්*

## මානසික සෞඛ්‍යය

මමත් මානසික පීඩනයන්ට මුහුණ දුන්නා. කෙටි කාලීන පියවරක් ලෙස මුලින් ම රට ලොක්ඩවුන් කරපු වෙලාවෙ, පුද්ගලික මට්ටමෙන් මම සතුටු වුණා, මොකද, කොවිඩ් වසංගතයට ඉස්සෙල්ල මම නිතරම මගේ රැකියාවෙ වැඩවලට කාර්යබහුල වෙලා හිටියෙ. මට පවුලෙ අයත් එක්ක ගෙදර ඉන්න ලැබුණෙ නැහැ. ඒ නිසා මම හිතුවා අඩුම තරමේ මට දැන් ඒකට හරි වෙලාවක් තියෙනවා කියලා. නමුත් ටික කාලෙකට පස්සෙ දුෂ්කරතා ඇතිවෙන්න පටන් ගත්තා. ආදායම් අහිමිවීම්, ජීවනෝපාය ප්‍රශ්න වගේ තවත් බොහෝ ප්‍රශ්න ඇති වුණා. ඒ සතුට කෙටි කාලීන මායාවක් වගේ වුණා.

ඒ දවස්වල මිනිසුන්ට අත්‍යවශ්‍ය භාණ්ඩ මිලදී ගන්න අවස්ථාව ලබා දෙන්න යම් නිශ්චිත කාලයන් සඳහා ලොක්ඩවුන් එක ලිහිල් කළා. සමහර දවස්වල මගේ කොළඹ ඔෆිස් එකෙන් ඒ කාල සීමාව වන විට මගේ පඩිය මගේ ගිණුමට දාලා තිබුණේ නැහැ. ඒ නිසා මම මගේ ජීවිතයේ මූල්‍ය අංශය කළමනාකරණය කර ගැනීමේ දී දුෂ්කරතාවලට මුහුණ දුන්නා. ඒක මට මගේ අනාගතය ගැන නිතරම සිතා බලන්න හේතුවක් වුණා. ලොක්ඩවුන් එක නිසා මට ගෙදර යන්න විදියක් නැහැ, මොකද, මේ තත්වයන් යටතේ අපිට ෂිෆ්ට් එකට වැඩ කරන්න සිදු වෙලා තියෙන්නෙ. ඒ නිසා මට කොළඹ මගේ ඔෆිස් එකට වෙලා ඉන්න වෙනවා. මට ගෙදර යන්න අවස්ථාවක් ලැබුණත්, මගේ අම්මටයි තාත්තටයි අනිත් අයටයි ලෙඩේ බෝ වෙලා ඒ අයව අනතුරේ වැටෙන්න පුළුවන් නිසා ඒක අවදානම් දෙයක්. දැන් යාළුවන්ව හම්බවෙන්න තියෙන ක්‍රමය තමයි එයාලට කෝල් කරන එක, ඒත් ජංගම දුරකථන ඒකට නිසි විකල්පයක් නෙමෙයි. දැන් මරණ බිය ඇති වෙලා තියෙන්නෙ, ඒක මිනිසුන්ට දැඩි සැක සහිත තත්වයක් ඇති කරලා තියෙනවා. ඉක්මනින් ම මේ දේවල් හොඳ අතට හැරෙනු ඇතැයි මම බලාපොරොත්තු වෙනවා.

## ගෘහස්ථ හිංසනය, මත්ද්‍රව්‍ය භාවිතය සහ වෙනත් ගැටළු

මට මේ තත්වය නිරීක්ෂණය වෙලා නැහැ, ඒත් මම විවිධ ගැටළු පිළිබඳව මගේ මිතුරන්ගෙන් අහල තියෙනවා. සංචරණය සීමා කරලා තියෙන නිසා

බොහෝ දෙනෙකුට කෝපය ඇතිවීමේ ගැටළුව තියෙනවා. තවත් සමහරු මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිත කරනවා. පවුලේ සාමාජිකයින් අතර, විශේෂයෙන් ම ස්වාමිපුරුෂයා සහ භාර්යාව අතර සැකයන් පවතිනවා. මෙයට පෙර වෙනත් සමබරතාවයක් පැවතුණා, ඒත් වසංගතය එම ගතිකත්වය වෙනස් කරල තියෙන්නෙ.

## හමුදාකරණය

මම මේ ප්‍රශ්නයේදී මධ්‍යස්ථයි. හමුදාව රටේ ආරක්ෂාව සම්බන්ධයෙන් වගකිව යුතුයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. ඒත් දැන් අපට ආරක්ෂාව සම්බන්ධ විශාල තර්ජනයක් නැති නිසා කොවිඩ් කළමනාකරණය සඳහා හමුදා නිලධාරීන් යොදා ගැනීම හොඳ දෙයක් විදියටයි මම දකින්නෙ. කොහොම වුණත්, ඔවුන් සෞඛ්‍ය අංශයේ නිර්දේශ වලටයි, ඉල්ලීම්වලටයි ප්‍රමුඛත්වය දිය යුතුයි. ඔවුන් සෞඛ්‍ය අංශයෙන් ලබා දෙන ඒ නිර්දේශ ක්‍රියාත්මක කරන සහායක යාන්ත්‍රණයක් විදියට ක්‍රියා කළ යුතුයි. අපි දැන් දැක්කා එන්නත් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණයෙන් ම පරිපාලනය කරන්නේ ආරක්ෂක අංශ, ප්‍රධාන වශයෙන් ම යුධ හමුදාව. ඒක එහෙම කරනවා නම්, ඔවුන් හමුදාවේ ඉන්න වෛද්‍යවරුන්ටයි වෛද්‍ය නිලධාරීන්ටයි ප්‍රමුඛත්වය දෙන්න ඕනැ. දැන් සෞඛ්‍ය අංශයත් විශාල පීඩනයකට ලක්වෙලා ඉන්න නිසා එම සහයෝගය ඉතා වැදගත්. නමුත් ආරක්ෂක අංශ එතනින් එහාට ගිහිල්ල ඉතා බලවත්ව මිලිටරිකරණය වුණ ආකාරයකට කටයුතු කරනව නම් ඒක නිදහසට සහ මානව හිමිකම්වලට ඉතා ගැටළුකාරී වෙන්න පුළුවන්. එන්නත ලබා ගන්න කියලා තව කෙනෙකුට බල කරන එකත් හොඳ දෙයක් නෙමෙයි කියලයි මමත් හිතන්නෙ.

## ධනාත්මක හැඩගැසීම්

ප්‍රාදේශීය මට්ටමෙන්, පරිසරයෙ, විශේෂයෙන් ම වායු දූෂණය සම්බන්ධයෙන් යම් ධනාත්මක දේවල් සිදුවෙලා තියෙනවා. ඒ වගේම මිනිස්සු සාමූහිකව එකිනෙකාට උදව් කරන්නත් කටයුතු කළා. තමන්ගේ ජීවන රටාවේ නාස්තිකාර වියදම් වැනි ගැටළු තියෙන බව සමහර අයට වැටහිලා තියෙනවා. මිනිස්සු බොහෝ දෙනෙක් සරල ජීවන රටාවන්ට හුරු වුණා.

නමුත් තවත් පැති වලින් බැලුව ම, බොහෝ දේවල් කලකිරීම ඇතිකරවනවා. ඇතැම් අවස්ථා වලදී රජය තමන්ගෙ වැරදි වසන් කර ගන්න මේක අවස්ථාවක් කර ගන්නවා. උදාහරණයක් විදියට පාස්කු ඉරිදා සිද්ධිය සම්බන්ධ ගැටළු සහ තවත් බොහෝ දේවල් තියෙනවා. බොහෝ තරුණයින් රට හැර යන්න උත්සාහ කරනවා, ඒත් ඒක රටේ අනාගතයට හොඳ නැහැ. බුද්ධිගලනය අපේ රටට විශාල ප්‍රශ්නයක් වෙලා. යහපත් අනාගතයක් සඳහා අපි සියලු දෙනා සාමූහිකව කටයුතු කළ යුතුයි.



*ගාලුමුවදොර පිටියේ සාරවිට වෙළෙන්දෙක්*

## දොළොස්වන සම්මුඛ සාකච්ඡාව

**කොළඹ රාජ්‍ය නොවන සංවිධානයක සේවය කරන, දංකොටුව ප්‍රදේශයේ පදිංචි, සිංහල ප්‍රජාවට අයත් 26 හැවිරිදි පිරිමි පුද්ගලයෙකු සමග මෙම සම්මුඛ සාකච්ඡාව සිදු කරන ලදී.**

**වසංගතය පිළිබඳ ඔබගේ අත්දැකීම කුමක්ද සහ එය ඔබගේ ජීවන රටාවන් වෙනස් කර ඇත්තේ කෙසේද?**

මේ තත්ත්වය මට අලුත් දෙයක්. මම කවදාවත් හිතුවේ නැහැ අපේ ජීවන රටාව මේ විදියට වෙනස් වෙයි කියලා. මම රැකියාව කරන අතරතුර මගේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතුත් කරගෙන යනවා. මම කවදාවත් හිතුවේ නැහැ මට ඒක සම්පූර්ණයෙන් ම ඔන්ලයින් ක්‍රමයට කරගෙන යන්න වෙයි කියලා. කොහොම වුණත්, මෙම තත්වය අපට උගන්වන පාඩම් ගණනාවක් තියෙනවා. මේකට ඉස්සෙල්ලා, අපි වඩා හොඳ ජීවිතයක් ගත කරන්න විවිධ ඉලක්ක පසුපස දුවමින් හිටියෙ. උදාහරණයක් විදියට මා ගැන හිතල බැලුවෙත්, මගේ පවුලේ අය මාව උනන්දු කරවන නිසා, උපාධිය ලබා ගත්තට පස්සෙ මම වඩා හොඳ රැකියාවක් හොයමින් හිටියෙ. මම මගේ ආදායම උපරිම කර ගන්න තවත් කුසලතා සහ සුදුසුකම් එකතු කර ගන්න ක්‍රම හොයමින් හිටියෙ. අපේ සමාජය අපව පුහුණු කරල තියෙන්නේ ඒ විදියටයි. අපි සෑමවිට ම මේ කවය ඇතුළෙ කටයුතු කරමින් ඉන්නව මිසක් කිසි විටෙකත් ඒ කවයෙන් බැහැරව හිතන්නෙ නැහැ. නමුත් මේ වසංගතය අපිට නැවතිලා, අපි කරමින් ඉන්නෙ මොනවාද කියල හැරිල බලන්න ඕනැ කරන පසුබිම සකස් කරලා දුන්නා. මේක දේශපාලන, ආර්ථික,

පාරිසරික සහ තවත් බොහෝ කරුණු වලට අදාළයි. ඒක අපට ඒ කනස්සලු සිහිපත් කර දුන්නා. ඒත් ජීවත් වෙන්න අපිව පුහුණු කරල තියෙන ආකාරය අනුව - විශේෂයෙන් ම ආර්ථිකය සහ ආර්ථික පද්ධතිය තුළ අපි මුහුණ දෙන දුෂ්කරතා රාශියක් තියෙනවා. අපට කිසිවක් නොමිලේ ලැබෙන්නේ නැහැ. අපි මේ නව සාමාන්‍ය තත්වයට හැඩගැහිලා, සාමාන්‍ය ජීවිතයෙදි වගේ කටයුතු කරන්න පුරුදු විය යුතුයි. මේක අවුරුද්දකින් දෙකකින් අඩු වෙලා යයි කියලා අපි හිතනවා, ඒත් අපිට බොහෝ දේවල් වල අඩුව දැනෙයි. අපි දන්නවා අපිට වෛරසය නිසා අපේ ආදරණීයයන් බොහෝ දෙනෙක් අහිමි වුණා කියලා. ලෝකය මේ සියල්ල සිද්ධ වෙන්න ඉස්සෙල්ල 2019 දි තිබුණ තත්වයට සමාන වෙයි කියල අපිට අපේක්ෂා කරන්න බැහැ. ඒ වගේම අපි බලාපොරොත්තු වූණාට වඩා තාක්ෂණය භාවිතා කිරීම පුළුල් වෙලා.

අපි ජීවත් වෙන්නේ මොන වගේ තත්ත්වයකද කියන එකත්, තමන්ගේ ජීවනෝපාය කෙරෙහි ඇතිවන බලපෑම ගැනත් මිනිස්සු හිතනවා. සංචාරක කර්මාන්තය, කුඩා ව්‍යාපාර, දවසේ කුලියට කරන වැඩ ආදියට බලපෑම් එල්ල වෙලා තියෙනවා.

## ජීවනෝපාය

දංකොටුව ප්‍රදේශයේ වැඩිපුර ම තියෙන්නේ ගඩොල් කර්මාන්තය. එය දීර්ඝ කාලයක් තිස්සේ පැවතුණු ගෘහස්ථ කර්මාන්තයක්. එවගේ ම, පෝසිලේන් සහ ඇඟළුම් කර්මාන්ත සඳහා කාර්මික කලාප කිහිපයකුත් තියෙනවා. විශාල පිරිසක් එම කර්මාන්තවල වැඩ කරනවා. මෙම තත්වය තුළ ඔවුන් ගෙන් බොහෝ දෙනෙකුට නිවසේ සිටීමට සිදු ලො තියෙනවා. සමහර සමාගම් ඔවුන්ගේ වැටුප් අඩු කරලා තියෙනවා; තවත් සමහර සේවකයින්ට ලැබෙන්නේ වැටුපෙන් අඩක් පමණයි. ධීවර කර්මාන්තයට සම්බන්ධ වෙලා ඉන්න අය සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර කරන තවත් බොහෝ දෙනෙක් පීඩාවට පත්වෙලා ඉන්නෙ. ඒ වගේම මේසන්වරු, වඩු කාර්මිකයින් වැනි දෛනික වැටුප් ලබන සේවකයින් රැසකගේත් ආදායම අහිමි වෙලා තියෙන්නෙ. ඔවුන්ගෙන් සමහරෙක් තමන්ගේ ආහාර අවශ්‍යතා සපුරා ගැනීමට වෙහෙසෙමින් ඉන්න බව මම දන්නවා. සමහර අයට තමන්ගෙ ප්‍රධාන ආහාරය විදියට කොස්, දෙල් වගේ දේවල් කන්න සිද්ධවෙලා තියෙනවා. ඔවුන් ඉන්නේ ඉතාමත් දුෂ්කර තත්වයක, ඒත් තවමත් සියදිවි නසාගැනීම් හෝ එවැනි ආකාරයේ ප්‍රතිචාර මම දැකලා නැහැ.

## රජයෙන් ලැබුණු සහාය

ජනතාව සුබසාධන රාජ්‍යයක වගේ එම සහයෝගය අපේක්ෂා කළා. මේ ප්‍රදේශයේ බොහෝ දෙනෙක් ප්‍රධාන වශයෙන් ම ඉතාලියේ විදේශ රැකියා කරන අය. ඒ අයගෙ පවුල්වලට බැංකු හරහා යම් ආදායමක් ලැබෙනවා. ඒ පිළිබඳ නිල ලියකියවිලි නම් නැහැ. ඒ පවුලවල් සමහර ඥාතීන්ට හොඳ ආදායම් මාර්ගයක් තිබියදී ත් රුපියල් 5,000 ක සහනාධාර  මුදලත් ලබාගත්තා. ඒවගේ ම ඒ ලයිස්තුවේ නම් තියෙන සමහර අය දැන් හොඳට බිස්නස් කරනවා, ඒ අය රජයේ නිලධාරීන්ගේ දූෂිත වැඩ නිසා ඒ අයට අනවශ්‍ය



වුණත් ඒ සල්ලි අරගත්තා. හැමෝම නෙමෙයි සමහර අය. සහනාධාර බෙදා හැරීමේ පළමු අදියරේ දී රජය බොහෝ දෙනෙකුට එය ලබා දීමට උත්සාහ කළා. නමුත් අරමුදල් නොමැතිකම නිසා ඒ අවුරුද්දෙ ඒක වෙනස් වුණා. දැන් බොහෝ දෙනෙකුට රැකියා අහිමි වෙලා තියෙන්නෙ. සමහරුන්ට තමන්ගෙ ළමයින්ව පෝෂණය කරන්න තියෙනවා, ඒ අය  සමෘද්ධි වගේ කිසිම සහනාධාර ක්‍රමයකට අයත් වෙන්නෙ නැහැ. ඔවුන්ට ඉතුරු කර ගත්ත මුදලක් නැහැ. සමහරුන්ට ගෙවල් හදන්න ගත්ත ණය ආපහු ගෙවන්න තියෙනවා. ඔවුන් කිසිම පිහිටක් නැතිව ගොඩක් දුක් විඳිනවා.

## නීතිය හා සාමය

මගේ මාමා කෙනෙක් ඉන්නවා ගොවිතැන් කරන කෙනෙක්. එක දවසක් එයා වැරදි විදියට මාස්ක් එක දාගෙන හිටියා. පොලිසිය එයාට රුපියල් 5,000 ක දඩයක් ගහලා උසාවියේ නඩුවකුත් දැම්මා. එයා මාස්ක් එක දාගෙන හිටිය විදිය වැරදි වෙන්න පුළුවන්. ඒත් රුපියල් 5,000 ක දඩයක් කියන එක එයාලට විශාල මුදලක්. ඒ මුදල අඩු තරමෙන් සති දෙක තුනක්වත් තමන්ගෙ පවුලේ අයට අවශ්‍ය ආහාර සපයා දෙන්න භාවිත කරන්න පුළුවන්. සමහර වෙලාවට පොලිසිය මේ විදියට ඉතාම අසාධාරණ විදියට නීතිය ක්‍රියාත්මක කරනවා. ඔය කවුරුවත් දේශපාලකයෝ හෝ බලවතුන් කරන වැරදි ගණන් ගන්නේ නැහැ. ඔවුන් පහර දෙන්නේ දුප්පත් මිනිසුන්ටයි.


පොදුවේ සලකා බැලුවම වර්තමානයේ මිනිසුන් බොහෝ සංඛ්‍යාවක් පාරවල්වල ඉන්නවා. බොහෝ කාර්යයන් අත්‍යාවශ්‍ය ක්‍රියාකාරකම් බවට පත් වෙලා තියෙනවා. මිනිස්සු තමන්ගෙ පවුල්වල ආහාර සුරක්ෂිතතාවයක් නැති නිසා ලොක්ඩවුන් එක තියෙද්දිත් යමක් කරලා මුදලක් උපයා ගන්න උත්සාහ කරනවා. සමහරු කසිප්පු විකුණන්නත් සම්බන්ධ වෙලා ඉන්නවා. පොලිස් නිලධාරීන් බොහෝ දෙනෙකුට කොවිඩ් ආසාදනය වෙලා තියෙනවා. ඔවුන් ගෙන් බහුතරයක් නිරෝධායනයට ලක්වෙලා ඉන්නෙ. ඒ නිසා මෙම තත්ත්වය නිරීක්ෂණය කරන්න පොලීසියට එතරම් පිරිස් බලයක් නැහැ. බොහෝ දෙනෙක් දැන් තියෙන තත්වේ ගැන නොසතුතට පත්වෙලා ඉන්නෙ.

## හමුදාකරණය

පවතින තත්වය තුළ ඔවුන්ගේ සහයෝගය රටට අවශ්‍යයි කියලා මම හිතනවා. නමුත් සියලු ම පරිපාලන කටයුතු සඳහා හමුදා නිලධාරීන්ගේ සහාය ලබා ගැනීම සුබදායක දෙයක් නෙමෙයි. ඒක වෙනත්

මාර්ගයක් ඔස්සේ ගමන් කරන්න පුළුවන්. වසංගතය ගැන කියනවා නම් ඒක පෙර නොවූ විරූ දෙයක් නිසා අපට ඒ ගැන කිසිදු සැලැස්මක් තිබුණේ නැහැ. නමුත් පරිපාලන කටයුතු ඉටු කරන්න රජයේ අදාළ අංශ තියෙනවා, ඒ සඳහා පරිපාලන විශේෂඥයින් ඉන්වා. ඔවුන් සැලසුම් හදලා කළ යුතු දේ මොකක්ද කියලා ඔවුන් තීරණය කළ යුතුයි. ඒ වගේම පරිපාලන නිලධාරීන් මීට වඩා කාර්යක්ෂම විය යුතුයි. එහෙම නොවුනොත් ආරක්ෂක අංශ යොදා ගැනීම පරිපාලනය කළමණාකරණය කරන්න තියෙන වඩාත් හොඳ විකල්පයක් කියලා ජනතාව විශ්වාස කරන්න පුරුදු වෙයි.

### සෞඛ්‍ය අංශයෙන් ලැබුණු සහාය




*ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය බලධාරීන් විසින් නිකුත් කරනු ලබන කොවිඩ්-19 එන්නත්කරණ කාඩ්පත*

සෞඛ්‍ය නිලධාරීන් ඔවුන්ට හැකි උපරිමය කිරීමටත්, පවතින තත්වය තුළ ඔවුන්ට කළ හැකි සියලු දේ කිරීමටත් උත්සාහ කළා. එම අංශයේ සම්පත් හිඟකම ගැටළුවක් වී තිබෙනවා, දැන් වසංගතයට වසර දෙකකට ආසන්න කාලයක් ගත වෙලා. ජාතික මට්ටමෙන් දීර්ඝ කාලීනව දේවල් දැකීමට හා කිරීමට නිසි සැලස්මක් හෝ යාන්ත්‍රණයක් තවමත් නැහැ. අද මම එන්නත ගන්න ගියා. ඒ මධ්‍යස්ථානයේ විශාල තදබදයක් තිබුණා. කවුරුවත් සමාජ දුරස්ථභාවය පවත්වා ගත්තේ නැහැ. ඒකෙන් මිනිසුන් අතර වෛරසය තවදුරටත් පැතිරීමේ අවදානමක් ඇති වෙනවා. මිනිස්සු හැම කෙනා ම එන්නත් ලබා ගන්න පොරකමින් හිටියෙ, තත්වය නිසි ලෙස කළමනාකරණය කරන්න එතන කවුරුවත් සිටියේ නැහැ. ඒ වගේම සමහර සෞඛ්‍ය නිලධාරීන් ව්‍යාජ හේතු දක්වමින් නිවාඩු ගන්නවා. මේ අවස්ථාවේ දී ඔවුන් සියලු දෙනාටම විශාල වගකීමක් තියෙනවා. මම හිතන්නේ මේක ජයගන්න නම් හැමෝම අනුකම්පාව දක්වමින්, හෘදය සාක්ෂියට අනුව කටයුතු කළ යුතුයි. අපිට මිනිසුන් ගැන විනිශ්චයන් දිය නොහැකියි, මොකද ඔවුන්ගේ පැත්තෙන් බැලුවම ඔවුන්ට දුෂ්කර කාලයකට මුහුණ දෙන්න සිදු විය හැකියි.

### එන්නත්කරණය

අවුරුදු 60 ට වැඩි සහ 30 ට වැඩි පුද්ගලයින් ගෙන් වැඩි දෙනෙක් එන්නත් කරල තියෙන්නෙ. ඒත් තවමත්, අවුරුදු 30 ට අඩු අයගෙන් බොහෝ දෙනෙක්ව එන්නත් කරන්න තියෙනවා. මීට පෙර අවුරුදු,60 ට වැඩි පුද්ගලයින්ට දෙවන මාත්‍රාව ලබා දෙන්න සුළු ප්‍රමාදයක් සිදු වුණා. ඒක සැලසුම් කිරීමේ තිබුණ ගැටලුවක්. ඒත අද කවුරුහරි එන්නත ගත්තොත් මෙච්චර දවසක් ගියාට පස්සේ දෙවැනි මාත්‍රාව දෙනවා කියලා සැලැස්මක් තියෙනවා. ඒ වගේම පළමු වැනි වටයේ දී බොහෝ දෙනෙකුට සයිනොෆාම් එන්නත සහ ඊට පස්සෙ ෆයිසර් එන්නත තමයි ලැබුණෙ. සැලසුම් කිරීම මීට වඩා හොඳ විය යුතුයි.

### අධ්‍යාපනය

මිලමුදල් සහ වෙනත් වරප්‍රසාද තියෙන අයට තම දරුවන්ට අධ්‍යාපනය ලබාදෙන්න පහසුකම් තිබෙනවා. නමුත් දුප්පත් මිනිස්සු දුක් විඳිනවා, ඔවුන්ගෙ දරුවන්ට සරුංගල් යවමින් ඉන්නයි සිද්ධ වෙලා තියෙන්නෙ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකුට දුරකථනයක් නැහැ, ඔවුන්ට ඩේටා වලට වියදම් කරන්නත් මුදල් නැහැ. ෆෝන් එකේ බිල් ගෙවන්න කඩ සාප්පු ඇරල නැත. විද්‍යුත් ක්‍රමයට ගෙවීම් කරන්නේ කොහොමද කියලා ඔවුන් දන්නෙ නැහැ. ඔවුන්ට පහසුකම් නැහැ. ගුරුවරුන් සහ දරුවන් අතර සන්නිවේදනයක් සිදු වෙන්නෙත් නැහැ. ඒ වගේම ගුරුවරුන්ගෙ වැටුප් ප්‍රශ්නයකුත් තියෙනවා. එක් ගුරුවරයෙකුට සිසුන් 40 දෙනෙකු සමග ඇමතුම් හරහා සම්බන්ධ වෙන්න අවශ්‍ය නම් ඒකටත් ගුරුවරුන්ගේ පෞද්ගලික මුදලින් වියදම් දරන්න වෙනවා. මේ තත්ත්වය යටතේ ඔවුනුත් බොහෝ දුෂ්කරතාවන්ට මුහුණ දෙනවා. ඒ වගේම සමහර අයගේ ෆෝන් එක කැඩිලා, ඒක හදාගන්න තැනක් නැහැ. ගුරුවරුන් සහ සිසුන් බහුතරයකට මේ සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම නැහැ. දෙමව්පියන් පවා සමහර සරල කාරණා දන්නේ නැහැ. සමහර විට ඔවුන් ඒක අතහැරලා දානවා. අධ්‍යාපන ක්ෂේත්‍රයේ අවුරුදු දෙක තුනක පරතරයක් තියෙනවා. අනාගතයේ දී මොන විදියේ ප්‍රතිවිපාක ඇති වේ දැයි මම දන්නෙ නැහැ.

### පරිසරය

මම දන්න විදියට නම් ඒ සම්බන්ධයෙන් එතරම් ප්‍රශ්න නැහැ, එක්ස්ප්‍රස් පර්ල් නැවේ සිද්ධියෙන් පස්සෙ ඇතිවුණු බලපෑම් නිසා මීගමුවේ සහ ඒ ආශ්‍රිත වෙරළබඩ ප්‍රදේශවල ධීවර ප්‍රජාවට විවිධ බාධකවලට මුහුණ දෙන්න සිද්ධ වුණා, ඒත් දැන් ඔවුන්ගෙන් බොහෝ දෙනෙක් ධීවර කටයුතුවල නිරත වෙනවා. දැන් මෝසම් වැසි පැමිණීමත් එක්ක මේ පැත්තේ කාලගුණ රටාවේ පවා වෙනස්කම් සිදුවෙලා තියෙනවා. ඔවුන්ට සාමාන්‍ය විදියට ඔවුන්ගේ අලෙවි කිරීම් කරගන්න බැරිවෙලා තියෙනවා. ඔවුන් නිරෝධායන නීති අනුගමනය කරන්න ඕනැ. සාමාන්‍යයෙන් මේ ප්‍රදේශයේ දශක කිහිපයක් තිස්සෙ වැලි සහ මැටි කැණීමේ ප්‍රශ්නතියෙනවා.

### වැරදි තොරතුරු ප්‍රචාරය වීම

ඒ සම්බන්ධ කිසිම දෙයක් සිදු තිබුණේ නැහැ. සුළුතර ප්‍රජාවන්ට අදාළ එතරම් ප්‍රචාර තිබුණෙ නැහැ, ඒත් මීගමුවේ ඉස්ලාම් ප්‍රජාව සම්බන්ධ යම් යම් ප්‍රචාර තිබුණා. ඔවුන් අපිරිසිදු කියලා නීතිය පිළිපදින්නෙ නැහැ කියලා මිනිස්සු කිව්වා.

### මානසික සෞඛ්‍යය

විශේෂයෙන් ම වයස්ගත පුද්ගලයින් දැඩි පීඩනයකට ලක්වෙලා ඉන්නෙ. සාමාන්‍යයෙන් මොනව හරි ප්‍රශ්නයක් ආවහම එයාලා පන්සලට හරි පල්ලියට හරි වෙනත් ආගමික ස්ථානයකට හරි ගිහිල්ලා යාඥා කරනවා. මේ පවතින තත්ත්වය යටතේ ඔවුන්ට පන්සලට හෝ පල්ලියට යන්න විදියක් නැහැ. ඔවුන්ට එම කටයුතු නිවසේදී ම කරන්න වෙලා තියෙන්නෙ. ඔවුන් දිගු කාලීනව නිවසට ම සිමාවී සිටින බැවින් ඔවුන්ගේ ජීවන රටාව ඉතාමත් ඒකාකාරී වෙලා තියෙන්නෙ.

### ගෘහස්ථ හිංසනය, මත්ද්‍රව්‍ය භාවිතය සහ වෙනත් ගැටළු

ගැටළු තියෙන්න පුළුවන්, ඒත් මම විශේෂයෙන් දැකල නැහැ. ජනතාව විශාල පීඩනයකට ලක්වෙලා ඉන්නෙ. ඒ නිසා තමයි මේ විදියෙ ප්‍රශ්න ඇති වෙන්නේ.

සාමාන්‍යයෙන් මේ ප්‍රදේශයේ මිනිසුන් අධික ලෙස මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතා කරන්න පුරුදු වෙලා ඉන්නෙ. සැපයුම් අඩු නිසා මත්ද්‍රව්‍ය භාවිතය විශේෂයෙන් වැඩි වෙලා නැහැ.

### ධනාත්මක හැඩගැසීම්

ගෙවතු වගාව වැඩිවෙලා තියෙනවා. ඒක හොඳ දෙයක්. වසංගතයෙන් පසුව වුනත් මිනිසුන්ට ඒක දිගු කාලීනව කරගෙන යන්න පුළුවන් නම් එය වඩාත් හොඳ දෙයක් වෙයි.

### දහතුන්වන සම්මුඛ සාකච්ඡාව

**දඹානේ පදිංචි ආදිවාසී ප්‍රජාවට අයත් වයස අවුරුදු 54 ක පිරිමි පුද්ගලයෙකු සමග මෙම සම්මුඛ සාකච්ඡාව පවත්වන ලදී. ඔහු දඹාන ප්‍රදේශයේ රජයේ පාසලක සේවය කරන ගුරුවරයෙක් වේ. එමෙන්ම ඔහු ලේඛකයෙක් ද වේ. ඔහු දඹානේ ආදිවාසී ප්‍රජාව අතරින් විශ්වවිද්‍යාලයකට ඇතුළත් වූ පළමු වැනි සාමාජිකයා වේ.**



*දඹානේ ආදිවාසී ප්‍රජාව*

**වසංගතය පිළිබඳ ඔබගේ අත්දැකීම කුමක්ද සහ එය ඔබගේ ජීවන රටාවන් වෙනස් කර ඇත්තේ කෙසේද?**

නාගරික සමාජයේ වගේ මානසික ආතතියකින් නෙමෙයි අපි ඉන්නේ. වැදි ජනතාව කැලෑවෙන් එළියට ආවට පස්සෙ, එයාලාට තමන්ගේ හේන් ගොවිතැන් අතහැරල දාලා, අවට සමාජයේ තිබෙන ක්‍රියාකාරකම්වලට සම්බන්ධ වෙන්න සිදු වුණා. එයාලා සංචාරක කර්මාන්තයට සහ දෛනික කුලී වැඩවලට සම්බන්ධ වුණා. එයාලාට කැලෙන් හොයාගන්න පුළුවන් යම් යම් දේවල් සංචාරකයින්ට විකුණුවා. සමහර අය ස්වභාවික ද්‍රව්‍ය වලින් හදන මාල වගේ අත්කම් භාණ්ඩ අලෙවි කරල ජීවිකාව ගෙන ගියා. අපි අපේ කෑම කන්නේ අපි අවට තියෙන දේවල් එක්ක හරිම සරල විදිහට. අපි ස්වාභාවික, සරල ආහාර වේලක් ගන්නේ. නාගරික ප්‍රදේශවල දකින්න තියෙන මානසික ආතතිය ඇතිවන මට්ටමට අපි ඇවිල්ලා නැහැ. අපි අපේ ජීවිතය ගතකරන්නේ ඉතා සරල ක්‍රම සමගයි. මම යමක් සොයාගත්තොත් මම ඒක කනවා. මට මොනවත් සොයාගන්න බැරි වුනොත්, මට බඩගින්නෙ ඉන්න වෙයි. ඒත් එක්කම, මට ඉතාමත් පහසුවෙන් ප්‍රතිවර්තනය විය හැකි මානසිකත්වයක් අපට තියෙන්නෙ. අනිත් සමාජවල වගේ නෙමෙයි, අපිට අපේ දේවල් මොනවත් සම්පූර්ණයෙන් ම නැති වෙලා නැහැ. අපේ සරල අවශ්‍යතා වලින් බොහොමයක් අපේ ගමේ තියෙනවා.

### දඹානේ ආදිවාසී ගම්මානයේ තත්ත්වය

පසුගිය සතියේ පී.සී.ආර්, 150 ක් විතර සිදු කළා. ඒකෙන් 144 දෙනෙක් ආසාදිත බවට තහවුරු වුණා. අද තවත් පී.සී.ආර්. 100 ක් කරලා තියෙනවා. වයිරසය ඇඟේ තියෙනවා කියලා සොයාගෙන තියෙනවා. ගිය සතියේ අපේ නායක ඌරුවරිගේ වන්නිල ඇත්තෝගේ බිරිඳ ඌරුවරිගේ හීන් මැණිකාගේ මරණයත් එක්ක මේ වනවිට මරණ තුනක් සිදු වෙලා තියෙනවා.

**ඔබගේ ප්‍රජාව විසින් අනුගමනය කරන ලද දේශීය වෛද්‍ය ක්‍රම සහිත පිළිවෙත් කිසිවක් තිබුණාද?**

එහෙම විශේෂයක් තිබුණේ නැහැ. ගොඩක් වෙලාවට මම දැක්කා බොහොමයක් ගෙවල්වල කොහොඹ අතු එල්ලලා තියෙනවා. ඔවුන් ගෙන් බොහෝ දෙනෙක් කොත්තමල්ලි බිව්වා. ඒ හැරෙන්න, අපි අතරේ වෙනසක් වෙච්ච වෙන විශේෂ දෙයක් මම නම් දැක්කේ නහැ. අපේ මිනිස්සු ලොකු කලබලයකින් නෙමෙයි හිටියේ. මේ මරණ සිදුවුණෙත් ඉතා ම මෑතක දී.

### නිරෝධායන නීති පැනවීම පිළිබඳ තත්ත්වය

ඒත් ඒක ප්‍රශ්නයක් වුනේ නැහැ, මොකද අපේ ගම නගරයත් එක්ක දැඩි සම්බන්ධයක් නැහැනෙ. ගම වටේ තියෙන සම්පත් වලින් අපිට හැම දෙයක්ම කළමනාකරණය කර ගන්න පුළුවන්.

### සෞඛ්‍ය අංශයෙන් ලැබුණු සහාය

මුල ඉඳල ම ප්‍රශ්නයක් තිබුණෙ නැති නිසා එතරම් මැදිහත්වීමක් සිදු වුණේ නැහැ. ඊයේ වාර්තා කිහිපයක් ම ලැබුණට පස්සෙ වැඩි අවධානයක් යොමු වුණා.

වෛද්‍යවරුන් සහ අනෙකුත් සෞඛ්‍ය නිලධාරීන් මගපෙන්වීම සහ සහාය ලබා දුන්නා.

## එන්නත්කරණ වැඩසටහන

එන්නතේ දෙවන මාත්‍රාව ලබාදීමේ සුළු ප්‍රමාදයක් තිබුණා. දවස් තුනකට කලින් ගන්න තිබුණ එක ඊයේ තමයි ලැබුණේ. අනික ඒක හොඳ මට්ටමකින් සිදු කළා. වෙනත් සෞඛ්‍ය ප්‍රශ්න තියෙන අය හැරෙන්න, අනිත් අය වගේම එයාලත් කැමැත්තෙන් ම ගිහිල්ලා එන්නත ගත්තා.

## රජය විසින් ලබා දෙන සහනාධාර

අපිට ඒවා නියම විදියට ලැබුණා. පිටස්තර අයත් ගොඩක් ඉන්නවා; අපි ගැන ලොකු හැඟීමක් තියෙන අයත් අපට විශාල සහයෝගයක් දෙනවා.



*සංචරණ සීමා ඉවත් කරනු ලැබීමෙන් පසුව නැවත වැඩ ආරම්භ කර ඇති යාපනය නල්ලූර් ප්‍රදේශයේ ගරාජයක සේවකයෙක්*

## අධ්‍යාපන ක්ෂේත්‍රයට ඇතිවී තිබෙන බලපෑම

ඒ අංශයෙන් තමයි නරක ම ප්‍රශ්නය ආවේ. අපේ ළමයි දුරස්ථ ඉගෙනීමේ ක්‍රම කිසිවක් භාවිත කරන්නේ නැහැ. අපේ ගුරුවරු ඒවා දන්නෙත් නැහැ. ඔන්ලයින් අධ්‍යාපනයට අවශ්‍ය එම සම්පත් අප සතුව නැහැ. අපේ ළමයි ඒවා භාවිතා කරන්නෙත් නැහැ, ඒවා භාවිතා කරන්න දන්නෙත් නැහැ. ඒ අයගේ දෙමව්පියන් හරහා සටහන් සහ ප්‍රශ්නපත්‍ර බෙදා දීලා අධ්‍යාපන කටයුතු කරන්න අපි උත්සාහ කළා. ටික දවසකට පස්සේ මම ඒවා දෙමව්පියන් හරහා ආපහු අරගත්තා පරීක්ෂා කරලා බලන්න. ඒ ඇරෙන්න අපිට ඔන්ලයින් උගන්වන්න පසුබිමක් තිබුණේ නැහැ. ළමයි ඉන්නෙත් වැඩි ඈතක නෙමෙයිනෙ. ඒ නිසා ඔවුන් සමග සම්බන්ධතාවය තියාගන්න පුළුවන් වුණා. ඒත් ගමෙන් ඈත ඉන්න ගුරුවරුන්ට ඒක කරන්න බැරි වුණා. ඔවුන් හැකිතාක් දුරකථනයෙන් කතා කරමින් ළමයින්ට ප්‍රශ්නපත්‍ර වන්න උත්සාහ කළා. ඒත් ඒක අසාර්ථක වුණා. මම හිතන්නේ රජයෙන්වත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන්වත් විශේෂ මැදිහත්වීමක් සිදු වුණේ නැහැ. හැමොට ම පොදු දේවල් හැරෙන්න වෙනත් විශේෂ මැදිහත් වීමක් තිබුණේ නැහැ. ඒ වගේම, මේ කාලය තුළ සමහර වැඩිහිටි සිසුන් විවාහ වෙලා ඔවුන්ගේ ජීවිතයේ නව පරිච්ඡේදයක් ආරම්භ කරලා තියෙනවා.

## වැරදි තොරතුරු ප්‍රචාරය වීම

අපේ අය මේ තත්වය එතරම් බරපතළ විදියට සලකන අය නොවන නිසා එහෙම දේවල් ඇති වුණේ නැහැ. ඒ අය අද ගැන විතරක් හිතන මිනිස්සු. දැන් තමයි ඔවුන් යම් දුරකට අනාගතය ගැන සිතන්නේ.

## මානසික සෞඛ්‍යය

ඒක ලෙඩේට වඩා ලොකු ප්‍රශ්නයක්. ඒක සමාජමය ගැටළුවක්, ඒත් අපේ ආදිවාසී ප්‍රජාව තුළ ඒක බොහෝ සෙයින් වෙනස් දෙයක්, විශේෂයෙන් ම අපේ තියෙන සරල ජීවන රටාව නිසා. සමස්තයක් හැටියට ඒක විශාල වෙනසක්. මේකේ බලපෑම ගොඩක් කල් පවතින දෙයක් වේවි. මේකට පිළියමක් ලෙස ඉදිරිපත් වෙලා තියෙන දේවල් පවා දඹාන ඇතුළු පිටිසර ප්‍රදේශවලට යන එක බොහෝ දුරට සිදු වෙන්නෙ නැහැ. දෙමව්පියන්ට පුළුවන් ඒ ගැන අවබෝධයක් තියෙන පරම්පරාවට ඒක හැඩගස්වල දෙන්න. ඒක කළ හැකිය. නමුත් ග්‍රාමීය ප්‍රදේශවල අධ්‍යාපනය ගැන එතරම් අවබෝධයක් නැහැ. අලුත් මෙවලම් ගැන අවබෝධයක් නැහැ. මේ තත්වය ග්‍රාමීය දිළිඳු ජනතාවට දැඩි බලපෑමක් ඇති කරනවා, ගෝත්‍රික අයට ඊටත් වැඩියෙන් බලපානවා. ඊළඟ පරම්පරාව ලෝකයේ සිදුවෙමින් පවතින අනෙකුත් වෙනස්කම් සමග වැඩි වැඩියෙන් ස්වභාවධර්මයෙන් සහ මනුෂ්‍යත්වයෙන් ඈත් වෙමින් ඉන්නෙ. ළමයින්ගේ මානුෂික පැත්ත දෙගුණ තෙගුණ කරන්න විශාල හේතුවක් තියෙනවා. මේ සඳහා අමතර ප්‍රයත්නයක් දරන්න වේවි.

## සිවිල් පරිපාලනය සඳහා ආරක්ෂක හමුදා යෙදවීම

අපේ ප්‍රදේශයට ඒක ප්‍රශ්නයක් වෙන එකක් නැහැ. කොහොම වුනත් දඹානේ එවැනි අමතර මැදිහත්වීම් තියෙන්නෙ අවම වශයෙන්. අනෙක් අතට, රජයට හෝ පෞද්ගලික අංශයට අපේ ප්‍රජාව වඩාත් විශේෂිත නිසා සෑම කෙනෙක්ම අපට ඉතා සමීපව උපකාර කරනවා.

## ප්‍රජාවගේ හැඩගැසීම්

ගෙවතු වගාව සහ ගොවිතැන් කටයුතු වැඩි වශයෙන් සිදුකිරීමේ ප්‍රවණතාවයක් තියෙනවා.

## අමතර අදහස් කිහිපයක්

නාගරික ප්‍රදේශවල පවුලේ අයට, දෙමව්පියන්ට, දරුවන්ට දවසෙ කාලය මදි. අපිට ඒ වගේ තත්වයක් නැහැ. අපි මොන රස්සාව කළත් අපේ ප්‍රජාවේ හැම කෙනෙක් ම හවසට ගෙදර එන්න පුළුවන් දුරක තමයි ඉන්නේ. සරල ජීවන රටාවේ ඇති වැදගත්කම පිළිබඳ අවබෝධය වැඩි වෙලා තියෙනවා. එහෙම නැතිව, මොකක් හරි ප්‍රශ්නයක් ඇතිවුනහම ළඟ තියෙන කඩවලට ගිහිල්ලා ඒ ගැන කථා කර කර ඉන්න පිරිසකුත් ඉන්නවා. දැන් ඒ තත්වය නැති වෙලා නිසා ඒ දේවල් ගෙදර ඉඳන් තමයි කරන්න වෙලා තියෙන්නෙ. යම් යම් හොඳ දේවල් තියෙනවා. සමහර අංශවල හොඳ දේවල් සිදු වෙලා තියෙනවා. බාහිර සමාජය තුළ

අපි පුරුදුවෙලා ඉන්න ආර්ථික රටාවේ තියෙන සංකීර්ණතා හේතුවෙන් තවත් අතුරු ප්‍රතිඵල රාශියක් ඇතිවෙලා තියෙනවා. ලෝකය අද අපි ඉන්න තත්වයේ තිබුණා නම්, කොවිඩ් ආපු වෙලාවේ අපිට මේ තරම් ප්‍රශ්න ඇති වෙන්නේ නැහැ

## දහහතරවන සම්මුඛ සාකච්ඡාව

### පුත්තලම සිරම්බිඅඩි ප්‍රදේශයේ ජීවත් වන ලංකා අප්‍රිකානු ප්‍රජාවට අයත් 55 හැවිරිදි කාන්තාවක සමග මෙම සම්මුඛ සාකච්ඡාව පවත්වන ලදී. ඇය වෘත්තියෙන් ජන සංගීතඥයෙක් වේ.



*ලංකා අප්‍රිකානු ප්‍රජාවේ සාමාජිකයින් ඔවුන්ගේ ජන සංගීත අංගක් රඟදක්වමින්*

**වසංගතය පිළිබඳ ඔබගේ අත්දැකීම කුමක්ද සහ එය ඔබගේ ජීවන රටාවන් වෙනස් කර ඇත්තේ කෙසේද?**

අපේ ප්‍රජාවගේ ජීවන තත්වය හැඩගැහුණේ තැන තැන යමක් කරමින් ඒවායින් උපයාගත් දෙයින් ජීවත් වෙමිනුයි. උදාහරණයක් විදියට අපි විවිධ සංස්කෘතික කටයුතුවලට, ප්‍රසංගවලට සහභාගි වුණේ අපේම කෆීර් මංජා සංගීතය යොදා ගනිමින්. ඒකත් අපේ අමතර ආදායම් මාර්ගයක්. අපි මහා පරිමාණයෙන් රංගන ඉදිරිපත් කරන අය වගේ නෙවෙයි. අපට විශාල මුදලක් ඉතිරි කර ගන්න හැකි වන තරම් ආදායම් මාර්ගයක් තිබුණේ නැහැ. අපි සමහර විට සංදර්ශන විශාල සංඛ්‍යාවක් ඉදිරපත් කළා, සමහර විට එකක්වත් ඉදිරිපත් කරන්න ලැබුණෙ නැහැ. ඒක හරිම වෙනස් කාලයක්. වසංගතයත් එක්ක අපි එක තැනක හිරවෙලා ඉන්නවා වගේ. ඇතැම් කලාකරුවන් සඳහා රජයේ මැදිහත්වීමෙන් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම තිබුණත් අපට නම් මොකුත්ම ලැබුණේ නැති තරම්. එවැනි පසුබිමක් තුළ අපට කොරෝනා නිසා බොහෝ කරදර ඇති වුණා. මේක කවුරුවත් බලාපොරොත්තු වෙච්ච තත්ත්වයක් නෙමෙයි.

දැන් සමහරු කඩවල්වල වැඩ කරනවා; තවත් සමහරු දවසේ කුලියට වැඩ කරනවා. මේ අගුලු දැමීමේ තත්වය තුළ එයාලා ලොකු අපහසුතාවයකට පත්වෙලා ඉන්නෙ. ආර්ථිකය සහ ආදායම හැම අතින්ම පහත වැටිලා තියෙන්නෙ. විශාල වශයෙන් බාධක තියෙනවා. ඒ වගේම අපේ ළමයි ඔක්කොම එකතැන හිරවෙලා ඉන්නෙ. දරුවන්ගේ අනාගත අධ්‍යාපනය වෙනුවෙන් අපි විශාල වෙහෙසක් දැරුවත් ඒ සියල්ල ම නතර වෙලා තියෙන්නෙ. මටත් දරුවො තුන් දෙනෙක් ඉන්නවා. වැඩිමල් ම දරුවා පාසල් අධ්‍යාපනය අවසන් කරලා ඉන්නෙ. දෙවන දරුවා උසස් පෙළ ඉගෙන ගනිමින් ඉන්නෙ. අනෙක් එක්කෙනා ඉන්නෙ 6 ශ්‍රේණියේ. විශේෂයෙන් ම වියදම් වැඩි වීමත් එක්ක ඔන්ලයින් අධ්‍යාපනයට ගොඩක් බාධක ඇති වුණා. ජංගම දුරකථනවල ඩේටා වලට වියදම ඉතාමත් වැඩියි; සමහර ප්‍රදේශවලට සම්බන්ධතාවය ඉතා දුර්වලයි. ඒ වගේම ජංගම දුරකථන, අවශ්‍ය උපකරණ වගේ අනෙකුත් පහසුකම් නොමැතිකම තමයි අනෙක් ගැටළුව. සිරම්බිඅඩි ප්‍රජාව තුළ ලංකා-අප්‍රිකානු පවුල් 22 ක් විතර ඉන්නවා. තවත් නගරවල පවුල් හත අටක් ඉන්නවා. සමහර අය ගාමන්ට්වල වැඩ කරනවා.

### නිරෝධායන නීති සහ අගුලු දැමීම් ක්‍රියාත්මක කිරීම

විශේෂ ගැටලුවක් නම් තිබුණේ නැහැ. රැකියා කර කරගන්න බැරි වීම, ආදායම් අහිමි වීම වගේ තවත් ප්‍රශ්න තමයි ප්‍රධාන ගැටළු වුණේ. එයාලා අපට හාල් දුන්නා, හාල් අරගෙන ආවා, ඒ විදියෙ උදව් තිබුණා. ජාති ආගම් භේදයක් තිබුණේ නැහැ. පන්සලේ අය පල්ලියේ අයට දුන්නා, පල්ලියේ අය පන්සලේ අයට දුන්නා. වසංගතය මුල් කාලයේ දී, හැමෝම උදව් කළා. දැන් ඒක ඉතා අපහසුයි - ගොවිතැන් අඩුයි; වඩු වැඩ අඩුයි; කුලී වැඩ අඩුයි.

### රජයෙන් ලැබුණු සහන

අපිටත් රජයෙන් සහන ලැබුණා. දුන්නු හැමදෙයක් ම අනිත් අයට වගේම අපිටත් ලැබුණා.

මේ වන තුරු ම අපේ ලංකා අප්‍රිකානු ප්‍රජාවට එතරම් ආසාදනය වෙලා තිබුණෙ නැහැ. ඒත් මෑතක දී ඒක වැඩි වුණා. මීගමුවේ කාර්ගිල්ස් එකේ වැඩ කරන කෙනෙකුට ගිය සතියේ ආසාදනය වුණා. එයා තවමත් මීගමුවේ නිරෝධායනය වෙමින් ඉන්නේ. ගමේ වුණත් ආසාදනය වෙච්ච අය ඉන්නවා. ඒත් අවට ප්‍රදේශවල ඒක අඩුයි. මේ ළඟදී ආසාදනය වුණු තවත් අවුරුදු 15 ක ගැණු ළමයෙක් ඉන්නවා. මේ දක්වා අපේ ප්‍රජාව තුළ කිසිදු මරණයක් සිදුවෙලා නැහැ.

### සෞඛ්‍ය අංශයෙන් ලැබුණු සහාය



*මහනුවර පිහිටි එන්නත්කරණ මධ්‍යස්ථානයක දී සෞඛ්‍ය අංශයේ නිලධාරීන් ගෙන් ලැබෙන සහාය*

සෞඛ්‍ය අංශයෙන් අපට අවශ්‍ය වන සහාය, විශේෂයෙන් ම නිවසේ නිරෝධායනය වීමේ දී අවශ්‍ය සහාය උපරිම වුණා. ඒ වගේම එන්නත් ලබා දීමේ

වැඩපිළිවෙළ පුරාවට ඉතා හොඳ සහයෝගයක් ලැබුණා. අවුරුදු 30 ට වැඩි අය ගෙන් බොහෝ දෙනෙකුට පළමු වනු මාත්‍රාව ලැබුණා. අනිත් අයට දෙවන මාත්‍රාවත් ලැබිලා ඇති. විශේෂ ගැටළුවක් නම් තිබුණේ නැහැ. ඔවුන් සහාය සපයා දීම, දැනුවත් කිරීම සහ ප්‍රධාන සෞඛ්‍ය ගැටළු කළමනාකරණය කිරීම හොඳින් සිදු කළා.

#### අධ්‍යාපනය

අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇතිවෙලා තියෙන කඩා වැටීම විශේෂයෙන් ම දරුවන්ට විශාල බලපෑමක් ඇති කරලා තියෙනවා. මගේ පවුලේ වුණත් මගේ දෙවෙනි දරුවා මේ අවුරුද්දෙ වාණිජ විෂය ධාරාවෙන් උසස් පෙළ ඉගෙන ගන්නවා. ප්‍රශ්නවලට විසඳුම් නැතිඵක අධ්‍යාපනය කඩාවැටීමට එක හේතුවක්. ඔන්ලයින් ආපු ඒවත් දැන් නැවතිලා. ඊට අමතරව, අවශ්‍ය පාඩම් හුවමාරු කරගෙන ඉගෙන ගෙන තියෙනවා. මගේ බාල ම දරුවා ඉන්නෙ 6 ශ්‍රේණියේ. ඔහුට අවශ්‍යතාවයක් තිබුණත් එවැනි ෆෝන් දෙකක් අරගෙන දෙන්න අපිට හැකියාවක් නැහැ. ඔන්ලයින් පංතිවලට ඉන්න එයාලට එකම ෆෝන් එක මාරු කරගෙන පාවිච්චි කරන්න වෙනවා, ඒත් සමහර වෙලාවට එයාලගේ කාලසටහන්වල ගැටුම් ඇති වෙනවා. ඒ වෙලාවට ඉතින් එක්කෙනෙකුට පංතියට ඉන්න බැරි වෙනවා.

#### මානසික සෞඛ්‍ය තත්වය

අඩු වැඩි වශයෙන් හැමෝට ම මේ සම්බන්ධයෙන් ප්‍රශ්න තියෙනවා. නමුත් දැන් ඔවුන් ඒවා කළමනාකරණය කරගනිමින් හැම කෙනෙක් ම හැකි තරම් වෙහෙස මහන්සි වෙලා වැඩ කරනවා. ළමයින් ගෙන් බොහෝ දෙනෙකුට මානසික ආතතිය සහ කෝපය වගේ ප්‍රශ්න තියෙනවා, සමහර විට මගේ දරුවනුත් එවාට මුහුණ දෙනවා. ඒ වගේම, විශේෂයෙන් ම තරුණ පරපුර අතර මත්ද්‍රව්‍ය භාවිතයේ වැඩි වීමක් තියෙනවා. ඒත් නිවැරදි ම තත්වය ගැන නම් එතරම් අවබෝධයක් නැහැ.

#### ගෘහස්ත හිංසනය

මට නම් පේන්නේ මේක එතරම් ලොකු ප්‍රශ්නයක් නෙමෙයි කියලා. හැමෝම සාමූහිකව දේවල් කරන්න උත්සාහ කරමින් වෙනදාට වඩා ගෙදර ඉන්වා.

#### ධනාත්මක ප්‍රවනතා

ගෙවතු වගාවේ විශාල වැඩි වීමක් තියෙනවා. හැම කෙනෙක්ම මිරිස් හරි, එහෙම නැත්නම් මොනව හරි එළවළු, පළා වර්ග වගේ දේවල් හරි වවන්න පුරුදු වෙලා ඉන්නවා. එයාලා ගෙදර ඉන්න එකයි, ඒකට ඉඩකඩ තියෙන එකයි තමා ඒකට හේතුව. ඒක එයාලට ආර්ථික ගැටළු සහ ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ ගැටලුත් යම් දුරකට අඩු කර ගන්න උපකාරී වෙනවා.

#### හුමුදාකරණය සහ නිරෝධායන නීතිය

ඒක ලොකු ප්‍රශ්නයක් වුණේ නැහැ. ගොඩක් දැනුවත් කිරීම් කළා. ආරම්භයේ දී ආරක්ෂක අංශ ඇවිත් මුඛ ආවරණයි, සැනිටයිසරුයි බෙදලා දුන්නා. හැමෝම තත්වය තේරුම් ගෙන නිරෝධායන නීතිය අනුගමනය කරනවා.

#### වැරදි තොරතුරු ප්‍රචාරය වීම

මුලදී රෝගය ඇති වූ වෙලාවෙ සමාජ මාධ්‍ය පදනම්ව යම් යම් ගැටළු ඇති වුණා. අදත් මේ වගේ දේවල් වෙනවා. ඒත් ඒවා ගැන දන්නා අයගෙන් අපට කොවිඩ් ගැන වඩාත් පැහැදිලිව දැනගන්න පුළුවන් වුණා.

#### පාරිසරික ගැටළු



*මොණරාගල ප්‍රදේශයේ වත්තක පිහිටි නිවාසය*

පරිසර හානිය කියලා දෙයක් මම දැක්කේ නැහැ. සිරම්බිඅඩි ප්‍රදේශයේ වැඩිපුර තියෙන්නෙ පොල් වතු නිසා මේ පැත්තෙ වන විනාශය වගේ දේවල් වෙන්න විදිහක් නැහැ. ඒත් සමහර ප්‍රදේශවල වන අලි ගැටළුව තියෙනවා. ඒ හේතුව නිසා වියළි කාල වලදී වගා හානි බොහෝ සෙයින් ඉහළ ගිහිල්ලා තියෙනවා.

#### අමතර අදහස්

සෑම කෙනෙකුටම ආර්ථික හා අධ්‍යාපනික ගැටලු රාශියක් තියෙනවා. අපිට අපේ සංගීත කටයුතු කරගන්න විදියක් නැති නිසා අමතර ආදායමත් නැති වුණා. අපේ ප්‍රජාව සම්බන්ධ විශේෂ දෙයක් තිබුණේ නැහැ. සමහර දේශපාලන පක්ෂ අපේ විස්තර හොයාගෙන ආපු අවස්ථා තිබුණා. ඒත් මම හිතන්නේ අපි හැමෝම එකතුවෙලා මේ දුෂ්කර කාලයට මුහුණ දිය යුතුයි. වසංගතය සහ අනෙකුත් ගැටළු ජය ගන්න තියෙන එකම මාර්ගය ඒකයි.

#### පහළොස්වන සම්මුඛ සාකච්ඡාව

**රත්නපුර, පැල්මඩුල්ල ප්‍රදේශයේ පදිංචි 30 හැවිරිදි පිරිමි පුද්ගලයෙකු සමග මෙම සම්මුඛ සාකච්ඡාව සිදු කරන ලදී. ඔහු කොළඹ පිහිටි පෞද්ගලික රෝහලක පරිපාලන සහ මානව සම්පත් කළමනාකරණ අංශයේ රැකියාවක් කරයි.**

**වසංගතය පිළිබඳ ඔබගේ අත්දැකීම කුමක්ද සහ එය ඔබගේ ජීවන රටාවන් වෙනස් කර ඇත්තේ කෙසේද?**

මම පෞද්ගලික රෝහලක පරිපාලන අංශයේ සේවය කරන්නෙ. වසංගත තත්වය තුළ මේ අංශයෙන් ලබා

දෙන තීරණාත්මක දායකත්වය අනුව, මගේ අත්දැකීම සම්පූර්ණයෙන් ම වෙනස්.

සාමාන්‍යයෙන්, වසංගතයටත් පෙර සිට ම මම ගත කළේ ඉතාමත් කාර්යබහුල වෘත්තීය ජීවිතයක්. වසංගතයත් සමග අපේ සාමාන්‍ය ජීවන රටා බොහොමයක් වෙනස් වුණා. තත්වය පාලනය කරගන්න අගුළු දැමීම්, ඇඳිරි නීතිය සහ වෙනත් ක්‍රම භාවිතා කළා. මේත් එක්කම විධායක මට්ටමේ සේවය කරන බොහෝ දෙනෙකුට දුරස්ථ ක්‍රම අනුගමනය කරමින් සේවය කරන්න සිදු වුණා. ඔවුන්ට නිවසේ බොහෝ කාලයක් ගත කිරීමට අවස්ථාව ලැබුණා, වසංගතයේ මුල් අදියරේ දී ඔවුන් සියලු දෙනාම තමන්ගේ පවුලේ සාමාජිකයන් සමග කාලය ගත කරන්න ලැබුණු අවකාශය භුක්ති වින්දා. ඒත් සෞඛ්‍ය අංශයට සම්බන්ධ සේවකයෙක් ලෙස මට නම් මේ තත්ත්වය හාත්පසින් ම වෙනස්. වසංගතයට පෙර, මම සාමාන්‍යයෙන් සති අන්තයේ සහ නිවාඩු දිනවල ගෙදර ගියා. ඒත් වසංගතයත් ඒක්ක මේ අංශයේ දේවල් වඩාත් සංකීර්ණ හා කාර්යබහුල වුණා. තත්වය පාලනය කිරීමේ ඉහළ වගකීම සෞඛ්‍ය අංශ සේවකයින්ට පැවරුණා. වසංගතය පැතිරීමත් එක්ක ඒක දිනෙන් දින වඩාත් පුළුල් වුණා. බොහෝ වෙලාවට මට මගේ පවුලේ කොටසක් විදියට රෝහලේ නැවතී ඉන්න සිද්ධ වුණා. බොහෝ විට අපිට වැඩ කරන්න වෙන්නේ මිනිස්සුත් එක්ක නිසා අවදානමත් ටිකක් ඉහළයි. මගේ බිරිඳ නීතීඥවරියක්, මෙම තත්වය තුළ අධිකරණ ක්‍රියා පටිපාටි කරගෙන යාමට නොහැකි වුණු නිසා එයාට විශාල ආදායමක් අහිමි වුණා. බොහෝ විට එයාට නිවසේ සිටීමට සිදු වුනා, ඒත් මට මගේ ආදායම ලැබුණු නිසා ඒ සම්බන්ධයෙන් අපිට එතරම් දුෂ්කරතාවයක් ඇති වුණේ නැහැ. ඒත් කාර්යබහුලත්වය වැඩිවීමත් එක්ක මට මගේ පවුලත් එක්ක තියෙන දුරස්ථභාවය තවත් වැඩි වුණා. සාමාන්‍යයෙන් මට දවස් 3 ක් හෝ 4 ක් නිවාඩු ලැබුණා, ඒත් ඒක සීමා සහිතව ලැබුණේ. බොහෝ විට මට මගේ බිරිඳ සහ පවුලේ අය සමග සම්බන්ධතාවය පවත්වාගෙන යන්න සිදු වුණේ දුරස්ථ විදියට දුරකථනයෙන්. අනෙක් බොහෝ සමාජ අන්තර්ක්‍රියා සයිබර් අවකාශයට සීමා වුණා. රෝහලේ මගේ වැඩ කටයුතු වලට අදාළව ඇතිවුණු අලුත් ගැටලුවලට මුහුණ දෙන්න මට නිරන්තරයෙන් ම ප්‍රබල විසඳුම් සොයන්න සිදු වුණා.

**නීතිය හා සාමය**

මේ සම්බන්ධයෙන් මට නම් තිබුණේ වෙනස් නිරීක්ෂණයක්. 2020 මාර්තු මාසයේ දී සිට, ලොක්ඩවුන් එක තිබියදී ත් මට රැකියාව සඳහා රෝහලට යන්න සිදු වුණා. 2020 මාර්තු මාසෙදි මුලින් ම ලොක්ඩවුන් කළ වෙලාවෙ මිනිසුන්ට මේ ක්‍රියාමාර්ග ඉතාමත් නුපුරුදුයි. තත්වය පාලනය කරන්න පොලිසිය සහ ආරක්ෂක අංශ ඉතාමත් දැඩි ලෙස ක්‍රියා කළා, අවට සිදුවන දේවල් පිළිබඳව ජනතාව තුළත් දැඩි බියක් ඇතිවෙලා තිබුණා, විශේෂයෙන්ම ලංකාවේ සහ ලොව පුරා පැවති තත්වය පිළිබඳව ඔවුන්ට ලැබුණු තොරතුරු නිසා. හැමදේම වහලා තිබුණේ. අත්‍යාවශ්‍ය තත්වය ලබා දුන්නේ හමුදාවලට, සෞඛ්‍ය අංශයට සහ ෆාමසි වලට විතරයි. ගෙදර යද්දි රත්නපුරේදීත්, වැඩට යද්දි කොළඹදීත් මම මේක දැකලා තියෙනවා. පාරේ එතරම් වාහන තිබුණේ නැහැ, තිබුණේ ත්‍රිවිධ හමුදාවට, පොලිසියට සහ සෞඛ්‍ය අංශයට අදාළ වාහන විතරයි. ඒ වගේම, පොලිසිය නිරන්තරයෙන් ම මුර සංචාරවල යෙදෙමින් ජනතාවගේ ක්‍රියා නිරීක්ෂණය කළා, ඒත් දෙවන ලොක්ඩවුන් එකට ආවට පස්සෙ තත්වය වෙනස් වුණා. ආහාර සැපයුම සම්බන්ධයෙන් කථා කරනවා නම්, රෝහල තුළදි පවා අපි ආහාර ද්‍රව්‍ය ගබඩා කරගෙන නොතිබුණු නිසා පළමු ලොක්ඩවුන් කිරීමේදී අපි බොහෝ බාධාවන්ට මුහුණ දුන්නා. ප්‍රධාන වශයෙන් ම සැපයුම්කරුවන්ට ඔවුන්ගේ සැපයුම් දාම ඉදිරියට පවත්වාගෙන යාමට නොහැකි වුණා. දෙවන අගුලු දැමීමත් එක්ක අත්‍යාවශ්‍ය සේවා කියන ඒවා නැවත අර්ථකථනය කරලා ඒවා තවත් පුළුල් කළා. සෑම දෙයක් ම අත්‍යාවශ්‍ය වෙලා තියෙන්නෙ. හැම සමාගමක් ම එක එක වර්ගවල අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය සපයන බව කියා සිටිනවා. මංගල උත්සව ශාලා, රූපලාවන්‍යාගාර ආදිය හැර අනෙකුත් බොහෝ දේවල් අත්‍යාවශ්‍ය දේ බවට පත් වුණා. ඒ වගේම වාහන අලෙවිය හා සන්නිවේදනය සම්බන්ධ දේවල් පවා අත්‍යාවශ්‍ය දේවල් වෙලා. ඒ විතරක් නෙමෙයි, වර්තමාන තත්ත්වය ගත්තහම කරුණු කිහිපයක් හැරෙන්න අනෙක් බොහෝ දේ අත්‍යාවශ්‍ය දේවල් බවට පත්වෙලා. මේ දවස්වල ජනතාව සහ වාහන විශාල සංඛ්‍යාවක් පාරේ ගමන් කරනවා දකින්න පුළුවන්. ඊයේ මම වැඩ ඇරිලා මගේ නවාතැනට යන්න නාරාහේන්පිට ඉඳන් බොරැල්ලට පයින් ගමන් කරමින් හිටියෙ. මා පසුකර ගිය වාහනවලින් 60% ක විතර ම අත්‍යාවශ්‍ය සේවා කියලා ලේබල් කරපු ස්ටිකර් අලවල තියෙනවා මම දැක්කා. ඒ අයව නවත්තලා ප්‍රශ්න කළත් එයාලගේ ගමන සාධාරණීකරණය කරන්න මොනවහරි සාධාරණ හේතුවක් කියන බව පොලිසියත් අනෙකුත් ආරක්ෂක නිලධාරීනුත් දන්නවා. පොලිසියටත් ඒක එපා වෙලා තියෙන්නෙ, ඒ නිසා කිසිම දෙයක් පරීක්ෂා කරන්නේ නැහැ. දෙවන අගුලු දැමීමේදී ඔවුන් සෞඛ්‍ය අංශයට අදාළ වාහනත් පරීක්ෂා කළා. ඒත් දැන් කවුරුත් බලන්නේ නැහැ. එස්.අයි. කෙනෙක් හරි, ඕ.අයි.සී. හරි වෙන ඉහළ නිලධාරියෙක් හරි බලාගෙන ඉන්නවා නම් පමණයි ඔවුන් පරීක්ෂා කිරීම් සිදුකරන්නේ. එහෙම නැත්නම්, මේ දැන් තියෙන අගුලු දැමීම යටතේ කිසිම දෙයක් සීමා කරලා නැහැ මොකද පොලිසියටත් දැන් එපා වෙලා තියෙන්නෙ.

ඒ වගේම, තමන්ගේ ජීවනෝපායට සහ ආදායමට ඇති වෙලා තිබෙන බලපෑම නිසා දැන් තවත් සමහර පුද්ගලයින් අගුලු දැමීම් අතරතුරදී පිටතට යනවා. තමන්ව අත්අඩංගුවට ගනියි කියන එක ඔවුන් තැකීමක් කරන්නෙ නැහැ; කොහොම වුනත්, ඔවුන් මොනවා හරි කරලා යමක් උපයා ගන්නයි උත්සාහ කරන්නෙ.



*ඩෙල්ෆ්ට් දූපත, යාපනය*

**ජීවනෝපාය**

ඉල්ලුම වැඩි නිසා මගේ ගමේ කඩවලට ඇති තරම් ආදායම තියෙනවා. කාට හරි කඩෙන් බඩු ගන්න අවශ්‍ය නම් ෆෝන් එකෙන් කඩේට දුනුම් දීලා, ඊට පස්සෙ එයාලා ගිහින් ඒ බඩු අරගෙන එනවා. එහෙම නැත්නම්, ත්‍රීවීල් වලින් හරි මෝටර්සයිකල් වලින් හරි ඒවා ගෙනත් දෙන්නත් කඩහිමියො විවිධ වැඩපිළිවෙළ යොදලා තියෙනවා. නමුත් අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍යවල හිගයක් තියෙනවා. එවගේම, බොහෝ දෙනෙක් ගෙවතු වගාවට හුරුවෙලා ඉන්නවා. වෙළඳපොළට තියෙන සැපයුමත් වැඩිවෙලා තියෙන්නෙ. ඒ වගේම, කඩ සහ කුඩා වෙළඳසැල් සංඛ්‍යාවත් වැඩිවෙලා තියෙනවා. රජයේ සේවකයින් සතියට දින දෙකක් වත් සේවයට වාර්තා කළ යුතුයි. ඔවුන්ට පඩිය ලැබෙනවා. සමහර පෞද්ගලික අංශයේ ආයතනවලත් එහෙමයි. ඒත් ජංගම ආහාර වෙළෙන්දන් වැනි දෛනික කම්කරුවන්ට තමන්ගෙ ජීවනෝපාය පවත්වා ගෙන යාමට විවිධ දුෂ්කරතාවලට මුහුණ දෙන්න සිද්ධවෙලා තියෙනවා. දැන් වසර එකහමාරකට වැඩි කාලයක් ගත වෙලා තියෙන්නෙ. මේ දුෂ්කරතා යටතේ එයාලත් යම් ආකාරයකට වැඩ කරන්න හුරු වෙලා ඉන්නවා කියලා මම හිතනවා. ඒ වගේම මේසන් වැඩ කරන අය, වඩු කාර්මිකයින් වැනි අනෙක් කම්කරුවන්ටත් දැන් ටිකක් වැඩ තියෙනවා - ඉස්සර කළාට වඩා වැඩ තියෙනවා. දවස් කුලියට වැඩකරන කම්කරුවන්ගෙයි කුඩා ව්‍යාපාර හිමියන්ගෙයි ජීවන මට්ටම පහළ වැටිලා තියෙන්නෙ. කොහොම වුණත්, ඔවුන් විවිධ ආකාරවලින් මේ තත්වයට හැඩගැහිලා ඉන්නේ.

**සෞඛ්‍ය අංශයෙන් ලැබුණු සහාය**

කොවිඩ්-19 ආසාදනය වෙලා ඉන්න අවුරුදු 65 ට වැඩි පුද්ගලයින්ව පෞද්ගලික රෝහල්වලට භාර ගන්නේ නැහැ. ඒ එම රෝගීන් අසාධ්‍ය තත්ත්වයට පත්වීමේ වැඩි සම්භාවිතාවයක් තිබෙන නිසා. එවැනි අවදානමක් ගත යුතු නැතැයි කියල තමයි පෞද්ගලික රෝහල් හිතන්නේ. ඒ නිසා ඔවුන් අවුරුදු 65 ට අඩු කොවිඩ් රෝගීන් ඇතුළත් කර ගන්නවා. සමහර අය මට කතා කරලා ඔවුන්ගේ පවුලේ ඉන්න අවුරුදු 65 ට වැඩි ආදරණීයයන් රෝහලට ඇතුළත් කිරීමේ තත්ත්වය පරීක්ෂා කළා. ඔවුන් ගෙන් වැඩි දෙනෙක් මගේ යාළුවො. ඔවුන් කිව්වා රජයේ රෝහල්වල ඉඩ නැහැ කියලා. ඔවුන් ගෙන් සමහර අයට අපේ රෝහලට ඇතුළත් වෙන්න මම උදව් කළා. ඒ එක්කෙනෙකුට වයස අවුරුදු 72 ක්, තවත් එක්කෙනෙකුට 76 ක්. එකපාරක් මම අවුරුදු 86 ක පුද්ගලයෙක් ඇතුළත් කරන්න උත්සාහ කළා, ඒත් ඒක සාර්ථක වුණේ නැහැ. මේ වසංගතය පැතිරීමත් සමග සෞඛ්‍ය අංශයේ අන්ත දෙකම වැඩිහිටි ජනගහනයට ප්‍රමුඛත්වය දීලා නැහැ කියලා බව මට හිතුණා. ඒ වගේම, දැන් මිනිස්සු හිතන්නේ ඔවුන් එන්නත් කරගෙන ඇත්නම් අවදානම අවසන් වෙලා, ඔවුන් වසංගතය ගැන තවදුරටත් සැලකිලිමත් විය යුතු නැහැ කියලයි. දැන් බොහෝ ආසාදිත පුද්ගලයින්ට තමන්ගෙ නිවසේ සිට ම නිරෝධායන ක්‍රියාවලිය අනුගමනය කරන්න සිදුවෙලා තියෙන්නෙ. ඒත් මේ වසංගතයේ මුල් අවධියේ දී කාට හරි ආසාදනය වුණා නම් එයාගේ ආශ්‍රිතයින් සොයා ගැනීම ඉතා තදින් ම සිදු කළා. සමීප ආශ්‍රිතයින් කියලා අඳුනාගත්ත අයටත් නිරෝධායන ක්‍රියාවලියට යන්න සිද්ධ වුණා. ඒ විතරක් නෙමෙයි, මිනිස්සුත් මේක ඉතා බරපතල දෙයක් ලෙස සැලකුවා. ඒත් දැන් ඒක එහෙම නෙමෙයි. ආසාදිතයින් විදියට අඳුනාගත්ත සමහර අයත් සමාජයේ සැරිසරනවා. ඒත් සමස්තයක් ලෙස සෞඛ්‍ය නිලධාරීන් තමන්ට වෛරසය ආසාදනය වෙයි කියන අවදානම ගැන වත් හිතන්නෙ නැතිව මේ තත්වය පාලනය කරන්න විශාල උත්සාහයක් ගත්තා. පෞද්ගලික අංශයේ දී රෝගීන්ට මුදල් ගෙවලා සේවා ලබා ගන්න සිද්ධ වෙනවා. මේ විදියට සෞඛ්‍ය අංශයේ අන්ත දෙකම මේ තත්වයට මුහුණ දෙන්න විශාල කැපකිරීමක් කළා.

**එන්නත්කරණය**

මේ වසංගතයේ අවදානමෙන් මිදෙන්න තියෙන එකම මාර්ගය ලෙස රජය එන්නත්කරණ ක්‍රියාවලියට ප්‍රමුඛත්වය දීලා තියෙනවා. ඒත් දැන් අගුලු දැමීම තත්වය පාලනය කරන්න තියෙන ඵලදායී ක්‍රමයක් නෙමෙයි. මීට පෙර එන්නත් කිරීමේ ක්‍රියාවලියට බොහෝ දුෂ්කරතා ඇති වුණා. නමුත් දැන් ඒක වඩාත් හොඳ ආකාරයෙන් ක්‍රියාත්මක වෙමින් පවතිනවා.



*සිසුන් පාපැදි වලින් පාසලට යමින්, යාපනය දිස්ත්‍රික්කය, ශ්‍රී ලංකාව*

**අධ්‍යාපනය සහ මානසික සෞඛ්‍යය**

වසංගතයත් එක්ක ජනතාවගේ එදිනෙදා ජීවන රටාව විශාල ලෙස වෙනස් වුණා. පාසල් යන වයසේ ළමයි ගැන සලකා බැලුවොත්, ඔවුන්ට පාසල් යන්න විදියක් නැහැ. බොහෝ විට ඔවුන් නිවසේ සිට ඔන්ලයින් අධ්‍යාපනයට සම්බන්ධ වෙලා ඉන්නවා. එක පැත්තකින් ඔවුන්ට අම්මල තාත්තලගෙ, පවුලේ අයගෙ ආදරය වැඩියෙන් ලැබෙනවා. නමුත් අනෙක් අතට, පාසල් යන

වයසේ ළමයින්ට සම වයසේ මිතුරන්ගෙ ඇසුරු ලැබිය යුතුයි. ඒ පැත්ත සම්පූර්ණයෙන් ම නැතිවෙලා තියෙන්නෙ. ඔවුන්ට ක්‍රීඩා, සෞන්දර්යය සහ තවත් බොහෝ සාමූහික ක්‍රියාකාරකම් ආදියත් කරන්න බැරිවෙලා තියෙනවා. ඔන්ලයින් ඉගැන්වීමේ ක්‍රමය බොහෝ සෙයින් වෙනස් ක්‍රමයක්. ඒකෙන් සිසුන්ට තියෙන පීඩනය තවත් වැඩි කරලා තියෙන්නෙ. ඉස්සර විෂය නිර්දේශය සහ විෂයමාලා තමයි මානසික ආතතිය වැඩි වෙන්න හේතු වුණේ. ඒත් දැන් ඉගැන්වීමේ ක්‍රමයත් අමතර පීඩනයත් සහ ආතතීන් එකතු කරලා තියෙනවා. එයට අමතරව, අඩු ආදායම්ලාභී පවුල් වලින් බහුතරයකට උපකරණ සහ ජාල සම්බන්ධතා සපයා ගන්නත්, ඒ සඳහා වියදම් දරන්නත් බැරිවෙලා තියෙනවා. දත්ත ගාස්තු තරමක් ඉහළ යි. අධ්‍යාපනයේ තියෙන මේ වෙනස් වෙමින් පවතින තත්වයන් සමාජ ස්ථරීකරණය අලුතින් නිර්මාණය කරමින් තියෙනවා.

එවගේම, මේ අනන්‍ය අධ්‍යාපන ක්‍රමය තුළ දී සිසුන් පන්තිකාමරය පදනම් කරගත් අධ්‍යාපනය ක්‍රමය ට වඩා පසුගාමී වෙමින් ඉන්නෙ. පන්ති කාමරයේ උගන්වන විට ගුරුවරුන්ට සිසුන් සමග අන්තර්ක්‍රියා කරමින් සිසුන්ව සම්බන්ධ කර ගැනීමට විවිධ ක්‍රම තියෙනවා. අන්තර්ජාල වේදිකා වලින් ඒක සීමා කරලා තියෙන්නෙ. අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඇති වෙලා තියෙන මේ වෙනසත් එක්ක සිසුන්ට නිදහසේ දේවල් කරමින් ඉගෙනීම ලබන්න තියෙන අවකාශය හැකිළිලා තියෙන්නෙ. අධ්‍යාපන ජීවිතයේ විවිධ පරිච්ඡේද ගණනාවක් තියෙනවා. සෑම පරිච්ඡේදයක් ම සිසුන්ට දේවල් ඉගෙන ගන්නත්, තේරුම් ගන්නත් උපකාර කරනවා. ඒත් දැන් ඔවුන්ට තියෙන්නෙ ඔන්ලයින් පාඩම් පරිච්ඡේදය විතරයි.

## දහසයවන සම්මුඛ සාකච්ඡාව

**උතුරු පළාතේ කාන්තා සංවර්ධන නිලධාරිනියක ලෙස සේවය කරන, යාපනයේ දෙමළ ප්‍රජාවට අයත් 37 හැවිරිදි කාන්තාවක් සමග මෙම සම්මුඛ සාකච්ඡාව සිදු කරන ලදී.**

**වසංගතය පිළිබඳ ඔබගේ අත්දැකීම කුමක්ද සහ එය ඔබගේ ජීවන රටාවන් වෙනස් කර ඇත්තේ කෙසේද?**

වසංගතය පවුල් සහ පුද්ගලික මට්ටමෙන් මෙන්ම වෘත්තීය මට්ටමෙන් ද අපගේ පෙර පැවති ජීවන රටා බොහොමයක් වෙනස් කර තියෙනවා. මගේ නැන්දා පහුගිය අවුරුදු එකහමාරක කාලය පුරා මාත් එක්කයි හිටියේ. එයාගේ වයස අවුරුදු 70 ක් විතර වෙනවා, ඒත් පසුගිය මාසයේ දී එයා කොවිඩ් හැදිලා මැරුණා. එයාට ආසාදනය වුනාට පස්සෙ අපිට එයාව රෝහලකට ඇතුළත් කරන්න සිදු වුණා. අපි යාපනය රෝහල ගැන හොයල බැලුවාම ඒක රෝගීන් ගෙන් පිරී ඇති නිසා ඒකට ඇතුළත් කර ගන්න බැරි වුණා. ඉන්පසුව අපට ඇයව පෞද්ගලික රෝහලකට රැගෙන යන්න සිදු වුණා. ඊට දින දෙකකට පස්සෙ එයා මිය ගියා. සාමාන්‍යයෙන් දෙමළ හින්දු සංස්කෘතිය අනුව අපි අවමංගල්‍ය කටයුතු වලදී අනුගමනය කරන සාම්ප්‍රදායික චාරිත්‍ර තිබෙනවා. ඒත් එයා ඇය කොවිඩ් හැදිල මිය ගිය නිසා අපිට ඇය වෙනුවෙන් ඒ කිසිවක් කරන්න පුළුවන් වුණේ නැහැ. අපේ නෑදෑයො බොහෝ දෙනෙකුට අවමංගල්‍යයට එන්න බැරි වුණා. මගේ නැන්දා මිය යාම අපට මානසිකව දැඩි ලෙස බලපෑවා.

ඒ හැරෙන්නට, යාපනයේ දුප්පත් මිනිස්සු බොහෝ දෙනෙක් දුක් විඳිනවා. දවස් කුලියට වැඩ කරන බොහෝ දෙනා විවිධ දුෂ්කරතාවලට මුහුණ දීලා ඉන්නෙ. සමහර අය රුපියල් 100 ක් ණයට ගන්න දුක් විඳිනවා. සමහර පවුල් තමන් මුහුණ දෙන දුප්පත්කම නිසා යන්තම් දවසට එක වේලක් කාලා තමයි ඉන්නෙ. රජය යම් යම් සහන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කළත් රටේ පවතින ජීවන වියදමට අනුව ඒක ප්‍රමාණවත් නැහැ.

### ජීවනෝපාය



*මඩකලපුව, උන්නිචෙයි ප්‍රදේශයේ ධීවර බෝට්ටුවක්*

විධිමත් අංශයේ රැකියා කරන අයට මාසික ආදායමක් ලැබෙන බැවින් ඔවුන්ට අත්‍යාවශ්‍ය අවශ්‍යතා ඉටුකර ගත හැකියි. ධීවර කර්මාන්තය හා කෘෂිකර්මාන්තය වැනි අවිධිමත් අංශවල රැකියා කරන අය මේ ලොක්ඩවුන් එක සහ අවකාශය නොමැතිකම නිසා තම අස්වැන්න විකුණා ගැනීමට නොහැකිව අපහසුතාවලට මුහුණ දීලා ඉන්නවා. ඔවුන් ආයෝජනය කරන මුදලත් සමග ඔවුන්ට එය විශාල පාඩුවක්.

යුද්ධය අවසන් වීමෙන් පසු කාලය තුළ, යාපනයේ ඇතැම් ප්‍රදේශවල සංචාරක ව්‍යාපාරය වර්ධනය වෙමින් පැවතියත් දැන් ඒක බිංදුවට ම බැහැලා තියෙන්නෙ. සංචාරකයින් ප්‍රධාන වශයෙන් ම වර්ග තුනක් ඉන්නවා - රටේ දකුණෙන් පැමිණෙන දේශීය සංචාරකයින්, ඩයස්පෝරා සංචාරකයින් සහ විදේශිකයින්. ඒ පදනම දැන් සීමා වෙලා තියෙන්නෙ. මේ අවුරුද්දෙ ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ දේශීය සංචාරක ව්‍යාපාරයේ වර්ධනයක් ඇති වුන නමුත් අප්‍රේල් මස අවසානයේ සිදුවූ තුන්වන ඉහළ යාමෙන් පස්සෙ ඒක සම්පූර්ණයෙන්ම නතර වුණා. මේ කුඩා පරිමාණයේ ව්‍යාපාර බොහොමයකට සංචාරක ව්‍යාපාරය හරහා විශාල ආදායමක් ලැබුණත් දැන් ඒ ආදායම අහිමි වෙලා.

### නීතිය හා සාමය

හමුදාවේ අය පමණට වඩා මැදිහත්වීම යාපනයේ ජනතාව අතර නොසතුටට හේතු වෙලා තියෙනවා.

ඔවුන් සෞඛ්‍යය සම්බන්ධ කටයුතු වලටත්, අනෙකුත් පරිපාලන කටයුතු වලටත් ඉදිරිපත් වෙලා ඉන්නවා. එන්නත්කරණ ක්‍රියාවලියට හමුදාවෙ අය සම්බන්ධවෙලා ඉන්න නිසා සමහර අය එන්නත ලබා ගන්න කැමති නොවූ බව එක් වෛද්‍යවරයෙක් පැවසුවා.

ගිය අවුරුද්දෙ පළවෙනි ලොක්ඩවුන් එකේදි හැර, මිනිස්සු හැමවිට ම සංචරණ සීමා සහ ලොක්ඩවුන් කිරීම් දැඩි ලෙස අනුගමනය කළේ නැහැ. බොහෝ වෙලාවට ඔවුන් තමන්ගෙ රැකියා වලට එළියට ගියා, සමාජ දුරස්ථභාවයක් පවත්වාගත්තෙත නැහැ. සමහර අය මුඛ ආවරණ පළඳින එක ගැන වත්, සනීපාරක්ෂාව ගැන වත් තැකීමක් කළේ නැහැ. මම දැන් නිරෝධායනය වෙලා ඉන්නෙ, ඒත් මට ඕනැ නම් දූන් මට ටවුන් එකට හරි එළියට හරි ගිහිල්ල එන්න පුළුවන්. ඒ ගැන පසු විපරම් කරලා බලන්න කවුරුත් නැහැ. මට මේ තත්වයේ තියෙන අවදානම සහ මගේ වගකීම තේරෙන නිසා මම කොහේවත් යන්නෙ නැහැ. ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය සහ කාන්තාවන්ට එරෙහි හිංසනය වැඩි වෙලා තියෙන්නෙ. අන්තර්ජාලය හරහා සිදු කරන කරදර කිරීම් සහ හිරිහැර කිරීම් ප්‍රමාණයත් වැඩි වෙලා තියෙන්නෙ.

### අධ්‍යාපනය

අඩු ආදායම් ලබන පවුල් ඔන්ලයින් අධ්‍යාපනය සඳහා අවශ්‍ය මූලික පහසුකම් සපයා ගන්න දුක් විඳිනවා. අරියාලේ ඩී.සී. ඔෆිස් එක අවට ප්‍රදේශයේ ජනතාවට උපකරණ, ඩේටා වියදම, සහ ටියුෂන් පන්ති ගාස්තු ආදිය සඳහා රාජ්‍ය නොවන සංවිධාන අංශයෙන් ද විශාල සහයෝගයක් ලැබුණා. ඒ සිසුන්ට කිසිම දුෂ්කරතාවයකින් තොරව ඔන්ලයින් අධ්‍යාපනය කරගෙන යන්න පුළුවන් වුණා. මෑතක දී ජනතාව නැවත පදිංචි කළ තවත් ප්‍රදේශයක ගුරුවරුන්ට සටහන් මුද්‍රණය කරන්න එක් සංවිධානයක් සහාය දුන්නා, ඒ සටහන් සිසුන් අතරෙ බෙදා දුන්නා. ගුරුවරුන්ට පහසුකම් තිබෙන බවත්, ඔවුන් ඔන්ලයින් පන්ති පවත්වන්න කැමැත්තෙන් සිටියත් සිසුන්ට සහ පවුල්වලට ස්මාර්ට් ෆෝන් වැනි පහසුකම් නැති තත්වයකට මුහුණ දී සිටින බවත් කරෙයිනගර් ප්‍රදේශයේ එක් පාසලක විදුහල්පතිවරයෙක් පැවසුවා. 4 සහ 5 ශ්‍රේණිවල ළමයින්ට ශිෂ්‍යත්ව විභාගයට මුහුණ දීමට තිබෙන නිසා නිල නොවන ආකාරයට පාසැලේ පන්ති පැවැත්වූවා.

### රජයෙන් ලැබුණු සහාය

නිරෝධායනයට ලක්වෙලා හිටපු සමහර පවුල් තමන්ට අත්‍යාවශ්‍ය ආධාර නොලැබුණු බවට පැමිණිලි කළා. සමහර සලාක මලුවල තිබුණ භාණ්ඩවල ගුණාත්මකභාවය අඩු බවත්, එම ප්‍රමාණය සතියකටවත් ප්‍රමාණවත් නොවුණ බවත් ඔවුන් ප්‍රකාශ කළා.

රුපියල් 5,000 ක දීමනාවක් ලබා දීමේ වැඩපිළිවෙළ වඩාත් ම අවශ්‍ය සහන වැඩසටහන් වලින් එකක්. ඒත් මේ ආර්ථික තත්වය තුළ අත්‍යාවශ්‍ය වියදම් කළමනාකරණය කර ගන්න මෙම මුදල ප්‍රමාණවත්ද කියන එක තවමත් ගැටළු සහගතයි.

බොහෝ ප්‍රදේශවල ඔවුන් එය මුදලින් ලබා දුන්නෙ. බොහෝ වෙලාවට රුපියල් 5,000 මුදල් නෝට්ටුවක් දෙන්නෙ. අගුලු දමා ඇති කාලය තුළ බොහෝ ග්‍රාමීය ජනතාවට ඔවුන්ගේ අත්‍යවශ්‍ය මිලදී ගැනීම් සඳහා පහසුවෙන් වියදම් කරන්න හැකි වන විදියට ඒ මුදල මාරු කරගන්න යම් යම් ගැටළුවලට මුහුණ දෙන්න සිදු වුණා.

නිලධාරීන් රුපියල් 5,000 දීමනාව බෙදන්න පටන් ගත්තහම ඔවුන් ඒ සඳහා සලකා බැලුවේ යුද්දෙ කාලෙදි හමුදාව යටතේ සහනාධාර බෙදා දෙන්න යොදා ගත්ත පවුල් කාඩ්පත් ක්‍රමයයි. ඒ කාඩ්පතේ පවුලේ සාමාජිකයන් පිළිබඳ සියලු ම තොරතුරු ඇතුළත් වන වෙනවා. සමහර ග්‍රාමසේවක කොට්ඨාශවල පුද්ගලයින් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීමේ ක්‍රමයක් ලෙස ග්‍රාමසේවකවරු මෙම කාඩ්පත් භාවිතා කරනවා. මේ නිසා තවමත් ස්ථිර පදිංචි ලිපිනයක් නැති පුද්ගලයින් විවිධ දුෂ්කරතාවලට මුහුණ දී සිටියත් ඔවුන්ට රුපියල් 5,000 එම දීමනාව ලැබුණෙ නැහැ.

මෙම ක්‍රියාවලිය තුළ බොහෝ ගැටලු ඇති වුණා. විශේෂයෙන් ම, දේශපාලන බලපෑම් මත, සුදුසුකම් ඇති සහ වඩාත් ම අවශ්‍යතා ඇති පුද්ගලයින් එයින් බැහැර කර තිබුණා. බොහෝ පැමිණිලි ඉදිරිපත් වී තිබෙනවා. බොහෝ දෙනෙක් මෙම දීමනාව බෙදා දුන්නේ ප්‍රතිලාභීන්ව ග්‍රමසේවක කාර්යාලයට හෝ සමාජ දුරස්ථභාවය පවත්වා ගැනීමට හැකි වෙනත් තෝරාගත් ප්‍රජා ස්ථානයකට කැඳවා ගනිමින්.



*කොවිඩ් රෝගය ව්‍යාප්තවීම හේතුවෙන් යාපනය නගරයේ හුදකලා කර ඇති ප්‍රදේශයක වෙළඳසැලක් වසා තබා ඇති අයුරු*

### සෞඛ්‍ය අංශයෙන් ලැබුණු සහාය

ඔවුන් විශාල කාර්යයක් ඉටු කරනවා. මම කීප වතාවක් ම යාපනය ශික්ෂණ රෝහලට ගියා; ඔවුන් මිනිස්සුන්ට ගොඩක් උපකාර කළා. කළමනාකරණ ක්‍රියාවලිය පවා බෙහෙවින් අගය කළ හැකි මට්ටමක තියෙනවා. මේ තත්වය අපි හැමෝම නිදහස් සෞඛ්‍ය ක්‍රමයේ වැදගත්කම අවබෝධ කරගත් අවස්ථාවක්. අපි පෞද්ගලික රෝහලකට ගියොත් වියදම ඉතාමත් අධිකයි. හොඳ ආර්ථික පසුබිමක් නැති බොහෝ දෙනෙකුට ඒක දරාගන්න බැහැ. පුද්ගලික රෝහල් සමග සසඳා බලන විට වුනත් රජයේ රෝහල් ඉතා කාර්යක්ෂම සේවාවක් සපයනවා. ඒවායෙහි උසස්

පහසුකම් සහ හොඳ විශේෂඥයින් සිටිනවා. මේ කාලය තුළ ඔවුන් ලබාදුන් සේවය මම ඉතා අගය කරමින් ඒ ගැන මම සතුටු වෙනවා.

## එන්නත්කරණය

ඒකට එක් හේතුවක් තමයි එන්නත් හිගය; අනෙක් ප්‍රධාන ප්‍රශ්නය තමයි බොහෝ දෙනෙකුට එන්නත ලබා ගැනීම පිළිබඳ හොඳ ආකල්පයක් නොමැති වීම. අවුරුදු 18 ට වැඩි සියලු ම වයස් කාණ්ඩ වලට එන්නත ලබා දෙමින් එන්නත්කරණ ක්‍රියාවලිය තවමත් ක්‍රියාත්මක වෙනවා.

## වැරදි තොරතුරු ප්‍රචාරය කිරීම

මේ ප්‍රදේශ වල කොවිඩ් ගැන සහ අනෙකුත් යම් යම් ක්‍රියාමාර්ග පිළිබඳව දැනුවත්භාවය ලබා ගැනීම සඳහා වඩා හොඳ ප්‍රවාහයක් තියෙනවා. සමාජ මාධ්‍ය හරහා පැතිරුණු සමහර කටකතා ජනතාව අතර වැරදි අවබෝධයන් ඇති කළා. උදාහරණයක් ලෙස, එන්නත ලබා දීමෙන් පසු මරණ සිදුවීම් පිළිබඳ පුවත් ජනතාව අතර විශාල අවිශ්වාසයක් ගොඩ නැගෙන්න හේතු වුණා.

## මානසික සෞඛ්‍යය

මේ විශේෂිත තත්වය නිසා මේක දිනෙන් දින පුළුල් වෙමින් පවතින ගැටලුවක් වෙලා තියෙනවා. කිසිවෙක් මේක නිසි පරිදි හඳුනා ගෙන නැහැ. ඔවුන්ව හඳුනා ගෙන, ඔවුන්ට සහාය වීම සඳහා වඩා හොඳ යාන්ත්‍රණයක් නැහැ. යුද්දෙන් පස්සෙ එළඹුණු කාලය තුළ තිබුණු තත්වය පවා බොහෝ දුරට මෙයට සමාන වුණා. කිසිවෙක් ඒ පිළිබඳව අවධානය යොමු කරලා නැහැ.

මෙම කාල පරිච්ඡේදය තුළ සංචරණ සීමා, අගුලු දැමීම්, පවුලේ ආදරණීයයන්ගේ මරණ, ආර්ථික තත්වය, දරිද්‍රතාවය, සහ පමණට වඩා අන්තර්ජාල වේදිකා භාවිතය ආදිය හේතුවෙන් මිනිසුන් ප්‍රධාන වශයෙන් ම ආතතිය හා මානසික අවපීඩනය වැනි බොහෝ මානසික ගැටලුවලට මුහුණ දෙනවා. තවත් පැත්තකින් බැලුවොත්, මානසික වශයෙන් බලපෑමට ලක්වූ මිනිසුන් නරක මිනිසුන්ට පමණක් එය සිදුවන බවත්, එය මැඩපවත්වා ගැනීමට සහාය අවශ්‍ය වන්නේ නරක මිනිසුන්ට පමණක් බවත් සිතනවා. අපේ සම්ප්‍රදාය තුළ යම් මිථ්‍යාවක් තිබෙනවා඼ ඔවුන් එවැනි මනෝවිද්‍යාත්මක ප්‍රශ්න ගැන විවෘතව කතා කිරීමට කැමති නැහැ. කොහොම වුනත්, උතුරු පළාත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මෙවැනි අවශ්‍යතා පිළිබඳව දැනුම් දීම සඳහා ක්ෂණික දුරකථන අංකයක් හඳුන්වා දුන්නා. ඒ වගේම තවත් සමහර රාජ්‍ය නොවන සංවිධානත් අවශ්‍ය පුද්ගලයින්ට සේවා සපයා දීමට ක්ෂණික දුරකථන අංකයක් සහ උපදේශන සේවාවක් හඳුන්වා දීලා තියෙනවා.

## ගෘහස්ත හිංසනය

ඒ සම්බන්ධ ප්‍රශ්න ගොඩක් තියෙනවා, නමුත් නිවසේ දී ඒවා සිදුවුනත් ලොක්ඩවුන් එක නිසා කවුරුවත් ඒ ගැන එළිපිට කතා කරන්නේ නැහැ. ඒ වගේම සාමාන්‍යයෙන් ඒ වගේ ප්‍රශ්නයක් ඇති වූ විට ඔවුන් කෝවිල් හා ආගමික ස්ථානවලට ගොස් යාඥා කර හිතේ බර නිදහස් කර ගැනීමටත් පුරුදුව සිටියා, ඒත් මේ කාලෙ ඒකත් කරන්න විදියක් නැහැ. මිනිසුන් අතර මානසික අසමතුලිතතාවයක් ඇතිවීමට ඒකත් ප්‍රධාන හේතුවක්.

## ධනාත්මක හැඩගැසීම්

සාමාන්‍යයෙන් යාපනයේ ගෙවතු වගාව සාමාන්‍ය පුරුද්දක්. මේ කාලය තුළ එය පෙර තිබුණටත් වඩා වැඩි වෙලා තියෙනවා. එවගේ ම මිනිසුන් රැකියා හා වෘත්තීන්වල නිරතවී සිටීම නිසා ඔවුන්ට ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සමග කතා කිරීමට හා සාකච්ඡා කිරීමට ප්‍රමාණවත් කාලයක් තිබුණෙ නැහැ, ඒත් සංචරණය සීමා කිරීම නිසා දැන් ඒ සඳහා වඩා හොඳ අවකාශයක් නිර්මාණය වෙලා තියෙනවා.

එවගේ ම, පරිසරය සුරැකීම, කාන්තාවන් සවිබල ගැන්වීම වැනි සමහර ගැටළු පිළිබඳව තරුණයින් අන්තර්ජාලය ඔස්සේ සාකච්ඡා කරන්න පටන් අරගෙන තියෙනවා. එය යම් යම් ගැටළු සම්බන්ධයෙන් දැනුවත්භාවය ලබා ගැනීමටත්, ප්‍රජාව තුළින් විසඳුම් සොයා ගැනීමටත් තිබෙන හොඳ අඛණ්ඩ ක්‍රියාවලියක්.

## වෙනත් අදහස්

මේක අර්බුදයක්. නමුත් අපි සුභවාදී වෙමින් මෙයට මුහුණ දිය යුතුයි. එය ජය ගැනීමට ඇති එකම මාර්ගය එයයි.




*උතුරු පළාතේ උයිරිලෙයි ප්‍රදේශයේ පිහිටුවා ඇති සුසුම්නාව තුවාලවූවන්ගේ සංගමයේ සාමාජිකයින් වසංගතය මගින් තම සාමාජිකයින්ට ඇතිවී තිබෙන බලපෑම පිළිබඳ සාකච්ඡා කරන රැස්වීමක දී*